සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2559ක් වූ ඇසළ මස (ව්‍යවහාරික වර්ෂ 2015 ජූලි)

45 වෙනි කලාපය



## සොබා දහමේ පැවැත්මට ලෝ වැසියන්ගේ ගති ගුණ බලපාන හැටි...

රු. 20/-

සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය



# මතකද අපිත් පෙර හිටියා මේ ලෙසට...

ඊයේ හිටිය බව වැටහෙයි හෙටද තියේ
ආයේ මළොත් උපදින බැව් කෙලෙස නොයේ
වූයේ මෙයයි වැටහෙද දුගතියට ගියේ
යායේ කකා හිටියා අපි එකට බියේ

ඉඳ හිට යෙදුන පිනකින් මනු සතෙකු වුනේ
විඳ විඳ හිටපු තිරිසන් බැව් වැඩිය පෙනේ
අද ලොකුකමට කීවත් පෙර හිටපු තැනේ
එදවස කළේ තිරිසන් කටයුතුය අනේ

පස් කම් සැපට කොටු වී ගෙන කළ ආලේ
දස්කම් නොවෙයි අකුසල් එල දෙන වේලේ
උස්සන් අං වලිග දළ ලැග ගෙන ගාලේ
තොස් නම් නොවේ කළ කම් විඳවපු කාලේ

ගුටි කෑ තරම් පිට උන්ගෙන් පළු යන්න
වැටි වැටි දුවපු හැටි මරණින් ගැල වෙන්න
හිටි වන තවෙකෙකුට කය ගොදුරැව උන්න
හැටි මතක නම් නොවඩියි ඒ ගති ගොන්න

ඔසුපත් නරකයේ පෙර නිරි සතුන් වෙලා
විසුවත් පිළි නොගෙන අද මිස දුටින් මුලා
ඇසුනොත් එහඬ ලැබ ගත් නැණසකින් බලා
හසු වෙත් අපිත් මෙලෙසයි ගුණ දමින් මළා

අනත සසර නෙක අත් බැව් රැසක ඉඳ
තැනක මෙලෙස විසුවත් සුගතියක අද
නැණස යොමු කළොත් පෙර භවවලට වැද
මනස තිබුනෙ වැඩිපුර දුගතියෙහි බැඳ

එදා සිටිය මනු සත අප දෙසට හැරී
මෙදා අපි විලස මෝහෙන් විගිළු කෙරී
බදා හිටියොතින් මේ ගති ලෙසට හරී
සදා අනාතයි මතු දුක් කඳකි පිරී

ගිනා වුනත් දැන් දුගතියෙ සත දැකලා
වුනා අපිත් උපතක මේ ලෙස එකලා
මනාපයක් කළ හොත් දොස ගෙන මෙකලා
විනාසයක් මැයි බැහැ වළකනු රැකලා

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

# බුදු සසුනේ ගමන් මග...



වෙසක් සඳ අහසේ උදා වෙන කොට සම්මා සම්බුදුවරයන් වහන්සේ නමක් පිළිබඳ උතුම් ඓතිහාසික සිද්ධීන් රැසක් අපේ මනසට නැගී එනවා. ඇසළ සඳ අහසේ උදා වෙන කොට සත්‍ය ගවේසී විමුක්තිකාමී ලෝකයාට නිදහස උදා වුනු, තෙරුවන් ලෝකයට පහළ වුනු, සංඝ රත්නය ආරම්භ වුනු දිනය වශයෙන් අපේ හිතට සිහිපත් වෙනවා. බුදු දහම කියන මිණි පහන දල්විලා එයින් ලෝකය ආලෝක වූ හැටි, බුද්ධ සාසන රත්නාකරය මතු වෙලා සසුන් ගුණ රුවනින් තුන් ලොව සැනසී ගිය හැටි, බුදු හිමි මුව මඬලින් වැගිර ගලා ගිය දහම් අමා දහරින් මුළු ලොවම තෙමී දුක් ගිනි නිවී සැනසී ගිය හැටි, උතුරු මිනිස් දම් පෙළහරින් තුන් ලොවම ශාන්ත වී ගිය හැටි, බුදු රැස් දහරින් බරණැස ඉසිපතනය නැහැවී ගිය හැටි, කාසාය වස්ත්‍රයෙන් මිගදාය නම් අපරාජිත සුද්ධ භූමිය බැබලී ගිය හැටි අදටත් අපට මැවිල පේනවා.

ලෝකයාට සම් දිටු (සම්මා දිට්ඨිය) පහළ වුනු දිනය තමයි ඇසළ පුන් පොහොය කියන්නෙ. 62 ක් මිසදිටු කියන දැලෙහි පැටලිලා නානාප්‍රකාර අත්තකිලමතානු යෝග ක්‍රමවල සහ කාම සුඛල්ලිකානු යෝග ක්‍රමවල ඇලී ගැලී සිටි ලෝකයාට, මධ්‍යම ප්‍රතිපදාව නම් ආර්ය මාර්ගය දේශනා කරපු දිනය තමයි ඇසළ පුන් පොහෝ දිනය. හේතු ඵල දහම අනුගමනය කරල සාස්තෘවරයාණන්ගේ උත්තරීතර ධර්මය ලෝකයට පහළ වෙලා, සම්බුද්ධ දිවාකරයාණන්ගෙන් නිකුත් වූ සදහම් අමා බෙර හඬ ලෝක ධාතුවේ ඒකාලෝක වෙමින්, සිවුසස් දහම් ලෝකයට දේශනා කරමින් විසාලතම සමාජ විපර්යාසයක්, බුද්ධි විප්ලවයක්, චින්තන ප්‍රබෝධයක් ඇති කළ දිනය තමයි ඇසළ පොහොය.

පස්වග තවුසන්ට දහම් දෙසන්න බරණැස මිගදාය නම් ඉසිපතනාරාමයට වඩින කොට, උපක නම් ආජීවකයා බුදුන් වහන්සේගෙ සංසුන් ඉඳුරන් දැකල මෙහෙම අහනවා. ''ඇවැත්නි, ඔබගේ ඉන්ද්‍රියන් ඉතා ප්‍රසන්නය. ශරීර වර්ණය පිරිසිදුය, නිර්මලය. ඔබ කවරෙකුගේ ධර්මයට රුචි කරන සේක්ද ?'' ඔහුට පිළිතුරු වදාරණ බුදුන් වහන්සේ, මම කාම - රූප - අරූප කියන තුන් භවයට අයත් සියලු ධර්මයන් මැඩ පවත්වමින්, සියලු ධර්මයන් අවබෝධ කර, කිසිවකට නොඇලී සියල්ල දැන වාසය කරන බව පැහැදිලි කළා. ඒ වගේම තමන්ට ගුරුවරයෙක් නැති බවත්, තමන් හා සමාන කෙනෙක් නැති බවත් පැහැදිලි කරමින්, තමන් අරිහත්වයට පත්වී නිරුත්තර වූ සාස්තෘ වෙමින් සම්මා සම්බුද්ධත්වයට පත්වී සිසිල් වූ නිවුනු උතුමෙක් බව පැහැදිලි කළා. (මෙතනදි නිරුත්තර කියන්නෙ, කට උත්තරත් නෑ කියන එක. ඒ කියන්නෙ යම් කිසි ප්‍රශ්නයකට උත්තර දුන්නම, ප්‍රශ්නය විසඳල දුන්නම, දැන් මොකද කියන්නෙ කියල ඇහුවොත් කට උත්තරත් නෑ. ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම විසඳිලා හමාරයි.) ඉන් පසු, අවිද්‍යා අන්ධකාරයෙන් ගිලී සිටින ලෝකයාට ධර්ම චක්‍රය පැවැත් වීමට, සදහම් අමා බෙරය ගැසීමට බරණැස ඉසිපතනාරාමයට වඩින බව උපක ආජීවකයාට පවසා උන් වහන්සේ පිටත්ව වැඩියා.

මේ විදිහට වැඩම කරල පස්වග තවුසන්ට ඇසළ පුන් පොහෝ දිනයක ධර්ම චක්‍රය දේශනා කරමින් කොණ්ඩඤ්ඤ තවුසාට දහම් ඇස හෙවත් සෝතාපන්න ඵලයට පත්වීමට අවශ්‍ය මග පෙන්වා දුන්නා. පළමු දහම් දෙසුමෙන්ම කෙළෙස් මළ නැති කරන, කෙළෙස් රජස් දුරු කරන දහම් ඇස වූ ලොව්තුරු සම්මා දිට්ඨිය කොණ්ඩඤ්ඤ තවුසා වෙතින් ප්‍රත්‍යක්ෂ කළා. (විරජං වීතමලං ධම්ම චක්ඛුං උදපාදි - ධම්ම චක්ක සූත්‍රය)

මේ විදිහට ධර්මය ශ්‍රවණයෙන් ප්‍රඥාවන්තයින්ට පහසුවෙන් ලබාගත හැකි සෝතාපන්න ඵලය, අරිහත්වයට පත්වීම තරම් මහා දුෂ්කර ඉතා ගැඹුරු, වර්තමානයේ කිසිසේත් කළ නොහැකි දෙයක් විදිහට අද ඇතැම් උදවිය හුවා දක්වන බව පෙනී යනවා. අද කෙනෙක් සෝවාන් වුනා කියල කිව්වොත්, ඒ පුද්ගලය බොරු කාරයෙක් / වංචා කාරයෙක් කියල අපහාස උපහාස කරන්න තරම් සමාජය අන්ධ වෙලා තියෙනවා.

මේකට ප්‍රධාන හේතුව විදිහට පෙනී යන්නෙ, බෞද්ධ සමාජය තුළ සෝතාපන්න වීම කියන්නෙ මොකක්ද කියල වටහා නොගැනීම. **හත් කෝටියක් ජන ගහනය හිටපු සැවැත් නුවර වැසියන්ගෙන් කෝටි 5 ක්ම සෝතාපන්න වෙච්ච උදවිය බව බුද්ධ දේශනාවෙ සඳහන් වෙනවා.** මේ විදිහට මග ඵල ලැබූ කෝටි 5 ක ජනතාව, සියල්ල අත හැර වනගත වෙච්ච අය නෙවෙයි. සමාජය තුළ ජීවත් වෙමින්, රැකී රක්ෂා වෙළ හෙළඳාම්, ගොවිතැන් බත් ආදිය කරමින්, අඹු දරුවන් පෝෂණය කරමින් ගිහි ජීවිත ගත කරපු උපාසක උපාසිකා පිරිස්. මේ අනුව පෙනී යන්නෙ, ගිහි ජීවිතයක් ගත කරමින් වුනත් මග ඵල ලබන්න බාධාවක් නැති බව. නමුත් වර්තමානයේ බොහෝ භික්ෂූන් වහන්සේලා පවා දේශනා කරන්නෙ, මේ කාලයේ මග ඵල ලබන්න බෑ කියල.

මේ කාරණය එහෙම වුනත්, බුදු රජාණන් වහන්සේ පරිනිර්වාණ සූත්‍රයෙන් සුභද්‍ර නම් භික්ෂුවට ප්‍රකාශ කළේ, භික්ෂූන් මනා කොට ප්‍රතිපත්ති පුරන තාක් කල් සාසනය රහතුන්ගෙන් හිස් නොවන බව. (ඉමේච සුභද්ද භික්ඛු සම්මා විහරෙය්‍යුං අසුඤ්ඤෝ ලෝකේ අරහංතේහි අස්ස) බුද්ධ සාසනය තවමත් වඳ වෙලා නෑ. ඒ වගේම ගොඩ නගන්න බැරි තරම් පරිහානියට පත් වෙලත් නෑ. කාලයාගේ ඇවෑමෙන් සිදු වෙලා තියෙන්නෙ නිවන් මග යටපත් වීම පමණයි. ධර්මය මැනවින් විග්‍රහ කරන්න පුළුවන් සිවු පිළිසිඹියා ඥාන සහිත සත්පුරුෂයන්ගෙ පහළ වීමක් සිද්ධ වුනොත්, අදත් මගඵල නිවන් සාක්ෂාත් කර ගන්න බාධාවක් නෑ. අවශ්‍ය වෙන්නෙ නිවැරදි මාර්ග ප්‍රතිපදාව විද්‍යමාන වීම පමණයි. දැන් උදා වෙලා තියෙන්නෙ ☞

ශ්‍රී සද්ධර්මය නැවත මතු වන යුගයක්.

සාසනය වසර පන් දහසක් පවතින බව අටුවාවල විස්තර කරල තියෙනවා. ඒ පන්දහස වෙන් කරල තියෙන්නෙ මේ විදිහට. වසර දහසක් සිවු පිළිසිඹියාපත් මහ රහතන් වහන්සේලාත්, ඊළඟ දහසේ ත්‍රිවිද්‍යාලාභී මහ රහතන් වහන්සේලාත්, වසර තුන් දහස වෙන කොට අනාගාමී මගඵල ලාභීන් සහ හාරදහසෙදි සකෘදගාමීන් පහළ වෙන බවත්, පන් දහසෙදි සෝවාන් ඵල ලාභීන් පහළ වෙන බවත් අට්ඨ කතාවල සඳහන් වෙන කාරණයක්. මේ කරුණුම තවත් සුළු සුළු වෙනස්කම් සහිතව වෙනත් අටුවාවලත් විස්තර කරල තියෙනවා. මේ අනුව බැලුවත් තවම මග ඵල ලබන්න පුළුවන් කාලයක් බව පෙනී යනවා.

මේ වසර පන් දහස විමුක්ති යුගය, ධ්‍යාන යුගය, ශ්‍රැති යුගය, සීල යුගය, දාන යුගය වශයෙන් යුග 5 කට වෙන් කරල අටුවාවල විග්‍රහ කරල තියෙනවා. මේ වෙන් කිරීම පෙළ දහමේ සමහර කරුණු සහ සාසන ඉතිහාස ගත කරුණු සමග සසඳල බලන කොට නිවැරදි බව පෙනී යනවා. ඉහතින් සඳහන් කරපු යුග පහෙන් එක යුගයකට වසර 500 ක කාලයක් අඩංගු වෙමින් යුග 5 ගෙවිල යන කොට වසර 2500 ක් සම්පූර්ණ වෙනවා. බුද්ධ වර්ෂ 2500 වෙන කොට ඉහත යුග පහේ පළමු වටය නිමා වෙලා, නැවත විමුක්ති යුගයේ පටන් දෙවන වටය ආරම්භ වෙනවා. එක යුගයකට වසර 500 බැගින් ගිහින් යුග 5 අවසාන වෙන කොට නැවතත් වසර 2500 ක් ගෙවිල යනවා. එතකොට සම්පූර්ණ කාලය වසර 5000 යි. ගෞතම බුදු සසුන වසර 5000 ක් පවතිනවා කියන අදහසේ තවත් පැති කඩක් තමයි මේ සඳහන් කළේ. ඊළඟට ඉහතින් සඳහන් කළ යුග පහේ විග්‍රහය මේ විදිහට තේරුම් ගන්න ඕන.

මහ බෝසතාණන් වහන්සේ නමක් බුද්ධත්වයට පත්වීමෙන් පළමු විමුක්ති යුගය ආරම්භ වෙනවා. මේ කාලය වසර 500 ක්. මේ යුගය ගෞතම බුදු සසුනේ ස්වර්ණමය යුගය හැටියට හඳුන්වන්න පුළුවන්. **තථාගතයන් වහන්සේ විසින් දේශනා කොට වදාල ධර්මය, කිසිම කඩකිළුටක් නැතිව පැවතුනේ වසර 500 ක් තරම් කෙටි කාලයක්.** ඒ බව චුල්ලවග්ග පාලියේ, බුදුන් වහන්සේ ආනන්ද හිමියන්ට මේ විදිහට දේශනා කරල තියෙනවා. ආනන්දය, දැන් මාගේ ශ්‍රී සද්ධර්මය පිරිසිදුවම පවතින්නෙ වසර 500 ක් පමණයි. (පංචේව දානි ආනන්ද වස්ස සතානි සද්ධම්මෝ ඨස්සති - චුල්ලවග්ග පාළිය භික්ඛුණී ඛන්දකය)

චුල්ලවග්ග පාළියේ සඳහන් මේ බුද්ධ දේශනාවෙන් පෙනී යන්නෙ, ශ්‍රී සද්ධර්මය කිසිම කඩ කිළුටක් නැතිව සුද්ධව පැවතිලා තියෙන්නෙ වසර 500 ක් පමණක් බව. ඉහතින් පෙන්වා දුන් විමුක්ති යුගයේ වසර 500 ක කතාව චුල්ල වග්ගයේ තියෙන දේශනාව සමග හොඳින් ගැලපෙන බව මෙයින් පෙනී යනවා. බුද්ධ වර්ෂ 500 ට ආසන්න වෙන කොට බැමිණිටියාසාය වගේ දුර්භික්ෂ හට ගත්තා. මුලින්ම මුඛ පරම්පරාවෙන් ගෙනා ත්‍රිපිටක බුද්ධ වචනය, තවදුරටත් ඒ විදිහට ගෙනි යන්න බැරි වෙයි කියල හිතල, අන්තිමට කරන්න දෙයක් නැති නිසා, එදා වැඩ හිටපු මහ රහතන් වහන්සේලා එකතු වෙලා අනාගතය ගැන බලල ධර්මය සුරක්ෂිත කරන්න ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළ බව තමයි ඉතිහාසයේ සඳහන් වෙන්නෙ.

බුද්ධ වර්ෂ 500 න් පසු උදා වෙන්නෙ දෙවන යුගය වන ධ්‍යාන යුගය. ඒ කාලය තුළ ධ්‍යාන ලාභීන් පහළ වෙනවා. මග ඵල, නිවන් සාක්ෂාත් කරන අය ක්‍රමයෙන් අඩු වෙලා ධ්‍යාන කුසල් උපදවා ගත් පිරිස් ඒ යුගයේ බිහි වෙනවා. නිර්මල ශ්‍රී සද්ධර්මය ඒ කාලය වෙන කොට බොහෝ කොටම යටපත් වීම නිසා මගඵල ලාභීන්ගෙන් සාසනය හිඟ වෙනවා. තුන් වන ශ්‍රැති යුගය ඊළඟට උදා වෙනවා. ඒ පවතින කාලයත් වසර 500 ක්. මේ කාලයේ පොත්පත් ලිවීම, අද වගේ මොනව හරි ධර්මය විදිහට දේශනා කිරීම, පින්කම් සිදු කිරීම වගේ දේවල් පවතිනවා හැර, පිරිසිදු විමුක්ති මාර්ගය විද්‍යමාන වෙන්නෙ නෑ.

හැබැයි මේ තුන් වන යුගය කියන්නෙ වසර 1000 - 1500 අතර කාලය නිසා, එතකොට මලියදේව මහ රහතන් වහන්සේ පහළ වුනේ ඔය කාලයේ නෙවෙයිද කියල කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන්. නමුත් අවාරෙටත් අඹ හැදෙනව වගේ එහෙම දේවල් වෙන්න පුළුවන්. වාරෙට හැම තැනම අඹ තියෙනවා. ඒ නිසා අඹ ගහක් විශේෂයෙන් ප්‍රසිද්ධ වෙන්නෙ නෑ. හැබැයි අවාරෙට යම් කිසි ගහක හොඳට සරුවට අඹ ඵල දරල තියෙනව නම් ඒක විශේෂයෙන් ප්‍රසිද්ධ වෙනවා. ඒ නිසා තමයි ඒ කාලෙ වැඩ හිටපු රහතන් වහන්සේලා අතරින් මලියදේව මහ රහතන් වහන්සේගෙ නම විතරක් ප්‍රසිද්ධ වුණේ. නැත්නම් උන් වහන්සේගෙන් බණ අහල රහත් වෙච්ච අය තව කොච්චර නම් හිටියද? එක්තරා අවස්ථාවක උන් වහන්සේ ධර්ම දේශනා කරන කොට ඒ බණ අහල 60 පොළක 60 ගානෙ රහත් වුණයි කියලත් කියනවා. නමුත් ඒ එක්කෙනෙක්ගෙවත් නම් සඳහන් වෙන්නෙ නෑ. ඉතින් ඒ වගේ ධර්මය පිරිහෙන කාලයක වුනත් හේතු වාසනාවන්තයින් ඇවිත් දහම බබලවන්න පුළුවන්. හැබැයි ඒකටත් බුද්ධ සාසනය / ධර්මය පවතින්න ඕන. එහෙම නැත්නම් නැගෙන්නෙ නෑ.

ඊළඟට මේ ශ්‍රැති යුගය ගෙවීමෙන් අනතුරුව සීල යුගය උදා වෙනවා. ඒ කාලයට සිල් වත සමාදන් වීම්, පින් දහම් කිරීම් වගේ තත්ත්වයන් පවතිනව මිසක්, ආර්ය මාර්ගය වැඩීමක් සිද්ධ වෙනව අඩුයි. මේ යුගයේ වසර 500 න් පසු අවසාන යුගය වන දාන යුගය උදා වෙනවා. මේ කාලය වෙන කොට සීලය යටපත් වෙලා දානයට පමණක් මුල් තැන දෙන, මේක තමයි බුදු මග කියල හිතාගෙන කටයුතු කරන තත්ත්වයක් ඇති වෙනවා. මහනුවර යුගය ගැන සලකා බලන කොට මේ කරුණ මැනවින් ඔප්පු වෙනවා. උපසම්පදා භික්ෂුවක් පවා නැති තරමට සඟ සසුනත් පරිහානියට පත් වුණා. රජ සිටු සම්පත් පතමින් මෛත්‍රී බුද්ධ සාසනයේ නිවන් ලැබෙන විදිහට පින් වාක්‍යයන් බිහි වුනෙත් මේ කාලයේ. ඒක සාසනය පිරිහීමේ උච්ච අවස්ථාවක්. මේ විදිහට එක යුගයකට වසර 500 බැගින් ගෙවිල 2500 ක් ඇවෑමෙන් පළමු යුගය අවසන් වුණා.

ශ්‍රී බුද්ධ වර්ෂ 2500 න් පසු නැවතත් යුග පහේ දෙවන වටය ආරම්භ වෙනවා. දැන් මේ උදා වෙන්නෙ විමුක්ති යුගයේ ස්වර්ණමය අවස්ථාව. මේ වසර 500 තුළ සත් පුරුෂ උතුමන්ගෙ පහළ වීමෙන්, මෙතෙක් කල් යටපත් වෙලා තිබුණ නිර්මල බුදු දහම නැවත මතු වෙලා, මහ රහතන් වහන්සේලා පහළ වෙන උත්තරීතර කාල පරාසයක් තමයි උදා වෙන්නෙ. ඒ නිසා ගෞතම බුද්ධ සාසනයේ ප්‍රතිඵල නෙලා ගන්න පුළුවන් තවත් අනගි කාල පරාසයක් තමයි මේ ගෙවිල යන්නෙ. මේ දුලබ අවස්ථාවෙන් ප්‍රතිඵල නෙලා ගන්න බැරි වුනොත් මෛත්‍රී බුද්ධ සාසනය පහළ වෙන කල් බුදු සසුනක් නැවත මුණ ගැහෙන්නෙ නෑ.

ලොව්තුරා තථාගතයන් වහන්සේ විසින් දේශිත ශ්‍රී සද්ධර්මය මග ඵල ලාභී සත් පුරුෂ උතුමෙකුගෙන් ශ්‍රවණය කරල, ශ්‍රැතමය ඥානය තුළින් ත්‍රිලක්ෂණය අවබෝධ කරගන්න ඕන. ඒක ආර්ය සම්මා දිට්ඨිය හෙවත් සෝතාපන්න වීම කියල හැඳින්වෙනවා. ''චතුහි භික්ඛවේ ධම්මේහි සමන්නාගතෝ අරිය සාවකෝ සෝතාපන්නෝ හෝති, අවිනිපාත ධම්මෝ නියතෝ, සම්බෝධි පරායනෝ'' (සංයුක්ත නිකාය - සගාථක සූත්‍රය) මේ සූත්‍ර පාඨයෙන් පෙන්වා තියෙන්නෙ, කාරණා 4 කින් යුත් තැනැත්තා සෝතාපන්න ආර්ය ශ්‍රාවකයෙක් වෙන බව. (සෝත + ආපන්න - සෝතාපන්න) සෝතයට පැමිණි කෙනා සෝතාපන්න කියල හඳුන්වනවා. සැඩ පහරටත් සෝතය කියල කියනවා. පෘතජ්ජන සියලු දෙනා සංසාර සැඩ පහර හෙවත් කෙලෙස් සැඩ පහරට හසු වෙලා සසර ගමන් කරනවා. ඒක අනුසෝතගාමී කියල හඳුන්වනවා. ඒ සසර සැඩ පහරට ප්‍රතිපක්ෂව ගමන් කිරීම හෙවත් විමුක්ති මාර්ගයේ ගමන් කිරීම පටිසෝතය කියල හඳුන්වනවා.

''අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ සෝතෝ'' කියන බුදු වදනට අනුව, අරි අටගි මග පටිසෝතගාමී මාර්ගය

වෙනවා. මේ ආර්ය මාර්ගයට ආපන්න වීම හෙවත් පැමිණීම තමයි සෝතාපන්න වීම කියන්නෙ. **සෝවාන් මග ඵල ලාභියෙක් ඒ තත්ත්වයේ ඉඳල දෙව් මිනිස් දෙගතියේ නැවත උපතක් ලැබුවත්, ඒ පුද්ගලයගෙ සෝවාන් තත්ත්වය නැති වෙන්නෙ නෑ. ඒ අය ජාත සෝතාපන්න හෙවත් උපතින්ම සෝවාන් අය කියල හඳුන්වනවා.**

සෝවාන් ආර්ය ශ්‍රාවකයා ධර්මතා 4 කින් යුක්තයි. තුනුරුවන් කෙරෙහි අවෙච්චප්පසාදය සහ අරිය කාන්ත සීලයෙන් යුක්ත වීම මුල් කාරණා 2. අවෙච්චප්පසාදය කියන්නෙ මොකක්ද කියල පළමුව වටහා ගන්න ඕන. චතුරාර්ය සත්‍ය ධර්මය ශ්‍රවණය කිරීම තුළින් ඇති වන ඥාන පද 4 නිසා, පෘතජ්ජන භාවයෙන් මිදිල ආර්යත්වයට පත් වෙන කොට පුද්ගලයා තුළ විසාල පරිවර්තනයක් සිද්ධ වෙනවා. මීට පෙර තමන් තුළ තිබුණා වූ අතෘප්තිකර ඇලීම් ගැටීම් අඩු වෙලා තියෙන බව වැටහෙනවා. නව උපතක ඉපදුන කෙනෙක් බව අවබෝධ වෙනවා. (අරියාය ජාතියා ජාතෝ)

මේ ඇති වන මහා පරිවර්තනය නිසා ධර්ම ශ්‍රවණයෙන් ලැබූ සතුට බුදුන් වහන්සේ ඉදිරියේ බොහෝ ශ්‍රාවකයන් මේ විදිහට ප්‍රකාශ කරල තියෙනවා. ''ස්වාමීනි, ඔබ වහන්සේගේ දහම් දෙසුම ඉතා අගනේය. හරියට යටිකුරු කළ දෙයක් උඩට හරවා පෙන්වූවා සේය, වැසුන දෙයක් විවෘත කර දුන්නා සේය, මංමුලා වූ කෙනෙකුට පාර පෙන්වා දුන්නා සේය, අඳුරේ සිටි කෙනෙකුට ආලෝකය පෙන්වා දුන්නා සේය. භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කරුණුවලින් ධර්මය දේශනා කොට වදාරණ ලද්දේය. අද පටන් මා දිවි හිමි කොට තෙරුවන් සරණ ගියා වූ කෙනෙක් ලෙස පිළිගනු මැනවි.''

මේ තමයි තුනුරුවන් කෙරෙහි ඇති වන අවෙච්චප්ප්‍රසාදය බුදුන් වහන්සේ ඉදිරියේ ප්‍රකාශ කළ ආකාරය. (අව + ඉච්ඡ + ප්‍රසාද - අවෙච්චප්ප්‍රසාදය) ඉච්ඡ කියන්නෙ කැමැත්ත. කැමැත්ත වැඩි තරමට ඇලීම වැඩියි. එතකොට ගැටීමත් වැඩියි. රාග, ද්වේශ, මෝහ ගිනි නැගෙනවා. ඒ ගින්නෙන් දැවෙනවා. හැබැයි ඒ ඉච්ඡත්වය හෙවත් කැමැත්ත අව වෙන කොට ගින්නත් අඩු වෙනවා. ගින්න අඩු වුනාම දැවිල්ලත් අඩුයි. එතකොට ප්‍රසාදය නැගෙනවා. මේ තමයි අවෙච්චප්ප්‍රසාදය කියන එකේ තේරුම. ඉතින් අදත් යම් කෙනෙකුට ධර්මය ශ්‍රවණය කිරීම තුළින් සෝතාපන්න භාවය ඇති වුනා නම්, එදා බුදුන් වහන්සේ ඉදිරියේ සතුට ප්‍රකාශ කළ ආකාරයට කියන්න පුළුවන්. ආර්ය ශ්‍රාවකයා ශ්‍රද්ධාවේ නොවෙනස්ව පිහිටියා කියන්නෙත් අවෙච්චප්ප්‍රසාදය ඇති වුනා කියන එක. (චතුසු සෝතාපත්ති අංගේසු සද්ධා බලං දට්ඨබ්බං)

අංගුත්තර නිකායේ අවෙච්චප්පසන්න සූත්‍රයේ බුදුන් වහන්සේ මේ විදිහට වදාරණවා. ''මහණෙනි, යමෙක් මා කෙරෙහි අවෙච්චප්ප්‍රසන්න භාවයෙන් යුක්ත නම් ඒ සියලු දෙනාම සෝතාපන්න වූ අයයි.'' (යේ භික්ඛවේ මයි අවෙච්චප්පසන්නා සබ්බේ තේ සෝතාපන්නෝ - අංගුත්තර නිකාය - <u>අවෙච්චප්පසන්න සූත්‍රය</u>.) ඒ වගේම බුදුන් වහන්සේ පිළිබඳ පැහැදීමේ නිෂ්ඨාවට පත් වුනා නම්, ඒ සියලු දෙනාම දිට්ඨි සම්පන්න හෙවත් සෝවාන් වූ අය බව දේශනා කරල තියෙනවා. (යේ කේචි භික්ඛවේ මයි නිට්ඨංගතා සබ්බේ තේ දිට්ඨි සම්පන්නෝ)

ඊළඟට සෝතාපන්න පුද්ගලයා තුළ ඇතිවන හතර වන කාරණය විදිහට ඉහතින් සඳහන් කළ සගාතක සූත්‍රයේ පෙන්වා තියෙන්නෙ, ආර්ය සීලයෙන් යුක්ත වීම. (අරිය කන්තේහි සීලේහි සමන්නාගතෝ හෝති) ආර්ය සීලය කියල සඳහන් කරන කොට අනාර්ය සීලයකුත් පැවතිය යුතුයි. තථාගත ධර්මය ශ්‍රවණය තුළින් මූලික ප්‍රඥාව හෙවත් ආර්ය සම්මා දිට්ඨියට පත් නොවී රකින සිල් අනාර්ය සිල් විදිහට හඳුන්වන්න පුළුවන්. ඒක බුදු සසුනෙන් බැහැරව දුරක්ඛාත සාසනවලත් තියෙනවා. ''ආකාසේච පදං නත්ථි සමනෝ නත්ථි බාහිරේ'' කියන ධම්ම පද දේශනාව අනුව, අහසෙහි පක්ෂීන් ඉගිල ගියත් පා සටහන් නොපෙනෙන්නා සේ, බාහිර සාසනවල සතරාකාර ශ්‍රමණයන් දකින්න නෑ. ඒ නිසා ඒ වගේ සසුන්වල ආර්ය සීලය විද්‍යමාන වෙන්නෙත් නෑ.

පන්සිල්, අට සිල්, දස සිල් ආදී වශයෙන් සඳහන් වෙන සියලු සිල්, ධර්මාවබෝධයෙන් තොරව වතක් විදිහට රැකීමෙන් ආර්ය සීලය ඇති වෙන්නෙ නෑ. ධර්මාවබෝධය ඇති වූ ආර්ය ශ්‍රාවකයා තුළ පිහිටන සංවරත්වයම ආර්ය සීලය වෙනවා. (සංවරට්ඨේන සීලං) සෝතා-පන්න පුද්ගලයා තුළ ඇති වන පංච සීලය නොකැඩෙන, කැළැල් සිදුරු නැති, නිවනට හේතු වන සීලයක් නිසා ඒකට ආර්ය සීලය කියල කියනවා. වේරමණී සීල, චේතනා සීල, සංවර සීල, පහාණ සීල, අවිතික්කම සීල කියන පන්සිල්, සෝතාපන්නයාගේ ආර්ය සීලයන් වෙනවා.

සෝතාපන්න කෙනා සතර අපාගත වීමට හේතු වන තරම් පාපයක් රමණය කරන්නෙ නෑ. මේ තමයි වේරමණී සීලය. චේතනා සීලය කියන්නෙ, සතර අපා උපතකට හේතු වන පාප චේතනා පහළ නොවීම. දුගතිගාමී වීමට තරම් දරුණු අසංවර හැසිරීම් ඇති නොවන නිසා, දිට්ඨි සම්පන්න පුද්ගලයා (සම්මා දිට්ඨියට පත් වූ සෝවාන් පුද්ගලයා) සංවර සීලයෙන් යුක්තයි. පහාන සීල කියල සඳහන් වෙන්නෙ, අපාගත වීමට හේතු වන සියලු පාපයන් පහ කළා කියන කාරණය. සික්ෂා පද ව්‍යාතික්‍රමණය හෙවත් ඛණ්ඩනය කරල අපාගත නොවන නිසා සෝතාපන්නයා අවිතික්කම සීලයේ පිහිටා ඉන්නවා.

ඊළඟට සගාතක සූත්‍රයේ අවිනිපාත ධම්මෝ, නියතෝ, සම්බෝධි පරායනෝ කියල සෝතාපන්න අරිය ශ්‍රාවකයගෙ තවත් ලක්ෂණ 3 ක් දේශනා කරල තියෙනවා. අවිනිපාත කියන්නෙ නොපිරිහෙන ස්වභාවය. සතර අපා උපතට හේතු වන අකුසල් නැති නිසා අවිනිපාත කියල හඳුන්වනවා. ඊළඟ දෙවන ලක්ෂණය තමයි නියත ගතියෙන් යුක්ත වීම. නියත කියන්නෙ වෙනස් නොවන ස්වභාවය. දිට්ඨි සම්පන්න පුද්ගලයෙක් නැවත ඒ තත්ත්වයෙන් පහළට වැටීමක් කිසි දාක සිද්ධ වෙන්නෙ නෑ. නියත වශයෙන්ම දුගතියෙන් මිදිල, දෙව් මිනිස් දෙගතියේ පමණක් උපත ලබන ස්වභාවය තමයි සෝතාපන්නයාට තියෙන්නෙ.

සම්බෝධි පරායනෝ කියන්නෙ, සෝවාන් කෙනාගෙ තුන් වන ලක්ෂණය. මෙයින් කියවෙන්නෙ සෝවාන් වූ තැන් පටන් නිවන කරාම ගමන් කරනවා කියන කාරණය. සංයුක්ත නිකායේ <u>වස්ස සූත්‍රයේ</u>, සෝතාපන්නයා නිවන කරාම ගමන් කිරීම උපමා කරල තියෙන්නෙ මෙහෙමයි.

''මහණෙනි, කඳු මුදුනට වහින මහ වැස්ස පහත් බිම්වලට ගලා යමින් පර්වත, කඳු රැළි, ඇල දොල, කුඩා ගංගා, මහා ගංගා පුරවමින් මහ මුහුද කරා ගලා යන්නේ යම් සේද, ආර්ය ශ්‍රාවකයා සතර සෝතාපත්ති අංගවලින් යුක්තව නිවන කරාම ගමන් කරයි.'' ඒ නිසා තමයි සෝතාපන්නයා පරප්‍රත්‍ය රහිත වූවෙක් (නිවන පූර්ණ කිරීම සඳහා අන්‍යයන්ගේ උපකාර අවශ්‍ය නැති) බව ධර්මයේ සඳහන් වෙන්නෙ. (අපරපත්තෝ සත්ථුස්සාසනං)

හැබැයි සෝතාපන්නයා පර ප්‍රත්‍ය රහිත වුවත් සත් පුරුෂ සේවනය, සද්ධර්ම ශ්‍රවණය, යෝනිසෝ මනසිකාරය, ධර්මානුධර්ම ප්‍රතිපදාව කියන කාරණා සකදාගාමී වීම පිණිස, අනාගාමී වීම පිණිස, අරිහත් වීම පිණිස උපනිශ්‍රය වන බව සංයුක්ත නිකායේ සෝතාපත්ති සංයුක්තයේ සූත්‍ර දේශනාවලින් පෙන්වා තියෙනවා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

**කිවුල්දෙණියේ විජිතනන්ද හිමි**
**නීග්‍රෝධාරාම සේනාසනය, පොල්පිටිය,**
**මැටිකුඹුර, පොල්ගහවෙල**


# රහතුන්ගේ උදම් වැකි

**5 වන කොටස**

මහා කොට්ඨිත මහ රහතන් වහන්සේ කියන්නෙ, ගෞතම බුද්ධ සාසනයේ අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලා අතරින් උතුමෙක්. උන්වහන්සේ දැරුවෙ ශ්‍රාවකයන් අතරින් සිවු පිළිසිඹියාවෙන් අග තනතුර. අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන කියන ඥාන හතර තමයි සිවු පිළිසිඹියාවට අයිති වෙන්නෙ. කෙනෙක් තමන්ට තියෙන දහම් ගැටළුවක් හෝ යම් ප්‍රශ්ණයක් උන්වහන්සේ ළඟට අරගෙන ආවම, උන්වහන්සේ මේ සිවුපිළිසිඹියා නුවණින් පහදල දෙනවා, ඒ ගැටළුව ලිහල දෙනවා. ලොව්තුරා බුදුන් වහන්සේ පවා මහා කොට්ඨිත මහ රහතන් වහන්සේගෙ මේ හැකියාව වර්ණනා කරල තියෙනවා. මහා කොට්ඨිත මහා ප්‍රාඥයි, මම දේශනා කළත් ඔය ටිකමයි කියන්නෙ, ඒ නිසා ඒක දරා ගන්න කියල ලොව්තුරා බුදුන් වහන්සේත් සාදු කාර දුන් අවස්ථා ත්‍රිපිටකයේ සඳහන් වෙනවා.

බොහෝ විට බුදුන් වහන්සේ මාතෘකා පාඨය පමණක් දේශනා කරල එතනින් නික්ම යන අවස්ථා තියෙනවා. සියල්ලෙන් සියල්ල දකින ලොව්තුරා බුදුන් වහන්සේ, ඒ ශ්‍රාවක පිරිසට එහෙම ප්‍රශ්නයක් ඉතුරු කරන්නෙ, තව දුරටත් ඒක විමර්ශනය කරන්න අවස්ථාව ලබා දෙන්න. ඉතින් බොහෝ විට මේ මාතෘකා කොටස, එහෙම නැත්නම් ඉතාම සුළුවෙන් මුල පමණක් දේශනා කරපු දහම් කරුණ ගැන ඒ ශ්‍රාවක පිරිස කල්පනා කරනවා. ඒත් බොහෝ අවස්ථාවල විසඳගන්න බැරි වෙනවා. එතකොට කරන්නෙ එක්කො සැරියුත් මහ රහතන් වහන්සේ ළඟට ගිහින් ඒ මූලික දහම් කොටස විග්‍රහ කරගන්න එක. එහෙම නැත්නම් මහා කච්චායන මහ රහතන් වහන්සේ ළඟට ගිහින් ඒ කරුණ විග්‍රහ කරගන්නවා. එහෙමත් නැත්නම් මහා කොට්ඨිත මහ රහතන් වහන්සේ ළඟට ගිහින් විග්‍රහ කර ගන්නවා.

ඉතින් ඒ විග්‍රහ කරගත්ත දහම් කොටස් නැවත ලොව්තුරා බුදුන් වහන්සේ ළඟට ඇවිත් සැළ කළාම, උන්වහන්සේත් සාදු කාර දීල, ඒ කිව්ව ටික ඒ විදිහටම දරා ගන්න කියල අනුමත කරනවා. ඇත්තටම මේ කරුණු දිහා බැලුවම වැදගත් දෙයක් ඉස්මතු වෙනවා. ඒ කාරණය තමයි, ලොව්තුරා බුදුන් වහන්සේ දේශනා කළ චතුරාර්ය සත්‍ය ධර්මය, පටිච්ච සමුප්පාද ධර්මය, බුදුන් වහන්සේ බලාපොරොත්තු වෙන මට්ටමට ශ්‍රාවකයන් වහන්සේලාටත් විග්‍රහ කරල දේශනා කරන්න හැකියාව තියෙන බව. ලොව්තුරා බුදුන් වහන්සේ දේශනා කරපු වචන ඒ විදියටම දේශනා නොවෙන්න පුළුවන්, නමුත් අදහස උන්වහන්සේ අදහස් කරපු කාරණයටම සමානයි. ඒ කියන්නෙ රාගය, ද්වේශය, මෝහය ක්ෂය වෙන්න හේතු වෙනවා. අදටත්, ලොව්තුරා බුදුන් වහන්සේ ජීවමානව නැති වුනත්, උන්වහන්සේගෙ ශ්‍රාවක පරම්පරාව ඒ දේශනා කළ දහම ජීවමානව රැගෙන යනවා. ඉතින් ඒ දහම් අවබෝධ කරගත්ත ශ්‍රාවකයන් වහන්සේ නමකගෙ බණ දේශනාවකිනුත්, එදා ලොව්තුරා බුදුන් වහන්සේ අදහස් කළ කාරණයමයි ඉස්මතු වෙන්නෙ.



එතකොට සිවු පිළිසිඹියාවෙන් අග්‍ර, මහා කොට්ඨිත මහ රහතන් වහන්සේත් උන්වහන්සේ ලැබූ මේ අග්‍ර ඵලය ගැන උදාන වාක්‍යයක් දේශනා කළා. ඒ උදාන වාක්‍යය සඳහන් වෙන්නෙ මෙහෙමයි.

උපසන්තෝ උපරතෝ
මන්තභාණී අනුද්ධතෝ
ධුනාති පාපකේ ධම්මේ
දුමපත්තං ච මාලුතෝති

සරළ සිංහල තේරුම,

සන්සුන් ඉඳුරන් ඇති, පවින් වැළකුණු, නුවණින් පිරික්සා බණින සුළු, උඩඟු නොවූ (කොට්ඨිත මහණ) පවන රුක් පතක් මෙන් පාප ධර්මයන් දුරු කෙරේ.

උන්වහන්සේගෙ මේ උදාන වාක්‍යය තුලින් පැහැදිලි වෙන්නෙ, අරිහතුන් වහන්සේගෙ සංවරකම, ඒ සංවරකම තුලින් නැගුන ඉන්ද්‍රිය දමනය සහ පාපයෙන් වෙන්වී සිටින ආකාරය. උන්වහන්සේම උපමාවකින් ඒක විස්තර කරල තියෙනවා. හරියට සුළඟක් නිසා ගහකින් විසිවෙන කොළයක් වගේ, පාප ධර්මයන් දුරු කරනවා කියන එක අරිහතුන් වහන්සේට වෙන්නෙ කොහොමද කියල කෙනෙකුට හිතෙන්න පුළුවන්. කෙනෙක් උත්සාහයෙන් වීර්යෙන් කරන දෙයක්, අරිහතුන් වහන්සේ කොහොමද ලේසියෙන්ම කරන්නෙ? කෙනෙකුට ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. ඇත්තටම එහෙම වෙන්නෙ කොහොමද?

අරිහතුන් වහන්සේ "භාහිත පාපී" කියල විශේෂ නමකින් හඳුන්වන බව පොත්පත්වල සඳහන් වෙනවා. ''සියලු පවු බැහැර කළ'' කියන එකයි ඒ විශේෂණයේ අදහස. කොහොමද සියලු පවු බැහැර කරන්නෙ? සියලු බුදුවරයන් වහන්සේලාගෙ දේශනාවක් තියෙනවා. ඒ දේශනාව බොහෝ පින්වතුන් දැනටමත් දන්නවා. සමහර පින්වතුන් ඒක කර්මස්ථානයක් විදිහටත් වඩනවා. ඒ තමයි,

සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං
ඒතං බුද්ධානසාසනං

සරළ සිංහල තේරුම,

සියලු පවු නො කිරීම ද, කුසල් දහම් රැස් කර ගැනීම ද, තම සිත දමනය කර ගැනීම ද යන මෙය බුදුවරයන් වහන්සේලාගේ සාසනයයි.

ඉතින් මේ ගාථාව පටන් ගන්නෙ, සියලු පවු නොකර සිටීම කියන කාරණයෙන්. කෙනෙකුට එහෙම පටන් ගන්න පුළුවන්ද? සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයේ වරදවා හැසිරීම, බොරු කීම, මත් පැන් පානය කිරීම ... ආදියෙන් උත්සාහයෙන් වීර්යෙන් වෙන් වෙලා හිටියත්, හදිස්සියේ බොරුවක් කියන අවස්ථාවක් එන්න බැරිද? මහ කරදරකාරයෙක් ඉස්සරහට එනවා, දන්නවා මේකා ආවොත් මහා කරදරයක් මිසක් වෙන දෙයක් වෙන්නෙ නෑ කියල. ඉතින් ගෙදර කෙනෙක් ගැන මේ මනුස්සය අහනවා, කෝ අහවලා අද ගෙදර ඉන්නවද කියල. හිටියත් මේ මනුස්සය මහ කරදරකාරයෙක් නිසා, නෑ එයා අද ගෙදර නෑ කියල කියන්න පුළුවන්, කියවෙන්න පුළුවන්. ඔය ජාතියේ දේවල් ඕන තරම් අපට සිද්ධ වෙලා තියෙනවා. ඒ වගේම අත්දැකීමුත් තියෙනවා.

එක පාරටම මදුරුවෙක් දෂ්ට කරනවා, ඒ වෙලාවෙ වෙන කතාවක හිටියෙ. එක පාරටම අත ඉස්සුනා මදුරුවව තලල දැම්මා. එහෙම දේවලුත් වෙන්න පුළුවන්. නිදාගෙන ඉන්න පොඩි එකා ළඟට ඇවිත් පත්තෑයෙක් කෑවොත් විනාසයි. ආයෙ දෙපාරක් හිතන්නෙ නෑ, රැක්ක සිල් මතකත් නෑ, සෙරෙප්පුවක් ගත්ත තලල දැම්මා. එහෙම දේවල් වෙන්න බැරිද? ඒ අනුව බැලුවොත්, කෙනෙකුට සියලු පවු බැහැර කරගෙන වැඩේ පටන් ගන්න පුළුවන්ද? බැලු බැල්මට ප්‍රායෝගික නැති ක්‍රමයක් වගෙයි පේන්නෙ. නමුත් ගාථාව පටන් ගන්නෙ, සබ්බ පාපස්ස අකරණං කියල. ඒ වගේම මහා කොට්ඨිත රහතන් වහන්සේගෙ උදාන වාක්‍යයේ, උන්වහන්සේ ගහකින් කොළයක් හුළඟට වැටෙනවා වගේ, කිසි අමාරුවක් නැතුව පාප ධර්ම බැහැර කළා කියලත් කියනවා.

ඉතින් බැලුවම තේරෙනවා, මේ "සබ්බ පාපස්ස අකරණං" කියන්නෙ ප්‍රතිඵලය මිසක් පටන් ගත යුතු තැන නෙවෙයි කියල. ඒක අරිහතුන් වහන්සේට සහජයෙන් පිහිටන ගුණයක්. උපමාවකින් කියනවනම්, එක පාරටම අපට සිතිවිල්ලක් එනවා, බත් කන්න ඕන කියල. ඉතින් මේ සිතිවිල්ල ඉෂ්ට කරගන්න නම්, මුලින්ම බත් තියෙන්න ඕන. දැන් බත් කොහෙන්ද එන්නෙ? ඒකට බත් උයන්න ඕන. බත් උයන්න නම් හාල් ඕන. හාල් තියෙන තැනකින්, එක්කො කලින් රැස් කරගත්ත තැනකින්, එහෙම නැත්නම් කඩේකින් ගේන්න ඕන. කඩේකින් ගේනව නම්, ගිහින් මුදල් දීල හාල් ගන්න ඕන. දැන් මේ ක්‍රියාදාමය පිළිවෙලින් බැලුවොත් ප්‍රතිඵලය තමයි මුලින්ම සිතිවිල්ලට ආවෙ.

1. බත් කන්න ඕන
2. බත් කන්න නම් බත් උයන්න ඕන
3. බත් උයන්න නම් හාල් ඕන
4. හාල් ගන්න කඩේට යන්න ඕන
5. කඩේට ගිහින් හාල් ගන්න ඕන

හැබැයි සරලව මෙහෙම කිව්වට, ඔය අතර තවත් පියවර ගණනාවක් තියෙනවා. උදාහරණ විදිහට කඩෙන් ගෙනාපු හාල් ගරන්න ඕන, හෝදන්න ඕන, ළිප පත්තු කරන්න ඕන .... ආදී වශයෙන් තවත් කළ යුතු අතරමැදි කාර්යන් තියෙනවා. දැන් පියවර පහකින් සරලව මේ බත් කනවා කියන ප්‍රතිඵලය සම්පූර්ණ කරගන්න පුළුවන්. ඒකට තමයි චේතනාව මුල් වෙනව කියන්නෙ. චේතනා මූලිකව තමයි මේ සියල්ලම කරන්නෙ. දැන් සිතිවිල්ල නැගුන පිළිවෙල බලන්න. මුලින්ම ප්‍රතිඵලය. නමුත් ඒ ප්‍රතිඵලය ලබා ගන්න ඕන නම් කළ යුතු පියවරවල් හිතට ආපු පිළිවෙලද කියල බලන්න. 1,2,3,4,5 කියන පිළිවෙලටයි සිතිවිලි ආවෙ. නමුත් ඒ විදිහටම ක්‍රියා කළොත් ඒ ප්‍රතිඵලය ලබා ගන්න පුළුවන්ද? අපි ක්‍රියා කරන කොට කොහොමද වෙන්නෙ? පිළිවෙල වෙනස් වෙනව නේද? මුලින්ම කඩේට ගිහින් හාල් ගන්න ඕන. ඊට පස්සෙ හාල් ටික ලැබුනා. දැන් ඒ හාල්වලින් බත් උයනවා. අන්තිමට බත් කනවා. පිළිවෙල වෙනස් වුනා. හිතුවෙ 1,2,3,4,5 කියන පිළිවෙලට වුනාට, කළේ 5,4,3,2,1 කියන පිළිවෙලට.

ඉහත ගාථාවත් ඒ වගේ. අරිහතුන් වහන්සේගෙ ඒ ප්‍රතිඵලය ලබා ගන්න නම් බුද්ධ අනුසාසනාව දරා ගන්න ඕන, වඩන්න ඕන. මොකක්ද බුද්ධ අනුසාසනාව ? ඒ තමයි උන්වහන්සේ දේශනා කරපු චතුරාර්ය සත්‍ය ධර්මය. චතුරාර්ය සත්‍ය ධර්මය කැටිවුන දහම් දේශනාවක් අහල, දැනගත් ප්‍රත්‍යක්ෂ කොටගත් ආර්ය ශ්‍රාවකයා මුලින්ම සහජයෙන්ම සිත දමනය කරගන්නවා. සෝවාන් ඵලයට පත් වූ ආර්ය ශ්‍රාවකයගෙ සිත, සහජයෙන්ම සතර අපාගත වන මට්ටමේ සිතිවිලිවලින්, ක්‍රියාවලින්, වචනවලින් වෙන් වෙනවා. හිත දමනය වෙනවා. ඒ කුසලයෙන් උපසම්පදා වෙනවා. **උප කියන්නෙ ආසන්න වෙනවයි කියන එක. සම්පාදනය කරනවා කියන්නෙ පාදනවා කියන එක. හැබැයි ඒක අනුන්ගෙන් ගන්න දෙයක් නෙවෙයි, වෙන කවුරුවත් කරල දෙන දෙයක් නෙවෙයි. තමන් තුළින්ම යථාවබෝධයෙන් කෙළෙස් ඉවත් වෙවී පෑදි පෑදි ආසන්නයට එනවා. ඒක තමයි උපසම්පදා කියන එකේ නියම අදහස.** එතකොට ඒ මට්ටමේ සියලු පවු බැහැර වෙනවා. අමුතුවෙන් උත්සාහයෙන් වීර්යෙන් කරන්න දෙයක් නෑ. කෙනෙකුට හිතෙන්න පුළුවන්, එහෙම වෙන්නෙ කොහොමද කියල. සෝවාන් ඵලයට පත්වුන ආර්ය ශ්‍රාවකයාට ඒකාන්තයෙන්ම බැහැර වෙන සංයෝජන තුනක් තියෙනවා. සත්කාය දිට්ඨිය, විචිකිච්ඡාව සහ සීලබ්බත පරාමාසය කියන මේ සංයෝජන තුන තමයි සහමුලින්ම බිඳෙන්නෙ. සහමුලින්ම බිඳෙනවා කියන එකේ තේරුම, නැවත හට නොගන්නවා කියන එක. හරියට ගහක් මුලකින් උදුරල දැම්මට පස්සෙ, ඒ ගහ නැවත හට නොගන්නව වගෙයි.

මූලිකව ඔය කියන සංයෝජන තුන නිසා තමයි ලෝක සත්වයා ලෝකෙට ඇලෙන්නෙ බැඳෙන්නෙ. ලෝකය සාරවත් තැනක් කියන දෘෂ්ටිය, බුදුන් දහම් සඟුන් කියන ත්‍රිවිධ රත්නයට මුල් තැන නොදීම, සිල් වතක් රැකීමෙන් නිවීමට පුළුවන් කියන හැඟීම මුල් වෙනවා. සාරවත් දේ තියෙනව කියන මේ මුලාව නිසා නොකරන දෙයක් නෑ. හොඳින් හෝ නරකින් මේ දේවල් ලබා ගන්න උත්සාහ කරනවා. පින් දහම් කරල ලබා ගන්න උත්සාහ කරනවා. හොඳයි සාරයි කියන තැනක් හදා ගන්න විවිධ උපක්‍රම යොදනවා. ඉතින් වැඩිපුරම වැටෙන්නෙ සතර අපාගත තත්වයට. මොන දේ කරන්නත් හිතේ ඇති වෙන සිතිවිලි තමයි මුල් වෙන්නෙ. අර සංයෝජන තුන නිසා මේ සිතිවිලි කිලිටි වෙනවා. එන සිතිවිලි සේරම කිලිටියි. හරියට පිරිසිදු වතුර එන බටයක් මැදින් කටුවකින් විදල ඒ බටය තුලට අපද්‍රව්‍ය දානව වගේ. අර අපද්‍රව්‍ය නිසා බටේ කෙලවරින් එන වතුර නිතරම අපිරිසිදුයි. ඒ අපිරිසිදු වතුර සුද්ධ කරන්න උත්සාහයක් වීර්යක් ගන්න ඕන.

ඒත් කවුරු හරි විස්වාස කෙනෙක් පෙන්වල කිව්ව නම්, අන්න අර බටේ මැදින් හිල් කරල ජරාව දානවා, අන්න එතන හෑදුව නම් අමුතුවෙන් මේ එන වතුර අපිරිසිදු වෙන්නෙ නෑ, වතුර සුද්ධ කරන්න අමුතුවෙන් උත්සාහයක් වීර්යක් ගන්න ඕන නෑ කියල, කීයෙන් කී දෙනෙක් ඒ දේ විස්වාස කරයිද ? නමුත් කිව්ව කෙනා තමන්ට විස්වාසම කෙනෙක් නම්, ඒ දේ නොකර ඉන්නෙත් නෑ. දැන් අර බටේට ජරාව එකතු කරන කටුව අයින් කරල බටේ වහල දැම්මොත්, අග එන වතුර ටික අමුතුවෙන් පිරිසිදු කරන්න උත්සාහයක් වීර්යක් දරන්න ඕන නෑ. අන්න ඒ වගේ තමයි අපේ සිතත් ඔය මූලික සංයෝජන තුනෙන් වගේම, එක එක මට්ටමෙන් සංයෝජන දහයකින් කිලිටි වෙනවා. මෙන්න මේ සංයෝජන අයින් කරගෙන යන කොට එන සිතිවිලි ඉබේම පිරිසිදුයි. අමුතුවෙන් කිලිටි අයින් කරන්න දෙයක් නෑ.

ඉහත ගාථාව වගේ බුද්ධ අනුසාසනාව පිලිගත්ත, දරාගත්ත කෙනාගෙ සිත ඉබේම දමනය වෙනවා, පිරිසිදු සිතිවිලි එන්න පටන් ගන්නවා, කුසලයෙන් වැඩෙනවා, උපසම්පදා වෙනවා. නිකම්ම පාපයෙන් වැලකෙනවා. සෝවාන් වෙච්ච කෙනාට සතර අපාගත මට්ටමෙන් මිදෙන්න අමුතුවෙන් උත්සාහයක් වීර්යක් ගන්න ඕන නෑ කියල මේකෙන් පැහැදිලි වෙනවා. ඒ මට්ටමේ කිසිම පාපයක් වෙන්නෙ නෑ කියන එකත් පැහැදිලියි. ඉතින් උපරිමය වූ අරිහතුන් වහන්සේට, සියලු පාපයෙන් මිදෙන්න, කරන්න දෙයක් තියෙනවද? උන්වහන්සේගෙ ඉන්ද්‍රිය සංවර වෙන්න අමුතුවෙන් කරන්න දෙයක් තියෙනවද ? ඒ ප්‍රශ්නවලට මේ වෙනකොටත් පිළිතුරු ලැබිල තියෙනවා.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සෑගවුණ දහම් කරුණු සමග ථේර ථේරී ගාථා ඇසුරින් සකස් කළේ:*

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# ධම්ම පදය තුලින් නිවන් මග

**12 වන කොටස**

ලොව්තුරා බුදු පියාණන් වහන්සේ මේ ගාථාව දේශනා කරන්න හේතු වුන මුල් කතාවට සම්බන්ධ වෙන්නෙ, විශාකා සිටු දුව සහ එතුමියගෙ මිතුරියන් පන්සීයක්. මේ ගාථාව අයිති වෙන්නෙ ධම්ම පදයේ ජරා වර්ගයට. ඉතින් ඒ කාලෙ තිබ්බ්ච සුරා පානය කිරීමේ උත්සවයකට පසු ඇති වෙච්ච සිද්ධියක් තමයි මේකට මුල් වුනේ. විශාකා සිටු දුවගෙ මිතුරියන් පන්සීය එතුමියට හොරෙන්, තමන්ගෙ ස්වාමිවරුන් පානය කිරීමෙන් පසු ඉතුරු වුන සුරාව පානය කරල බුදුන් වහන්සේ හමුවට බණ අහන්න ගියා.

ඉතින් මේ සුරා මතින් හිටිය ස්ත්‍රීන් පන්සීය ලොව්තුරා බුදුන් වහන්සේ ඉදිරියේ එක එක විදිහට හැසිරුනා. සමහරු උන්වහන්සේ ඉදිරියේ සින්දු කියන්නත්, සමහරු විකාර කියවන්නත්, තවත් සමහරු නටන්නත් ගත්තා. ඉතින් මේ විකාර දැක්ක බුදුන් වහන්සේ, ඒ අය ඉදිරියේ මහා අන්ධකාරයක් මැව්වා. මේ අන්ධකාරය ඉදිරියේ මේ ස්ත්‍රීන් පන්සිය දෙනාට මහා මරණ බයක් ඇති වුණා. අර තිබ්බ්ච වෙරි ගතිය හිඳුනා. ඊට පස්සෙ උන්වහන්සේ, මහා මේරු පර්වතය මුදුනේ සිට චන්ද්‍රයන් දහයකින් එන ආලෝකයට සමාන ආලෝකයක් මවල, මේ ගාථාව ඒ ස්ත්‍රීන් ඉදිරියේ දේශනා කළා.

කෝ නු හාසෝ කිමානන්දෝ -
නිච්චං පජ්ජලිතේ සති
අන්ධකාරේන ඕනද්ධා - පදීපං න ගවෙස්සථ ?

සරල සිංහල තේරුම,

මේ ලෝකස්සන්නිවාසය (ලෝකයා සමග එකතු වී වාසය කිරීම) රාගාදී එකොළොස් ගින්නෙන් නිතර ඇවිලගෙන ඇති කල්හි තොප හැම දෙනාට මොන සිනාවක්ද, මොන සතුටක්ද ? දුක්ඛාදී අට තැන්හි උපදිනා සම්මෝහ (මෝහය සමග බැඳීම) යැයි කියන ලද අවිද්‍යා අන්ධකාරයෙන් වෙළුණා වූ තෙපි (ඒ මෝහාඳුර නසනු පිණිස මාර්ගඵල සංඛ්‍යාත) ප්‍රඥා නමැති ප්‍රදීපය නොසොයන්නහුද ?

ඒ ස්ත්‍රීන්ගේ සිත වෙනස් කරන්න, ලොව්තුරා බුදුන් වහන්සේ ඒ මොහොතේ සෘද්ධි ප්‍රාතිහාර්යක් පෑවා. දැන් කෙනෙකුට හිතෙන්න පුළුවන්, උන්වහන්සේ ඇයි එහෙම කළේ, උන්වහන්සේම ඔය සෘද්ධි ප්‍රාතිහාර්ය පෑම එපා කිව්වනෙ කියල. නමුත් සියල්ලෙන් සියල්ල දකින බුදුන් වහන්සේ ගන්න තීරණ ගැන අපට නිගමනය කරන්න බෑ, අපේ දැනුමෙන් මනින්න බෑ. ඒත් අනුමාන කරන්න පුළුවන් ඒක වරදින්නෙ නෑ කියල. ඒ වෙලාවෙ ඒ ස්ත්‍රීන් සියල්ලම මත් වෙලා හිටියෙ. අටුවාවෙ සඳහන් වෙන ආකාරයට ඒ ස්ත්‍රීන්ට මාර දෙව් දුවක් ආවේස වෙලා හිටියෙ. කරන කියන දේ නිච්චි නැතුව මනස විකෘති වෙලා හිටියෙ. රහ මෙර පානය කරල හිටපු නිසයි එහෙම වුණේ. ඉතින් කොච්චර වෙරි වෙලා බීල කෑ ගහන මනුස්සයෙක් වුනත්, ටිකක් සැර කරල බය කරන්න පුළුවන් කියල අදටත් අපට අත්දැකීම් තියෙනවා. ඒ වගේ, බුදුන්



වහන්සේ මේ ස්ත්‍රීන්ට පේන්න මහා අන්ධකාරයක් මැව්වා. ඒකට කොච්චර බය වුනාද කියනව නම්, ඒ අයගෙ වෙරි හිඳුන කියලයි සඳහන් වෙන්නෙ. ඒ වගේම තමයි යම් මෙරක් මහා පරිමාණයෙන් තියෙන කොට ඒකට කියනවා මහා මෙර කියල. චාතුර් මහා රාජිකය ආශ්‍රිතව තියෙන මහ මෙර කියන්නෙ ඒ වගේ තැනක්. ඒ කියන්නෙ පංච කාමයන්ගෙ මිහිරියාව. ඉතින් උන්වහන්සේ මහ මෙර කඳු මුදුනෙ ඉඳන් මේ දේශනාව කරන්නත් යම් කිසි හේතුවක් තියෙන්න ඇති. ඉර හඳ දෙකෙන් එළිය ලබන ලෝකවල මහා මිහිරියාව තියෙන තැන ඉඳන් නැවත ආලෝකයක් මවා පාලයි ධර්ම දේශනාව පටන් ගත්තෙ.

උන්වහන්සේ මුලින්ම ප්‍රශ්නයක් ඇහුවා. මේ රාග, ද්වේශ, මෝහ කියන මහා ගිනි ජාලාවෙන් දැවි දැවී ඇවිල ගෙන ඉඳලත් උඹල කොහොමද මේ හිනා වෙලා නට නටා සතුටින් ඉන්නෙ ? එහෙම සතුටක් සොම්නසක් උඹලට තියෙනවද?

කෙනෙක් රාගයෙන් බැඳිල ඉන්න වෙලාවක, ඒකට විරුද්ධව කවුරු හරි වැඩ කරන කොට, ඒක කඩල බිඳල දාන කොට මහත් වේදනාවක් එනවා. හරියට බඩ පපුව පිච්චිලා යනව වගේ. ඒක හරිම දැවිල්ලක්. ගින්නට පිච්චුනාම එන දැවිල්ල වගේ. මනසත් රාග ගින්නට හසුවුනාම ඔය වගේ දැවිල්ලෙන් පෙලෙනවා. මේ දැවිල්ල ලේසි පහසු එකක් නෙවෙයි. එහෙම වෙන්නෙ ඒ දැවිල්ලත් එක්ක ඊළඟට මනස ඇසුරු කරන දේ නිසා. මේ දෙවනියට ඇසුරු කරන දේට ද්වේශ කියල කියනවා. ඒක ලේසි පහසු ගින්නක් නෙවෙයි.

මම ඒක කොහොම හරි ලබා ගන්නවා කියල උත්සාහයෙන් වීර්යෙන් පටන් ගන්න වැඩපිළිවෙල ටිකෙන් ටික අසාධාරණය පැත්තට යොමු වෙන්න පුළුවන්. ඒ රාගයෙන් බැඳුන දේ ලබා ගන්න හෝ ඒ ලබා ගත්ත දේ ඒ විදිහට තමන් වසඟයේ තියා ගන්න හදනවා. ඒ අනුව ඒ බලාපොරොත්තු වුන දේට විරුද්ධ දෙයක් එන කොට, සමහරු කරගන්න දෙයක් නැතුව අඬනවා, වැළපෙනවා, හැපෙනවා. ඒ තමයි මනස දුර්වල අය. ඒ අඬන්නෙ, හැපෙන්නෙ කර කියාගන්න දෙයක් නැතිව, හිතෙන් සාප කර කර. ඒකත් අයිති වෙන්නෙ ද්වේශයට. තවත් සමහරු, ඒ කියන්නෙ ටිකක් බල පුළුවන්කාරයො නිකන් ඉන්නෙ නෑ. එහෙම කොහොමද අපේ ජීව ගෙනියන්නෙ, කඩල බිඳල දාන්නෙ, මම මිකුන්ට හොඳ වැඩක් කරන්නම් කියල කැති පොලු උස්ස ගෙන යනවා. මේකත් ද්වේශයක්. ඔය ක්‍රම දෙකෙන් මොන ක්‍රමය ගත්තත්, හිතට දැවිල්ලක් මිසක් සිසිලක් නෑ. ඉතින් ද්වේශ ගින්නෙන් තැවෙනවා, පෙලෙනවා.

මේ රාග ගින්න, ද්වේශ ගින්න කියන ගිනි දෙකම පත්තු කරගෙන තැවෙන්නෙ ඔය දෙකම හොඳයි කියල ගන්න තීරණය නිසා. මේ තීරණයට කියනවා මෝහය කියල. එතකොට ගන්න තීරණ වැහිල තියෙන්නෙ. ඉතින් නිවැරදි තීරණ පේන්නෙ නෑ. ඒ නිසා මෝහ ගින්නෙනුත් දැවෙනවා, තැවෙනවා. මේ රාග ගින්න, ද්වේශ ගින්න, මෝහ ගින්න නිසා, ගින්නෙන්ම හටගෙන ගින්නෙන්ම ජාතියක් උපද්දවනවා. ඒ තමයි අර අඬන වැළපෙන ජාතිය හෝ බල පුළුවන්කාරකම පෙන්වන ජාතිය. ඒ එක පැත්තක්.

අනෙක් පැත්ත තමයි, ☞

උපන් නිසා කෙනෙකුට විඳින්න තියෙන ගැහැට. ඒ කියන්නෙ විපාක දුක. කුසේ ඉන්න දවසෙ ඉඳන් කුස තුල විඳින දුක කියන්නෙ ඒ වගේ දෙයක්. ඒකත් දැවිල්ලක්, පෙලීමක්. දැන් කෙනෙකුට හිතෙන්න පුළුවන්, අපිට තේරෙන්නෙ නැනෙ, අපිට මතකවත් නැනෙ එහෙම දුකක් පෙළීමක් විඳපු බවක් කියල. අපට නොතේරුනාට ඒ මොහොතෙ අම්ම සැර කැම ජාතියක් කෑව නම්, අර කුසේ ඉන්න දරුව දඟලනවා, එහාට මෙහාට ඇඹරෙනවා. එහෙම දුකක්, වේදනාවක්, පෙළීමක් නොදැනෙනව නම්, ඇයි එහෙම ඒ දරුව දඟලන්නෙ? සමහර විට ඒ දරුවගෙ මරණය පවා සිද්ධ වෙන්න පුළුවන්. ඉපදුනා කියල ඒ දරුවට ගැලවීමකුත් නෑ. ලෙඩ වෙන්න පුළුවන්, මැසි මදුරුවන්ගෙන් පීඩන එල්ල වෙන්න පුළුවන්. කොටින්ම මොනම හෝ අනතුරක් කුමන හෝ මොහොතක එන්න පුළුවන්.

ඉතින් ජාතිය ගොඩ නගපු වෙලේ ඉඳන් පෙලෙනවා, විඳිනවා. ගින්නකින් වගේ දැවෙනවා, තැවෙනවා, ගැලවීමක් නෑ. ජාති ගින්නෙන් දැවෙනවා, තැවෙනවා. මේ හට ගත්ත ජාතිය නිකං තියෙන්නෙ නෑ. විවිධාකාර වෙනස් වීම්වලට බඳුන් වෙනවා. වැඩිවියට පත්වෙනවා, තරුණ වෙනවා. හැබැයි ඒ වෙනස් වීමට හරි කැමතියි, සතුටුයි. නමුත් ඒකත් තාවකාලිකයි. අඹ ගෙඩියක් ගැටය කාලෙ ඉඳන් පැහෙන තැනට ඇවිත් ඉදිල, ඊට පස්සෙ කුණු වෙන පැත්තට යනව වගේ, තරුණ විය දිගටම තියෙන්නෙ නෑ. ඒක උපරිමයකට ඇවිත් වැහැරෙන පැත්තට යනවා. දැන් කොණ්ඩෙ සුදු වෙනවා, හම රැළි වැටෙනවා, දකින කොටත් හිත පිච්චෙනවා. ඒකට විරුද්ධ දේවල් කරනවා. නැවතත් ගින්නකින් දැවෙන්න පටන් ගන්නවා. තමන් බලාපොරොත්තු නොවන වෙනසක්, තමන්ට කැමති විදිහට නැති වෙනස් වීමක්. ඒක දරා ගන්න බෑ. ඒකත් ගින්නක්. ඒකෙන් දැවෙන තැවෙන නිසා ජරා ගින්න කියල කියනවා.

ජාතිය, ජරාව.... ඊට පස්සෙ සියල්ලන්ටම උරුම වුන මරණය එන්නෙ. මරණය කිව්වම ජීවිතය නැති වීම එක කාරණයක්. ඒ වගේම දැන් තරුණ කෙනෙක් මහළු වෙනව කියන්නෙ, ඒ කෙනාගෙ තරුණකම ජරාවට මරණයට පත්වුනා කියන එක. කෙනෙක් තර්ක කරන්න පුළුවන්, මැරෙන කෙනාට ප්‍රශ්ණයක් නැනෙ, ඉන්න අයටනෙ දුක කියල. ඒකත් එක පැත්තක්. තමන්ගෙ ළඟම හිතවතෙක්, දරුවෙක්, බිරිඳ, සැමියා එහෙම මරණයට පත් වුනොත් මහ ගින්නක් පත්තු වුනා වගේ ජීවත් වෙලා ඉන්න කෙනාට තේරෙනවා. ඒ පැත්තෙන් බැලුවත් ගින්නක්. හැබැයි මැරිච්ච කෙනාගෙ මස් ලේ කය මැරුනට, එතනින් ගමන ඉවර නෑ. ගන්ධබ්බ ලෝකෙ ඉඳන් හරි තවත් කොහේ හරි තැනක ඉපදිලා හරි දුක් විඳිනවා. ඒ වගේම අර කලින් කිව්ව වගේ තරුණකම මරණයට පත් වුණාම මොකද වෙන්නෙ? ''අනේ මට මෙහෙම ශක්තියක් තිබුණා, මම මෙහෙම දිව්වා, පැන්නා, සින්දු කිව්වා, නැටුවා, කොණ්ඩෙ හොඳට කලුවට තිබුණා. ඒ එකක්වත් දැන් නෑ. හම රැලි වැටිල කොණ්ඩෙ සුදු වෙලා ජරා වෙලා.'' දැන් මෙහෙම දැවෙනවා, තැවෙනවා. අන්න ඒකත් ගින්නක්.

මේ කයෙන් ඉවත් වෙනකල්, ඒ කියන්නෙ ලෝක සම්මතයේ මරණය එන කල්, කෙනෙක් කී පාරක් නම් ඔය විදිහට හිතෙන් මැරි මැරී උපදිනව ඇත්ද ? ඒ මරණ මොහොත එනකොට කොච්චර ගින්නක් පීඩාවක් විඳිනව ඇත්ද ? රස්සාව කර කර හිටියා, එක පාරටම කියනවා උඹ රස්සාවෙන් අස් කළා කියල. අන්න රස්සාව මරණයට පත් වුණා. යමක් රස විඳ විඳ හිටියා, ඒක ඉවර වුණා. අන්න ඒ මොහොතෙ මරණයට පත් වුණා. ඉතින් ඒ හැම දේකින්ම එන්නෙ ගින්නක්, දැවිල්ලක්, පිච්චීමක්. ඒ නිසා මරණ ගින්නෙන් දැවෙනව කියල කියනවා. ඉතින් ඊළඟට එන ගිනි ටික, දුකේ එක එක කොටස් විදිහට බෙදල ඒ ඒ මොහොතෙ වේදනාව හැඟීම අනුව වෙන් කරල තියෙනවා. ඒ කොටස් තමයි ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස කියල වෙන් කරල තියෙන්නෙ. හරියට බැලුවොත්, ඕනම කෙනෙක් ඔය එකොලොස් ආකාරයකට දැවෙනවා, තැවෙනවා. සසර පුරාම ගමන් කරන්නෙ ඔය විදිහට තාවකාලික සුවයක් පතාගෙන දැවි දැවී තැවි තැවී. රාග ගින්නෙන්, ද්වේශ ගින්නෙන්, මෝහ ගින්නෙන්, ජාති ගින්නෙන්, ජරා ගින්නෙන්, මරණ ගින්නෙන්, ශෝක ගින්නෙන්, පරිදේව ගින්නෙන්, දුක්ඛ ගින්නෙන්, දෝමනස්ස ගින්නෙන් දැවෙනවා, තැවෙනවා.

ඒ නිසා තමයි සියල්ල සියලු ආකාරයෙන් දැක්ක ලොව්තුරා බුදුන් වහන්සේ, අර ස්ත්‍රීන් පන්සීයගෙන් ඇහුවෙ, මේ තරම් ගින්නකින් උඹල දැවෙනවා, තැවෙනවා, කොහොමද උඹල මේ නටන්නෙ සතුටින් ඉන්නෙ, ඒ ගිනි නිවන එක නෙවෙයිද සතුට සොම්නස කියල. ඇයි ඒක පෙනුනෙ නැත්තෙ? පේන්න නම් කෙනෙකුට ආලෝකයක් තියෙන්න ඕන. අඳුරකදි කිසිම දෙයක් පේන්නෙ නෑ. ඉතින් මේ ගිනි නොපෙනෙන අඳුරට කියනවා අවිද්‍යා අන්ධකාරය කියල. කොච්චර කිව්වත් පේන්නෙ නෑ. අන්න ඒ නිසයි බුදුන් වහන්සේ උපක්‍රමයක් විදිහට මුලින්ම අඳුරත්, ඉන් පසුව එලියත් පෙන්වන්න ප්‍රාතිහාර්ය පෑවෙ. ඒ ඒ අයගෙ මනසෙ ස්වභාවය අනුව උන්වහන්සේ ගන්න තීරණ අපට විවේචනය කරන්න බෑ. ඇයි එපා කියපු දෙයක් උන්වහන්සේම කරන්නෙ කියල අහන්න හැකියාවක් අනික් අයට නෑ. ඒ උන් වහන්සේට තියෙන මහා සර්වඥතා ඥානයට ඉහලින් ගිය කෙනෙක් නැති නිසා.

අවිද්‍යා අන්ධකාරය නසන්න නම් විද්‍යාවෙ ආලෝකය ලැබෙන්න ඕන. එහෙම නැත්නම් මෝහ අන්ධකාරය දුරලන්න ප්‍රඥාවෙ ආලෝකය දැල්වෙන්න ඕන. ප්‍රඥාවෙ ආලෝකය දැල්වෙන්න නම්, ඒ ප්‍රඥා ආලෝකය පෙන්වන්න පුළුවන් ආර්ය උතුමෙක්ගෙ සත් පුරුෂ ඇසුර ලැබෙන්න ඕන. උන් වහන්සේ එතනට පත්වුන හැටි සද්ධර්ම ශ්‍රවණය තුලින් අහගන්න ඕන. ඒ අහගන්න අතරෙ තමන් තුලින් නුවණින් හිතල බලන්න ඕන. හිතල බැලුවට මදි, ඒ මොහොතෙම ඒ ප්‍රතිපදා ක්‍රමයට බැහැල බලන්න ඕන, ඒක ක්‍රියාවට නගන්න ඕන. අන්න එතකොටයි කලින් මෝහ අන්ධකාරය හෙවත් අවිද්‍යා අන්ධකාරය නිසා නොදැක්ක යථා ස්වභාවය දකින්නෙ, පේන්න පටන් ගන්නෙ. ඒ දැක්ක දේ නිසා මූලික මාර්ගයට බහිනවා. ඒ බහින්නෙ නිකං නෙවෙයි, යම් කිසි බයක් ඇති වෙලා. හැබැයි ඒ මාර්ගයට බැස්සට, යන්න තැනක් පේන්නෙ නෑ. සුවය තියෙන අත පේන්නෙ නෑ. ගින්න දැක්කා, දැවීම දැක්කා. ඒත් නිවා ගන්න විදිහත් දකින්න ඕන.

තව තවත් ඒ ආර්ය ඇසුර තුල ඉන්න කොට, යන්න ඕන මාර්ගය කෙලවර, බහින්න ඕන තැන, විදිහ, නිවා ගන්න හැටි ප්‍රත්‍යක්ෂවම දකිනවා, දැනෙනවා. තීරණයක් ගන්නවා, ආ ... මෙන්න මෙහෙමයි මම නිවෙන්න ඕන කියල ගින්න දැක්කා, ගින්නට හේතුව දැක්කා, ඒක නිවා ගන්න විදිහ දැක්කා, ඒ විදිහ අනුගමනය කරල ඒ මොහොතෙ නිවා ගත්ත ටික දැක්කා. ඉතුරු ටිකත් නිවන හැටි දැන් දන්නවා. කාගෙන්වත් උදව්වක් ඕන නෑ. අර ක්‍රමයටම නිවාගෙන නිවාගෙන යනවා. අවසානයේ සියලු ගිනි නිවාගෙන සැනසෙනවා. එකොලොස් ගින්නෙන්ම මිදෙනවා.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු සමග ධම්ම පද පාලිය - ජරා වග්ගය ඇසුරින් සකස් කළේ :*

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# අබ්‍රහ්ම චරියා වේරමණී සික්ෂාවෙන් නිවන් දකින හැටි

(පසුගිය කලාපයෙන් - ක්ෂණය සහ අක්ෂණය....)

මෙම් දහම බඹසර රකින්නාටය කියල බුදුන් වහන්සේ දේශනා කරල තියෙනවා. ඒ බව පසුගිය කලාපයෙන් සඳහන් කළා. බොහෝ උපාසක උපාසිකා පිරිස් හිතාගෙන ඉන්නෙ, බඹසර රැකීම කියන්නෙ අඹු සැමියන් අතර ඇති කාම මෛථුනයෙන් වෙන්ව වාසය කිරීම කියල. කුමර බඹසර, කුමරි බඹසර කියල ආවාහ විවාහ වෙන්න කලින් ගත කරන බඹසර දිවියක් ගැන අපි අහල තියෙනවා. අවිවාහක දරුවන් අතර කාම මෛථුනයක් නෑ. ළමා වයසෙදි දරුවන්ට එහෙම අදහස් එන්නෙ නෑ. ඒ ගැන දන්නෙත් නෑ. එතකොට අද ලෝක සම්මතයේ කතා කරන විදිහට ලෝකෙ ඉන්න වැඩි ප්‍රමාණයක් ළදරු, ළමා වයසෙ දරු දැරියො බ්‍රහ්මචාරී කියලයි කියන්න වෙන්නෙ. නමුත් ඒක පිළිගන්න බෑ. ඒ නිසා කාම මෛථුනයෙන් වෙන්ව වාසය කිරීම බඹසර රැකීම වෙන්න බෑ. ඒක බඹසර රැකීමේ අංශු මාත්‍රයක් විතරයි. ශිෂ්ට සම්මත සමාජයේ යහපත් ගුණ දහම් පිරිහීම නිසා අද මේ දහම් අරුත් සැඟවිලා.

පිනට දහමට යොමු කරල, සුචරිත ගුණ දහම් පුරුදු කරල දරුවන් හදන වඩන දෙමව්පියො, තමන්ගෙ දරුව දිහා කාම චේතනාවක් ඇතුව කවුරුවත් බලනවටවත් කැමති නෑ. එහෙම ආරක්ෂා කරන දරුවෙක් ක්‍රමයෙන් වැඩෙන කොට, දෙමව්පියන්ගෙ අවසරයක් නැතිව කාම චේතනා ඇතිව, මොන විදිහකින් හෝ සම්බන්ධයක් ඇති කර ගැනීමට කටයුතු කිරීම බඹසර බිඳීමක්. නෙත් පැහැරීම, සූ.... සූ..... ශබ්ද නැගීම වගේ ඇහැට, කනට ස්පර්ශ වන ක්‍රියාවනුත් ස්පර්ශයට අයිතියි.

**උරුවම් බබා වත්**
**සී පද කියා ගෙන වත්**
**සිංදු කියමින් වත්**
**ගෙවල් අසලින් යාම නොහො බිත්**

මේ විදිහට සිරිත් මල් දම කියන ළමා ඔවදන් පොතේ තියෙන්නෙ, මේ බඹසර බිඳෙන කටයුතු කරන්න එපා කියන අවවාදය. උරුවම් බානවා කියන්නෙ කෙනෙක් මුලින්ම හුරු කර ගන්න දේ, හුරුවන ආකාරය. ඒ කියන්නෙ යම් කිසි කෙනෙක් හිතවත් කර ගන්න ඉස්සෙල්ලම සංඥාවක් දෙනවා. ඒ දෙන්නෙ හැම වෙලේම නරක පැත්තට. නරක අදහසක් දෙන්නෙ මොනව හරි නරක දේකට පොළඹවන්න. රහසිගත, නීච, වංචා සහගත මොනව හරි කාම අදහස්වලට තමයි ඒව කරන්නෙ. සල්ලාල වැඩ කියන්නෙත් ඒවට. සල කියන්නෙ සලා හරින දේවල්, පහත් දේවල්. ඒ සලා හරින දේවල්වලට ආලය කළාම සල්ලාල වෙනවා. ඉතින් මේ වගේ ආදර්ශ කතා, යහ ගුණ කියා දෙන පොත් පත් අද දරුවන්ගෙ ඇසුරට ලැබෙන්නෙ ඉතාම අඩුවෙන්.

කාම චේතනාවක් මුල් කරගෙන මොන විදිහකින් හෝ අයුතු කටයුත්තක යෙදෙන තැනැත්තා හෝ තැනැත්තිය, බයෙන් සැකෙන් ඒ දේ කරන්නෙ වරදක්



බව දන්න නිසා. ඒ විදියට සමාජ සම්මත යහ ගුණ කඩ කිළුටු නොකිරීම උතුම් ගුණයක්, සමගියට සමාදානයට රුකුළක්, බ්‍රහ්මචාරී ගුණයක්. කුමර කුමරි බඹසර රැකීම කියන්නෙ, තමන් රැක බලා ගන්නා දෙමව්පියන් හෝ වැඩිහිටි කවුරුන් හෝ වේවා, ඒ අයගෙ කැමැත්ත නැතිව කාම චේතනාවක් මුල් කර ගෙන, කුමන අන්දමක හෝ සම්බන්ධයක් ගොඩ නගා ගැනීමට අදාලව කටයුතු නොකර සිත, කය, වචනය සංවර කර ගැනීම. එතනදි වැටහෙනව බඹසර කියන්නෙ සිත, කය, වචනය සංවර කර ගැනීම මූලික වන කටයුත්තක් කියන එක.

ඒ වගේම පසුගිය කලාපයෙන් විස්තර කරපු අක්ඛණ සූත්‍රයෙන් "අසමයා බ්‍රහ්ම චරියා වාසාය...." ආදී වශයෙන් බඹසර වැසිය නොහැකි අවස්ථා අටක් තමයි විස්තර කළේ. පළවෙනි අක්ෂණය නිරයේ උපන් පුද්ගලයාට කියල පෙන්වනවා. නිරයේ විපාක දුක් විඳින්නාට කාම මෛථුන ක්‍රියාවකට අවකාශයක් නෑ. නිර්+අය තමයි නිරය කියන්නෙ. අය වීමක් නෑ. අය සංඛ්‍යාත හරවත් දෙයින් නික්මිලා ඉන්නෙ. එහෙම නැත්නම් නී + අරය - අරයක් නෑ, කොවුලක් නෑ. නිකං බොල් දෙයක්. ඒ නිසා වැඩක් ගන්න බෑ. එතකොට බඹසර රැකීම කියන්නෙ මෛථුනයෙන් වෙන්ව වාසය කිරීම නම්, නිරි සත්තු තමයි වැඩියෙන්ම බඹසර රකින අය වෙන්නෙ. එයිනුත් පැහැදිලි වෙනවා, මෛථුනයෙන් වෙන්වීම බඹසර රැකීම නොවන බව.

ඛීණා ජාති වුසිතං බ්‍රහ්ම චරියං... ආදී වශයෙන් ථේර ථේරි ගාථා බොහොමයක උදාන වාක්‍ය අතර "ජාතිය ක්ෂය විය, බඹසර වැස නිම වන ලදී, තවත් කළ යුතු කිසිත් නැතැයි දැන ගතිමි..." කියල සඳහන් වෙනවා. ඒ කියන්නෙ බ්‍රහ්ම චරියාවෙන් වාසය කරල අවසන් වුනාම අරිහත් ඵලය ලැබෙන්න ඕන. මෛථුනයෙන් වෙන්ව වාසය කිරීම බඹසර රැකීම නම්, ජීවිතාවසානය දක්වා කුමර කුමරි බඹසර රැක ගෙන අවිවාහකව ගත කළොත් නිවන් දකින්න පුළුවන් වෙන්න ඕන. නමුත් පෙර අත්බවයක අවුරුදු විසි දහසක් කුමරි බඹසර රැක ගෙන බුද්ධ උපස්ථාන කරමින් දිවි ගෙව්වත් සමණගුත්තා, භික්ඛුදාසිකා, ධම්මා, සුධම්මා, සංඝදාසිකා ... ආදී රජ කුමරියන් හත් දෙනා එදා නිවන් දැක්කෙ නෑ කියල දහමෙ සඳහන් වෙනවා. ඒ අය මේ ගෞතම බුද්ධ සාසනයෙදි පැවිදි වෙලා මගඵල ලැබූ බව ථේර ථේරි ගාථාවල සඳහන් වෙනවා. ඒ නිසා බඹසර රකිනව කියන්නෙ කාම මෛථුනයෙන් වෙන්ව වාසය කිරීමට වඩා ගැඹුරු කාරණයක් බව මේ කරුණුවලින් තේරුම් ගන්න ඕන.

මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා කියන ගුණ හතරට සිවු බඹ විහරණ (සතර බ්‍රහ්ම විහරණ) කියල කියනවා. කිසියම් කෙනෙක් තමන්ගෙ දරුවන්ට දක්වන ආකාරයෙන්ම, සියලු ලෝක සත්වයින්ටත් මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා ගුණ පතුරවන්න පුළුවන් නම් ඒ ගුණය විශේෂයි. ඒ තැනැත්තා හෝ තැනැත්තිය සියලු ලෝ සතුන්ට පියෙක් වගෙයි, මවක් වගෙයි. දරු, දෙමව්පියන් අතර කාම සම්බන්ධයක් නෑ වගේ, ලෝකයා කෙරෙහිත් කාම ☞

සම්බන්ධයක් නෑ. එතනට එන කොට තමයි ඒ ගුණ 4 වැඩෙන්නෙ. මේ ගුණයෙන් වාසය කිරීම කියන්නෙ ලෞකික වූ බ්‍රහ්ම චාරීව වාසය කිරීම.

සංයුක්ත නිකාය 5 (1) කාණ්ඩයේ 42 පිටුවේ එන බ්‍රහ්ම චරිය සූත්‍රයේ මෙහෙම සඳහන් වෙනවා. "මහණෙනි, තොපට බඹසරත් බඹසරෙහි ඵලත් දේශනා කරමි. එය අසවු. **මහණෙනි, බඹසර කවරේද යත්, මේ අරි අටඟි මග මැයි. ඒ කෙසේද? සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි... යි. මහණෙනි, බඹසර ඵල කවරේද යත්: සෝවාන් ඵල, සෙදගැමි ඵල, අනාගාමි ඵල, අරහත් ඵලයි. මොවුහු බඹසර ඵලයි**".

එතකොට මේ සූත්‍රයට අනුව බ්‍රහ්ම චරියාව කියන්නෙ අරි අටඟි මගේ හැසිරීම. විවාහ වෙලා අඹු සැමි වශයෙන් ගිහි ජීවිතය කාම භෝගීව ගත කළත්, ඒ අය මේ ලෝකය අනිච්චයි, දුක්ඛයි, අසාරයි කියල වටහ ගෙන දාන, සීල, භාවනා කටයුතු කරමින් ලෝකයා කෙරෙහි මවක් පියෙක් වගේ ආර්ය වූ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා ගුණයෙන් කටයුතු කරනව නම්, ඒ ආර්ය මෛත්‍රී ගුණයේ විපාකය, කාමයන් ඇසුරු කිරීමේ ගුණය අභිබවා යනවා. මෙත්තානිසංස සූත්‍රයේ මෙත් වැඩීමේ අනුසස් 11 ක් පෙන්වා තියෙනවා. 11 වෙනි ආනිසංසය විදිහට පෙන්වල තියෙන්නෙ, උත්තරීතර අරිහත්වය සාක්ෂාත් නොකළොත් මරණින් මතු බ්‍රහ්ම ලෝකයේ උපදිනව කියල. ඒ විදියට බ්‍රහ්ම ලෝකයේ උපදින අය නැවත කාම ලෝකයේ උප්පත්තියට එන්නෙ නැතිව, ඒ බ්‍රහ්මායුස ගෙවල කෙළවර එහිම පිරි නිවීම සිදු වෙයි කියන කාරණයත් වැදගත්. ආර්ය මෛත්‍රී ගුණය, කාම ගුණ අභිබවා යන බව එයින් පැහැදිලි වෙනවා.

ඊළඟට අංගුත්තර නිකායේ 5 වෙනි කාණ්ඩයේ 428 පිටුවේ එන **නවාංග උපෝසථ සූත්‍රයේ** සඳහන් වෙන අබ්‍රහ්ම චරියා වේරමණී සික්ෂා පදය පැහැදිලි කර ගන්න ඕන. ''ඒ අරිහතුන් වහන්සේ දිවි ඇති තාක් අබ්‍රහ්ම චරියාවෙන් වෙන්ව, අබ්‍රහ්ම චරියාව අතහැර, බ්‍රහ්මචාරී වූයේ, නීච වූ ග්‍රාම්‍ය වූ කාම මෛථුන ධර්මයන්ගෙන් වෙන්ව, උතුම් වූ බ්‍රහ්මචාරී ගුණයෙන් වාසය කරන්නේය. උන්වහන්සේ අනුගමනය කරන්නා වූ මමද, මේ රැයත් මේ දවාලත් අබ්‍රහ්ම චරියාවෙන් වෙන්ව, අබ්‍රහ්ම චරියාව අතහැර, බ්‍රහ්මචාරී වූයේ, නීච වූ ග්‍රාම්‍ය වූ කාම මෛථුන ධර්මයන්ගෙන් වෙන්ව, උතුම් වූ බ්‍රහ්මචාරී ගුණයෙන් වාසය කරමි. මේ මාගේ පෙහෙවස් විසීම තුන් වැනි සික්ෂා පදයෙන්ද සමන්වාගත වෙයි.''

එතකොට අරිහතුන් වහන්සේලා දිවි ඇති තාක් ආරක්ෂා කරන සික්ෂා පදයක් තමයි, සාමාන්‍ය උදවිය පෙහෙවස් සමාදන් වෙලා ආරක්ෂා කරන්න පොරොන්දු වෙන්නෙ. මේක හික්මීම පුරුදු පුහුණු වීමේ ක්‍රමයක්. රහතන් වහන්සේලා "විරතා මෙථුනා ගාමධම්මා..." ආදී වශයෙන් කියන, මෛථුනයෙන් වෙන් වෙනව විතරක් නෙවෙයි, නීච වූ ග්‍රාම්‍ය වූ කාම ධර්මයන්ගෙනුත් වෙන් වෙනවා. මේ සික්ෂා පදයේ කාම මෛථුනයෙන් වෙන් වෙන්න කලින් කරන තවත් වැඩ කොටසක් කියවෙනවා. (1) අබ්‍රහ්ම චරියාවෙන් වෙන්ව (2) අබ්‍රහ්ම චරියාව අතහැර (3) බ්‍රහ්මචාරී වූයේ.



බුද්ධ දේශනාවෙ නිතරම අනුපිළිවෙලක් තියෙනවා. ඒ නිසා මැද්දෙන් පැනල අල්ල ගත්තට හරි යන්නෙ නෑ. බුද්ධක නිකායේ 1 වෙනි කාණ්ඩයේ 229 පිටුවේ එන උපෝසථ සූත්‍රයේ මේ කාරණය බුදු මුවින්ම දේශනා කරල තියෙනවා. "මහණෙනි, මහ මුහුද යම් සේ පිළිවෙලින් නිම්න වූයේ, එක එල්ලේම බෑවුම් නැත්තේ වේද, එසේම මහණෙනි, මේ සස්නෙහි අනුපූර්ව ශික්ෂා, අනුපූර්ව ක්‍රියා, අනුපූර්ව ප්‍රතිපදා වේ. පිළිවෙල ඉක්ම එක්වනම රහත් බව පැමිණීම නොවේ..."

ශ්‍රද්ධා අධික, වීර්ය අධික, ප්‍රඥා අධික කියන පුද්ගලයින් තුන් දෙනා අතරින් ශ්‍රද්ධා අධිකයාට දාන කතා, සීල කතා, සග්ග කතා, ආදීනව කතා, නෙක්ඛම්ම කතා කියල කතා 5 ක් පූර්ණ වෙන විදිහට දේශනා කරන්න ඕන. වීර්ය අධික කෙනෙක් නම් ඒ පුද්ගලයාට සුදුසු තැනකින් පටන් ගන්න ඕන. ප්‍රඥාව අධික කෙනාට ප්‍රඥාව මුල් කරල එන දෙයකින් දේශනාව පටන් ගන්න ඕන. එතකොට දාරුචේරිය කියන්නෙ පෙර සසරෙ පූර්ණ කරල තිබ්බ්ච ප්‍රඥා අධික පාරමිතාවක් පුරපු කෙනෙක් නිසා, එහෙම අනුපූර්ව ක්‍රමයක් අවශ්‍ය වුනේ නෑ. ඒක බොහොම අති දුර්ලභ දෙයක් නිසා, පොදුවේ හැමෝටම එහෙම වෙන්නෙ නෑ. ඒ නිසා මේ අනුපිළිවෙල අවශ්‍යයි.

ඉතින් අනුපිළිවෙලට දේශනා කරපු දේ, මැද ඉඳන් ආරම්භ කළාට හරියන්නෙ නෑ. මිච්ඡා දිට්ඨි, මිච්ඡා සංකප්ප, මිච්ඡා වාචා, මිච්ඡා කම්මන්ත, මිච්ඡා ආජීව, මිච්ඡා වායාම, මිච්ඡා සති, මිච්ඡා සමාධි යම් කෙනෙක් තුළ තියෙනව නම් ඒක අබ්‍රහ්ම චරියාව. ''දන් දීමේ විපාක නැත, යැදීමේ විපාක නැත, පිදීමේ විපාක නැත, යහපත් අයහපත් කර්මවලට සැප දුක් වශයෙන් කර්මයෙහි ඵල විපාක නැත, මෙලොව අයට පරලොවක් නැත, පරලොව අයට මෙලොවක් නැත, මව කියා සැළකිය යුතු විශේෂ ගුණයක් නැත, පියා කියා සැළකිය යුතු විශේෂ ගුණයක් නැත, ඕපපාතිකව උපදනා සත්වයෝ නැත, විශිෂ්ට ඥානයෙන් මෙලොව පරලොව දැනගෙන වසන මහණ බමුණන් නැත.'' මේ කියන දස වස්තුක වැරදි දැක්ම තමයි මිච්ඡා දිට්ඨිය කියන්නෙ. මේ දැක්මෙන් හිතන, කියන, කරන වැඩ පිළිවෙල හොඳයි කියල, ඒ මග ගැනීම මිථ්‍යා දෘෂ්ටික වැඩ පිළිවෙලක්. ඒක අබ්‍රහ්ම චරියාවට අයිතියි.

එතකොට දස වස්තුක වැරදි දැක්මෙන් වෙන්වීම තමයි ලෞකික සම්මා දිට්ඨිය කියන්නෙ. ඒ කියන්නෙ දන් දීමේ විපාක නැත, යැදීමේ විපාක නැත..... ආදී වශයෙන් මුලින් පෙන්වපු වැරදි දැකීම් දහයෙන් පෙන්වන, "නැත" කියන දේවල්, "ඇත" කියල පිළි ගැනීම. ඒ පිළිගැනීම තුළ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා..... ආදී වශයෙන් හිතන, කියන, කරන වැඩ පිළිවෙල තමයි ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය කියන්නෙ.

එතකොට මේ කියන අරි අටඟි මග දෙආකාරයි. මෙතනදි ලෞකික වූ සුගතියට හේතුවන අරි අටඟි මග තමයි අබ්‍රහ්ම චරියාවෙන් වෙන් වීම කියල පෙන්නුවෙ. එහෙනම් බුදුන් වහන්සේ දේශනා කරපු ලෝකෝත්තර අරි අටඟි මග වැඩීමෙන් (බඹසර රැකීමෙන්) සතර මග ඵල ලැබෙන්න ඕන. මග ඵල ලබන්න නම් සිවු අරිසස් දකින්න ඕන. සිවු අරිසස් දකින්න නම්, දහම් අනු දහම් පටිපදාවේ යෙදිල, කළණ මිතුරෙක් මුණ ගැහිල, යෝනිසෝ මනසිකාරයෙන් යුක්තව, සද්ධර්ම ශ්‍රවණය කරන්න ඕන.

සිවු අරිසස් දැකීමෙන් ලෝකය අනිච්ච, දුක්ඛ, අසාර බව වටහා ගෙන, ඒ වැටහීමෙන් හිතන, කියන, කරන වැඩ පිළිවෙලට ආර්ය වූ අරි අටඟි මග වැඩීම කියල කියනවා. තවත් විස්තර කියනව නම් සම්මා දිට්ඨියට පත්වෙලා, සම්මා සංකප්ප... ආදී අරි අටඟි මග වඩනවා. මේ පිළිබඳව හෙළ බොදු පියුම 16 වෙනි කලාපයේ "අරුත් සැඟව ගිය අරි අටඟි මග... " කියන ලිපියෙන් වැඩි විස්තර ඉදිරිපත් කරල තියෙනවා.

අබ්‍රහ්ම චරියාවෙන් වෙන්ව, අබ්‍රහ්ම චරියාව අතහැර, බ්‍රහ්මචාරී වූ යම් කෙනෙක් මේ සික්ෂා පදය සමාදන් වෙලා, ඒ සමාදන් වූ කාල සීමාව තුල දැන දැන කාම මෛථුනයේ යෙදීමෙන් වෙන් වෙන්න ඕන. එතකොට ''විරතා මෙථුනා ගාම ධම්මා..." ආදී වශයෙන් කියන නීච වූ ග්‍රාම්‍ය වූ කාම ක්‍රියා මෛථුනය විතරක් නෙවෙයි, ඇස, කන, නාසය ... ආදී අනෙක් ඉඳුරනුත් සංවර වෙන්න ඕන. අංගුත්තර නිකායේ 4 වෙනි කාණ්ඩයේ 363 වෙනි පිටුවේ එන, සත්ත මෙථුන සූත්‍රයේ බ්‍රහ්ම චරියාගේ ජිද්‍ර (සිදුරු සහිත), ශබල (දුබල වෙලා දිරල ගිහින් බලයක් නැති), කල්මාෂ (හැම තැනම කැළැල් ඇති) මොනවද කියල විස්තර කරනවා. (සිදුරු සහිත, පැල්ලම් සහිත ආදී වශයෙන් සික්ෂාව අපිරිසිඳු වීම.)

1. ද්වයං ද්වයං සමාපත්තියට නොපැමිණුනත් ස්ත්‍රිය/ පුරුෂයා විසින් ඇඟ ඉලුම්, පිරිමැදීම් ඉවසා ආස්වාද ලැබීම

ද්වයං ද්වයං සමාපත්තිය කියන්නෙ, ස්ත්‍රී පුරුෂ දෙන්නෙක් එකතු වීමත් සමග ඇති වන්නා වූ අවිද්‍යා සමාධියක්. ඒවායින් ඇහැට රූප, කනට ශබ්ද, නාසයට ගන්ධ, දිවට රස, කයට පොට්ඨබ්බ ආදී වශයෙන් යම් කිසි කාම අරමුණක් මුල් කර ගෙන සමාපත්තියක් ඇති වෙනවා. හැබැයි මේ කාරණය තවත් ගැඹුරින් සියුම් විදිහට බැලුවොත්, දෙන්නෙක් කිව්වම පුද්ගලයින් දෙන්නෙක් විතරක්ම නෙවෙයි, වෙනත් කාම වස්තුවක් සමග සම්බන්ධයක් ඇති කර ගැනීමත් අයිති වෙනවා. එතකොට එහෙම බාහිර අරමුණක් සම්බන්ධ කර ගන්නෙ නැතිව ඇති වන නියම සමාපත්තිය තමයි ඒතං සන්තං ඒතං පණීතං..... කියල විස්තර වෙන්නෙ. ඒ තමයි ආර්ය සමාපත්තිය. ඒවාට ලෝකෙන් අරමුණු ගන්නෙ නෑ. ඒ නිසා ද්වයං වෙන්නෙ නෑ.

2. ද්වයං ද්වයං සමාපත්තියට නොපැමිණියද, පිරිමැදීම් ආදිය නොඉවසුවද ස්ත්‍රිය/ පුරුෂයා හා සිනා සෙයි, කථා කරයි, ක්‍රීඩා කරයි, මහ සිනා සෙයි. (මේ කියන්නෙ මේවායින් ආස්වාද විඳීම ගැන. එහෙම නැතිව අවශ්‍යතාවයකට කථා කිරීම, කථා කිරීමෙන් ආස්වාද විඳීමක් නෙවෙයි)

3. ද්වයං ද්වයං සමාපත්තියට නොපැමිණුනත්, පිරිමැදීම් ආදිය නොඉවසුවද, ක්‍රීඩා, මහ සිනා, කථා ආදිය නොඉවසුවද ස්ත්‍රියගේ / පුරුෂයාගේ ඇස තම ඇසින් බලයි, දකියි.

4. ඒ කිසිත් නොකළ ද බිතින් (බිත්තිවලින්) පිටත් හි හෝ පවුරින් පිටත්හි හෝ සෙන්නා වූ (ඇසෙන්නා වූ), බණින්නා වූ (බලන්නා වූ) හෝ ගයන්නා වූ හෝ හඬන්නා වූ මාගමයේ (ස්ත්‍රියගේ) / පුරුෂයාගේ ශබ්දය අසයි.

මේ කාරණය තවත් ගැඹුරින් සියුම් විදිහට ගත්තොත්, බලනවයි කිව්වම ඇස් දෙකෙන් බලනවට අමතරව කෙනෙක්ගෙ රූපය හිතින් මවල බැලීමත්, අහනවයි කිව්වම කතා හඬ කනින් ඇසීම හෝ අහපු හඬක් නැවත සිහි කිරීමත් අයිති වෙනවා. ඒ වගේ දේවල්වලින් කාම රංගනයන් පිළිබඳ ගන්නා සියල්ලම මේ කාරණයට අයිති වෙනවා.

වර්තමානයේ නම් දුරකථන, අන්තර්ජාල හරහා සන්නිවේදන ඇසීම් දැකීම්වලින් ආස්වාද විඳීම මේ ගොඩට අයිතියි. අංගුලිමාල පිරිත දේශනා කරන්න හේතු වුනේ, පිඬු පිණිස වැඩිය නිවස තුළ අඬන, දුක් විඳින කාන්තාවකගෙ හඬ ඇසීම. ඒ ඇසීමෙන් අංගුලිමාල මහ රහතන් වහන්සේට ඇති වුනේ, ඒ කායික වේදනාවෙන් මුදවන්න ඇත්නම් කියන දයානුකම්පාව. ඒ අනුව මේ කියන අවස්ථාවලදී ඒ ඒ ක්‍රියාවලින් ආස්වාද විඳීමෙනුයි සික්ෂා පදය සිදුරු වෙන්නෙ, පළුදු වෙන්නෙ කියල තේරුම් ගන්න ඕන.

5. ඉහත දැක්වූ කිසිවක් නොඉවසුවද පෙර ස්ත්‍රියක/පුරුෂයකු සමග වූ හසිත (හිතවත්කම) , ලපිත (ලයාන්විත බව), කිළිතයන් (ඒ නිසා හට ගන්නා කිළිටි කෙළෙස්) අනුස්මරණය කරයි.

6. ඉහත දැක්වූ කිසිවක් නොඉවසුවද පස්කම් ගුණෙන් සමර්පිත වූ, සමන්වාගත වූ පරිචරණය කරන ගැහැවියකු හෝ ගැහැවි පුතකු හෝ දකියි.

ඒ කියන්නෙ යම් කිසි විදිහකින් තමන් බලපොරොත්තුවක් නැති වුනත්, ස්ත්‍රී පුරුෂයන්ගේ හැසිරීමක් දකිනවා. හිතල මතල බලන්නෙ නැතිව දකිනවා. අන්න ඒ දකින කොට ඇති වන හැඟීමක් තියේ නම්, ඒ කාරණය නිසා බ්‍රහ්ම චරියාව කිළිටි වෙනව කියලයි මේ කියන්නෙ.

7. ඉහත දැක්වූ කිසිවක් නොඉවසුවද "මම මේ සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තවුස් දමින් හෝ බඹසරින් ප්‍රකට දෙවියෙක් හෝ අප්‍රකට දෙවියෙක් හෝ වෙමි" යි අන්‍ය වූ දේව නිකායක් පතා එහි ආස්වාද විඳියි, එය පතයි.

මේ බ්‍රහ්ම චාරියාගේ ජිද්‍රය, ශබලය, කල් මාෂය. මේ බ්‍රහ්ම චරිය අපිරිසිදුය. ජාති, ජරා, මරණ ...... උපායාසයන්ගෙන් නොමිදේ. වර්ත දුක්ඛයෙන් (සසර දුකින්) නොමිදේ.

බඹසර රකිනව කියන්නෙ අරි අටඟි මග වැඩීම නම්, ආර්ය සම්මා දිට්ඨියට පත් වූ කෙනෙක් කැමැත්තෙන් බැඳුණු බැමිවලින් මිදිල (පටි විරති) ඉන්න නිසා, කැමැත්තෙන් බැඳීමෙන් සත්තු මරන්නෙ නෑ, සොරකම් කරන්නෙ නෑ, බොරු, කේළම්, පරුස වචන, හිස් වචන කියන්නෙ නෑ. කාම මිථ්‍යා චාරයේ හැසිරෙන්නෙ නෑ. ආර්ය සම්මා සතිය පිහිටුවා ගෙන කටයුතු කරන නිසා, ඒ ඒ අරමුණු එන කොටම අකුසලයෙන් වෙන් වෙලා කටයුතු කරනවා. අකුසලයෙන් වෙන් වෙනව කියන්නෙ, කුසල් සම්පාදනය කරනවා. කුසලස්ස උපසම්පදා වෙන කොට ඒක සිද්ධ වෙන්නෙ සති ඉන්ද්‍රිය බලවත් වෙලා, "සචිත්ත පරියෝ දපනං..." කියන ඉන්ද්‍රිය දමනය කර ගැනීමෙන්. මේ විදියට බුද්ධානුසාසනාව ඉටු කිරීමෙන් අරිහත්වයට පත් වෙනවා.


මෙච්චර ගැඹුරු අර්ථ තියෙන අබ්‍රහ්ම චරියා වේරමණී සික්ෂා පදයේ තේරුම, කාම මෛථුනයෙන් වෙන්ව වාසය කිරීම කියල සීමා කිරීමෙන්, නිවන සොයා ගිය උවසු උවැසියන් කොච්චර නම් අසරණව ඇත්ද ? ඒ වගේ වැරදි වැටහීම් ඇති සියලු දෙනාට ධර්මාවබෝධය වේවා ! මේ එකම සික්ෂා පදයෙන් වුනත් සම්මා සතිය පිහිටුවා ගැනීමෙන්, ඒ වගේ අරමුණු එන හැම විටම සිහි ඇතිව ඒවායින් වෙන් වෙලා උතුම් නිවන සාක්ෂාත් කර ගන්න පුළුවන්.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු සහ අංගුත්තර නිකාය 4 වෙනි කාණ්ඩයේ එන සත්ත මෙථුන සූත්‍රය ඇසුරින් සකස් කළේ,*

**ඩබ්. ඒ. තිළිණවතී**
**විශ්‍රාමික මහජන බැංකු නිලධාරිනී**
**කඩවත**

**අභයරතනාලංකාරය - 45**

# සසර භයානකත්වය කියා පාමින් අභයරතනාලංකාර හිමියන් පෙර ඇත්බැව්වල සතර අපාගත වූ හැටි හෙළි කරයි.



*(පසුගිය කලාපයෙන් - උපකාරයට කෘතෝපකාර නොකිරීමේ බරපතලකම පෙන්වා දුන් කතා වස්තුවක් ...)*

**- වහරක අභයරතනාලංකාර හිමි**

දුර්ලභ වූ මනුස්ස අත්භවයක් ලබා සිටියදී මනුස්සයින් විසින් කරන කියන දස අකුසල් නිසා මරණින් මතු සසර අපාගතවීම් පිළිබඳව අභයරතනාලංකාර හිමියන්ගේ අත්දැකීම් සහිතව අභයරතනාලංකාරය තුළින් සහ මේ සඟරාවෙ තවත් බොහොමයක් ලිපිවලින් නිරන්තරයෙන් කරුණු ඉදිරිපත් කළා. ඒ අතර සමාජයේ බාහිර ලෞකික වූ සීලයක් රැකගෙන නම්බුකාර විදිහට ජීවත් වෙච්ච අය සතර අපාගත වූ අවස්ථා ගැනත් හේතු සහිතව කරුණු ඉදිරිපත් කළා. දැන් මෙහෙම කරුණු කාරණා අත්දැකීම් සහිතව ඉදිරිපත් කරන කොට සමහරෙක් හිතන්න පුළුවන්, උන් වහන්සේ අනුන්ගෙ සතර අපාගතවීම් ගැන කියල, තමන්ගෙ හැකියාවන් විතරක් කියනව කියල. නමුත් එහෙම හිතන අයට ඒ ගැන සැකයක් තියේ නම් දුරුවෙන්න, උන් වහන්සේත් පෙර අත්බැව්වල කරපු කියපු දස අකුසල් නිසා සතර අපාගත වෙච්ච අවස්ථා තමයි දැන් මේ හෙළිදරව් කරන්නෙ. මේ සංසාරයේ තියෙන භයානකත්වය පෙන්වන්නමයි මේ කරුණු මේ විදිහට හෙළිදරව් කරන්නෙ.

පෙර බුදුවරයන් වහන්සේලා වැඩ ඉන්න කාලවලදි, උන් වහන්සේ ගත කරපු විවිධ අත්බැව් ගැන තවත් සුවිශේෂීය කරුණු කාරණා මේ වෙන කොට උන් වහන්සේ විසින් හෙළිදරව් කරල තිබුනත්, තවමත් සුදුසු කාලය එළඹ නැති නිසා, ඒවා සුදුසු කාලයක් එළඹුන විට පසුව ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. මේ ලිපියෙන් හෙළිදරව් කරන සතර අපාගත වීම් ගැන ඇහුවම, සමහර විට උන් වහන්සේගෙන් බණ අහපු කෙනෙක් පුදුම වෙන්නත් පුළුවන්. මොකද මේ වෙන කොට සැඟව ගිය මහා ධර්මස්කන්ධයක් නැවත මතු කරමින් සිටින උන් වහන්සේත්, මීට ඉහත අත්බැව් කිහිපයකට පෙර මේ විදිහට සතර අපාගත වෙලා තියෙනවද කියල. නමුත් මේ සංසාරයේ තියෙන භයානකත්වයත් ඒකමයි. මේ සඟරාවෙ පසුගිය කලාපවල පළවෙච්ච දහම් කරුණුවලින් ඒ කාරණය දැනටමත් පැහැදිලි කරල තියෙනවා.

ලොව්තුරා බුදු වෙන්න පාරමිතා පුරන බෝසතාණන් වහන්සේ නමක්, නියත විවරණ ගත්තට පස්සෙ උපදින්නෙ නැති ස්ථාන ගැන සඳහන් කරන කොට, තිරිසන් වුනත් වටුවෙකුට වඩා කුඩා සතෙක් වෙලා හෝ ඇතෙකුට වඩා විසාල සතෙක් වෙලා හෝ උපදින්නෙ නෑ කියල ධර්මයේ පෙන්වා තියෙනවා. ඒ කියන්නෙ නියත විවරණ ගත්තට පස්සෙත් තිරිසන් අපායෙ උපදින්න පුළුවන්. සිදුහත් බෝසතාණන් වහන්සේත් එහෙම ඉපදිච්ච අවස්ථා ඕන තරම් ධර්මයේ විස්තර කරල තියෙනවා. එතකොට මහ බෝසතාණන් වහන්සේ නමකටත් එහෙම නම්, අනික් අය ගැන කවර කතාද ? ඒ නිසා දැන් මොනවා කිව්වත් කළත්, පෙර එහෙම දුක්ඛිත සතර අපාගත අත්බැව් ගත කරල තමයි මේ හැමෝම අද මේ තත්ත්වයට ඇවිත් ඉන්නෙ. නිවන් දකින දහමක් අහල අවබෝධ කර ගන්න කල්ම ඒ අවධානම මේ හැම කෙනෙකුටම තියෙනවා. ඒ විදිහට සතර අපාගත වෙච්ච අවස්ථාවලින් අභයරතනාලංකාර හිමියන්ගෙ ජාති ස්මරණ ඥානයට හසු වෙච්ච අවස්ථාවන් කිහිපයක් ගැන තමයි මේ හෙළිදරව් කරන්නෙ.

සතර අපාය කිව්වම නිරය, අසුර, ප්‍රේත, තිරිසන් කියන අවස්ථා 4 තමයි අයිති වෙන්නෙ. මේ කියන තිරිසන් අපායෙ වැටිල මම දුක් විඳපු අවස්ථා 2 ක් ගැන ජාති ස්මරණ ඥානයෙන් මීට අවුරුදු ගණනාවකට උඩදි මට දැන ගන්න ලැබුණා. ඒ කියන්නෙ එදා වෙච්ච සිද්ධි අනුපිළිවෙලින් ඇදිල ආපු අවස්ථාවක්. ජාති ස්මරණ ඥානයෙන් ජාතිය / උප්පත්තිය මෙනෙහි කිරීමක් තමයි කරන්නෙ. ඒ නිසා ඒක හිතන කොටම වැටහෙනවා. ගිහි කාලෙ මම පටිභාන කවි උපයෝගී කර ගෙන පවත්වපු විශේෂ බෝධි පූජා ක්‍රමයක් තිබුණා. ඒ විදිහට පවත්වපු බෝධි පූජා 84 කින් පළවෙනි පූජාවෙදි තමයි මේ සිද්ධිය කවියට නැගිල ආවෙ. පොල්ගහවෙල උඩපණලිය ගෝඨාභය රජමහා විහාරයෙදි තමයි ඒ බෝධි පූජාව පැවැත්වුණේ. ඒ පළවෙනි බෝධි පූජාව ''අවසර පටිය'' කියල එදා පටිගත කරලත් තිබුණා. ඒ කියන්නෙ සියල්ලටම ප්‍රථම බුද්ධ, ධම්ම, සංඝ කියන ත්‍රිවිධ රත්නයෙන් අවසර ලබා ගෙන, මේ සාසන කටයුතු ඉදිරියට කර ගෙන යන්න ආශිර්වාදය ඉල්ලපු පළමු බෝධි පූජාව. එදා මතකයට නැගිල ආපු ඒ සිද්ධි තවමත් මතකයේ තියෙනවා. ඒ මතකයෙන් තමයි දැන් මේ කරුණු කාරණා කියන්නෙ.

මේ සතර අපාගතවීම්වලින් එකක් තමයි මී හරක් කියන තිරිසන් ජාතියේ ඉපදිලා දුක් විදීම. ඒකටත් එක්තරා හේතුවක් තිබුණා. ඒ කියන්නෙ මීට අවුරුදු 2700 කට පමණ පෙර මම එක්තරා ඍද්ධි බල ලාභී යෝගියෙක් වෙලා හිටියා. මේ කියන්නෙ ගෞතම බුදුන් වහන්සේ පහළ වෙන්නත් පෙර වෙච්ච සිද්ධියක්. ඉතින් එහෙම කාලය ගත කරන කොට මී හරකෙක් හා සම්බන්ධ සංඛාරයක් වඩල තිබුණා. ඒ කරපු කියපු ක්‍රියාව නම් මොකක්ද කියල මට හරියටම වැටෙන්නෙ නෑ. නමුත් මී හරකෙකුට අදාල සිද්ධියක් මුල් කර ගෙන ඇති වෙච්ච නීචකමක් තමයි ඒ සතර අපාගත වීමට මුල් වෙලා තිබුණෙ. කොහොම හරි ඒ වඩපු තිරිසන් සංඛාරය නිසා අර තිබ්ච්ච ඍද්ධි බල, දැහැන් ඔක්කොම පිරිහුණා. යෝගියෙක් වෙලා වඩා ගත්තු ඒ ශක්තීන් පිරිහුණා. ඊට පස්සෙ මැරිල චුති පටිසන්ධි වෙලා මී හරකෙක් විදිහට උප්පත්තිය ලැබුවා. එක අවස්ථාවක් විතරක් නෙවෙයි, එතැන් පටන් පිට පිටම මී හරක් අත්බැව් ☞


4 ක් ලැබුවා. ඒ කියන්නෙ මී හරක් භවය තුල චුති පටිසන්ධි නොවී, මස් ලේ කයින් මැරී මැරී මී හරකෙක් විදිහට අවස්ථා 4 ක ඉපදුණා.

එයින් 4 වෙනි මී හරක් අත්බැව ගෞතම බුදුන් වහන්සේ පහළ වුනාට පස්සෙ, උන් වහන්සේ ජීවමානව වැඩ ඉන්න කාලෙ සිද්ධ වෙච්ච දෙයක්. ඒ කියන්නෙ උන් වහන්සේගෙ බුද්ධත්වයේ ආරම්භ කාලය. ඒ අන්තිම මී හරක් අත්බැවේ එක්තරා විශේෂ සිද්ධියක් වුණා. මේ මී හරක දිග අං තියෙන සුදු පාටට හුරු ලෝම තියෙන සතෙක්. දවසක් මේ මී හරක එක්තරා අඩි පාරක් තිබ්ච්ච ගොයම් කමතක් වගේ තැනක හිටියා. ඔහොම ඉන්න කොට ළමයි 7 - 8 දෙනෙක් විතර මේ මී හරකගෙ අංවල එල්ලිලා ඔන්චිලි පදිනවා, තව කොටසක් බඩ යටින් රිංගනවා. ඒත් ඌ සැර නෑ, අනින්නෙ නෑ, ඔහේ නිකං බලාගෙන ඉන්නවා, ඒ තරම් හීලෑයි.

ඔය ස්ථානයෙන් ඒ මොහොතෙ ගෞතම බුදුන් වහන්සේ හුදකලාව වැඩම කරන අවස්ථාවක් ආවා. ඒ වෙන කොට මේ ළමයි, මේ මී හරක හරියට සෙල්ලම් බඩුවක් වගෙයි කිය කියා අර විදිහට අංවල එල්ලිලා ඔන්චිලි පැද පැද සෙල්ලම් කර කර හිටියෙ. එතකොට උන් වහන්සේ මේ කාරණය දැකල ඒ දරුවන්ට අවවාදයක් කරල කිව්වා, දරුවනේ මේ සෙල්ලම් කෙනෙක් නෙවෙයි, අනාගතයෙදි මේ සාසනය පිරිහිලා යන කාලයක නගා සිටුවන්න මෙන්න මෙහෙම කෙනෙක් වෙනව කියල. ඉතින් එහෙම කියල උන් වහන්සේ එක්තරා විස්තරයක් සහිත දේශනාවක් කළා. ඒ හිටපු ළමයින්ටත් යමක් කමක් තේරුම් ගිය නිසා ඒ බුද්ධ වචනයට ගරු කළා. මොකද ළමයින්ට වුනත් තේරුම් යන්න කියල අධිෂ්ඨාන කරල කිව්වම ඒක වැටහෙනවා. ළමයි පොඩි වුනයි කියල ගානක් නෑ. මොකද අවුරුදු හතේ ළමයි අරිහත්වයටත් පත් වෙලා තියෙනවා.

දැන් බුදුන් වහන්සේගෙ මේ හඬ අර තිරිසන් සතාට වුනත් ඇහුණා. මොකද හැඟීම් භාෂාවෙන් තමයි උන් වහන්සේ ඒ දේශනාව කළේ. ඒ හඬ ඇහිල ඇති වෙච්ච සංවේගය නිසා ඒ මී හරකගෙ ඇස්වලින් කඳුළුත් ආවා. ඒ ඇති වෙච්ච චිත්ත ප්‍රසාදය නිසා ඒ මී හරක මැරිල චුත වෙලා එතනින් පස්සෙ නැවතත් මනුස්සයෙක් විදිහට ඉපදුණා. එහෙම ඉපදිලා අර ඇතිවෙච්ච චිත්ත ප්‍රසාදය නිසා අවුරුදු 28 දි විතර නැවතත් උන් වහන්සේගෙම ඇසුරට ඇවිත් බණත් ඇහුවා. මොකද උන් වහන්සේගෙ සාසන සේවය අවුරුදු 45 ක්. ඒ අතර තුර තමයි මේ සිද්ධිය වුණේ. හැබැයි බණ ඇහුවට ධර්මය අවබෝධ වුණේ නෑ. මොකද පෙර කාලෙ ඉඳන් ආපු ප්‍රාර්ථනාවක් වුනේ, සාසනය පිරිහිලා යන කාලයක නගා සිටුවන්න අවස්ථාවක් ලැබෙන්න කියල.

දැන් ඉතින් කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන්, තිරිසන් සතෙකුට ඔය කියන දේවල් තේරුම් ගන්න පුළුවන්ද කියල. මේ වගේ අවස්ථා ගැන මීට පෙරත් මේ සඟරාවෙන් විග්‍රහ කරල තිබුණා. සතුන්ට හැඟීම් ඇති වෙන හැටි, වැටහෙන හැටි, මනුස්සයො වෙලා ඉඳෙද්දි කරපු කියපු දේවල් මතක් වෙන හැටි මීට පෙරත් ඉදිරිපත් කළා. ඒ නිසා සතෙකුට අමතක නෑ. එදා මතකය අදත් මතක් කළොත් මතකයි. ඒක ජාති ස්මරණ ඥානයට සම්බන්ධයි. මේ ජාති ස්මරණ ඥානය කියන එක මනුස්සයින්ට විතරක් නෙවෙයි, සමහර තිරිසන් සතුන්ටත් පිහිටනවා.



ඉතින් මී හරකෙක් වෙලා බුදුන් වහන්සේ මුණ ගැහුනයි කිව්වම සමහරු ඔකට හිනා වෙන්න, අපහාස උපහාස කරන්න පුළුවන්. නමුත් මට ඒක ගැටළුවක් නෙවෙයි. ඕන කෙනෙකුට ඕන දෙයක් කියන්න පුළුවන්. නමුත් ජාති ස්මරණ ඥානයට හසු වෙච්ච ඒ සිද්ධිය, මගේ අත්දැකීම තමයි මම මේ ප්‍රකාශ කරන්නෙ. එතකොට මේක නම්බුකාරකමකට කියනව නෙවෙයි. මොකද රජ කෙනෙක් හෝ සිටු කෙනෙක් වෙලා බුදුන් වහන්සේ මුණ ගැහුනයි කිව්ව නම්, ලොකු කමකට කියනව කියල කෙනෙකුට තර්ක කරන්න පුළුවන්. නමුත් මී හරක කියන තිරිසනෙක් වෙලා බුදුන් වහන්සේ මුණ ගැහුනයි කිව්වම මොන නම්බුවක්ද? ඉතින් **මේ සංසාරයේ තියෙන මහා භයානකත්වය පෙන්වන්න මට හංගන්න දෙයක් නෑ. අනිත් අයගෙ දැන ගැනීම පිණිස කවුරු අපහාස උපහාස කළත් මම ඒ අත්දැකීම කියනවා. ඒක ඕන කෙනෙකුට පිළිගන්න හෝ නොපිළිගන්න අයිතිය තියෙනවා.**

එතකොට එදා ධ්‍යාන අභිඥා තිබ්ච්ච යෝගිවරයෙක් වෙලා ඉඳල, ඒ විදිහට ඒ ශක්තිය පිරිහිලා සතර අපාගත වෙන්න තවත් විශේෂ හේතුවක් තිබුණා. මොකද බුද්ධාන්තර ගණනාවක පටන්ම මගේ පැතුම වුනේ, කවදා හරි බුද්ධ සාසනයක් පිරිහිලා යන කාලයක නගා සිටුවන්න අවස්ථාව ලැබේවා කියල. ඉතින් බැරි වෙලාවත් එදා ඒ ශක්තිය පිරිහෙන්නෙ නැතිව තිබිල ඒ යෝගිවරයා ඒ තත්ත්වයෙන් මළා නම්, අද මේ විදිහට මනුස්සයෙක් වෙලා උපදින්න ලැබෙන්නෙ නෑ, අද මේ දහම දේශනා කරන්න ලැබෙන්නෙත් නෑ. එහෙනම් ඒ ශක්තියෙන් බඹ ලොව කල්ප ගණන් ආයුෂ ඇතිව ඉපදිලා අදත් බඹ ලොව ඉන්නවා. ඉතින් කොහොම හරි ඒ ප්‍රාර්ථනාව ඉෂ්ට වෙන්න පෙර ඉඳලම හේතු සකස් වෙලා තිබ්ච්ච නිසා, ඒ ධ්‍යාන ශක්තිය පිරිහිලා ගිහින් සතර අපාගත වෙලා මේ කාලයට මනුස්සයෙක් වශයෙන් ඉපදීම ධර්මානුකූලවම සිද්ධ වුණා.

දැන් මේ විදිහට අනාගතයේ සිද්ධ වෙන දේවල් ගැන බුදුන් වහන්සේ කරපු අනාගත දේශනා බොහොමයක් අද ත්‍රිපිටකයේ නෑ. ඒ සූත්‍ර දේශනා 700 ක විතර ප්‍රමාණයක් අද වෙන කොට හලල හෝ හැලිල තියෙන්නෙ. ඒ වගේ උන් වහන්සේ කරපු මේ කෙටි දේශනාවත් සමහර විට කොහේ හරි තියෙන්න ඇති. මොකද අවුරුදු 45 ක දේශනා කැටි කරල තිබ්ච්ච එකක් තමයි මුල් කාලීන ත්‍රිපිටකය කියන්නෙ. නමුත් ඒ බොහොමයක් සූත්‍ර අද නෑ. විශේෂයෙන් අනාගත වංශ දේශනා තියෙන සූත්‍ර බොහොමයක් අඩුයි. ඒකටත් විවිධ හේතු තියෙනවා. සමහරවිට ඒ ඒ කාල සීමාවන්වලදි බෝසත්වරු හෝ ශ්‍රාවක පාරමිතා පුරන පිරිස් හෝ මේ මේ විදිහට පහළ වෙනව කියල ප්‍රකාශ කරල තිබුනම, මාන්නක්කාර අයට මේ දේශනා අඩංගු පොතක් එහෙම අහු වුනොත් ඒ කොටස් හංගන්න බලනවා. ඒව ඉතින් ඒ කාලෙ පුස්කොළ පොත්වල ලියල තිබුණෙ. අද වගේ හැම තැනම සිය දහස් ගණන් පොත් තිබුණෙ නෑ. අස්ගිරියයි, මහා විහාරයයි වගේ බොහොම සීමිත ස්ථාන කිහිපයක තමයි ඒ වගේ පොත් තිබුනෙ. ඒ තැන්වලට ගිහින් තමයි ඒ කාලෙ ඒවා ඉගෙන ගත්තෙ.

ඔය අතර අද කාලෙ සමහර මාන්නක්කාර අය වගේ බුදු බව පතනවා, මෙහෙම කෙනෙක් වෙනවා... ආදී වශයෙන් කියන කවුරු හරි හිටිය නම්, අර දේශනා කොටස් තියෙන පත් ඉරු ගලවල ඉවත් කරන්න පුළුවන්. මේ වගේ කාලයක මෙහෙම කෙනෙක් පහළ වෙනවා, මෙහෙම කරනවා, ඒ පුද්ගලයගෙ ලක්ෂණ මෙහෙමයි.... ආදී වශයෙන් කරුණු පෙන්වල තිබුණම, අර වගේ අයට ඒක දරාගන්න බැරිව යනවා. මොකද ඇත්තටම ඒ වගේ අවංක පැතුමක් නෙවෙයි හුඟක් අයට තියෙන්නෙ. ඒකෙන් කියන්නෙ නෑ අවංකවම එහෙම පැතුම් පතන අය නෑ කියල. එහෙම අයත් සමාජයේ ඉන්නවා. නමුත් අද වුනත් බොහොමයක් අය ලාභ, කීර්ති, ප්‍රසංසාවලට ඒ වගේ පැතුම් පතනවා. ඒ නිසා අර වගේ දෙයක් දැක්කම වසන් කරන්න බලනවා. ඒ වගේම එදා තිබ්බ්ච නම් ගොත් ආදිය ඒ තිබ්බ්ච තත්ත්වයෙන් වෙනස් කරල විවිධ ඉතිහාස කතාවලට පරිවර්තනය කරල රජවරුන්ටත් ආදේශ කරල තියෙනවා. ඒව ඉතින් බොහෝ කොටම විදෙස් ආක්‍රමණික-යන්ගෙ වැඩ. මොකද ඒ අයට ඕන වුනේ බුදු දහම යටපත් කරන්න. එදා ඉඳන් පැවතුනා කියල අපි අද භාවිතා කරන්නෙ බොහෝ කොටම ඒ පසු කාලීනව ලියපු පොත් පත්.

ඉතින් කොහොමහරි මේ විදිහට ගිහින් විවිධ හේතු නිසා, දැන් තියෙන ත්‍රිපිටකයේ හුඟක් සූත්‍ර කොටස් අඩුයි කියන කාරණය ඔප්පු වෙන තැනක් මේ මෑත කාලයේ මට අත්දකින්න ලැබුණා. දවසක් මහ රෑ මම භාවනා කරමින් ඉන්න කොට එක්තරා සූත්‍ර දේශනාවක් සමාධියට ඇදිල ආවා. කවුරුවත් නැති, බොහොම නිදහස් රාත්‍රියක, නිදා ගත්තට පස්සෙ නැවත නැගිටින්න යන අතර වගේ වෙලාවක තමයි ඒක ඇදිල ආවෙ. ඒතං භගවතා භාරානසියං ඉසිපතනේ මිගදායේ .... කියල තමයි ඒ සූත්‍රය පටන් ගන්නෙ. ඒ ගැන අදටත් පටිසම්භිදා මග්ගප්‍රකරණයේ තියෙනවා. හැබැයි පටිසම්භිදා මග්ගප්‍රකරණයේ වුනත් මෙහෙම සූත්‍රයක මෙහෙම කියල තියෙනව කියල පොඩි සටහනක් තිබුණට විස්තරයක් නෑ. ඒ සූත්‍රයේ නමක්වත් නෑ. ඒ හැර වෙන කිසිම පොතක ඒ සූත්‍රය ගැන සටහනක්වත් දකින්න ලැබිල නෑ. ත්‍රිපිටකයෙත් නෑ.

ඉතින් ඔය සූත්‍රය දවසක් රාත්‍රී කාලයේ ඉවර වෙනකල්ම මගේ කටින් කියවුණා. කියවිලා ඉවර වෙනකල්ම මමවත් දන්නෙ නෑ. සම්පූර්ණ සූත්‍රයම සද්දෙට ගෙතිල ආවා. පාලි සූත්‍රයමයි ඇදිල ආවෙ. නමුත් මම පාළි දැන ගෙන හිටියෙ නෑ. සමාධියට ආවා. මීට කලින් අහපු නැති දෙයක් ගලාගෙන ආවා. ඒක විනාඩි 45 ක් විතර දිග සූත්‍රයක්. මම මගදි නතර කරන්න හැදුවත් බැරි වුණා. සූත්‍රය ඉවර වෙනකල්ම කිය වුණා. ඒ සූත්‍රයෙන් කියවෙච්ච විස්තරයට අනුව, මේ මහා භද්‍ර කල්පයේ ඊළඟට පහළ වෙන මෛත්‍රී බුදුන් වහන්සේගෙ විස්තරයකුත්, ඊළඟට පහළ වෙන තවත් කල්ප 2 ක නම් යෙදෙන හැටිත්, ඒ කල්පවල පහළ වන බුදුවරුන්ගෙ නම් ආදී සියල්ලමත් තිබුණා. ඒ කියන්නෙ මේ මහා භද්‍ර කල්පයට පස්සෙ එන කල්ප 2 කට කියන නම්, ඒ පළවෙනි කල්පයෙදි පහළ වෙන බුදුවරු දෙනමක් සහ ඊළඟ කල්පයෙදි පහළ වෙන තවත් බුදුවරු දෙනමක් ගැනත් විස්තර ආවා.

අපි දැන් මේ ඉන්නෙ බුදුවරු පස් නමක් පහළ වෙන මහා භද්‍ර කල්පයේ. ඒ තමයි වැඩිම බුදුවරු ගණනක් පහළ වෙන කල්පය. ඒ වගේ කල්පයක් ඉතාමත් කලාතුරකින් තමයි පහළ වෙන්නෙ. ඒ බුදුවරු පස් නමෙන් දැනටමත් හතර නමක් පහළ වෙලා අවසන්. ඊළඟට මෛත්‍රී බුදුන්



වහන්සේ තමයි පහළ වෙන්නෙ. ඊට පස්සෙ ලෝක විනාසයක් සිද්ධ වෙලා, හේතු තියෙන සත්ත්වයින් සියලු දෙනාම ආභස්සර බඹ ලොව උපදිනවා. නියත මිථ්‍යා දෘෂ්ටියෙන් වැඩ කරපු අය විතරක් මහා අන්ධකාරය තියෙන ලෝකාන්තරික නරකයේ උපදිනවා. ආභස්සර බඹ ලොව ඉපදුනු අය නැවතත් ක්‍රමයෙන් මනුස්සයින් විදිහට පරිවර්තනය වෙලා අලුත් ලෝකයක් හට ගන්නවා. අන්න ඒ කල්පයට බුදුවරු දෙනමක් පහළ වෙනවා. ඊළඟට ඒ ලෝකයත් අර විදිහටම විනාස වෙලා, නියත මිථ්‍යා දෘෂ්ටි ගතිකයින් ලෝකාන්තරික නරකයෙත්, අනෙක් සත්වයින් ආභස්සර බඹ ලොවත් ඉපදිලා නැවතත් ක්‍රමයෙන් පල්ලම් බැහැල, මනුස්සයින් සහිත අලුත් ලෝකයක් බිහි වෙනවා. එතනින් පටන් ගන්න කල්පයෙත් බුදුවරු දෙනමක් පහළ වෙනවා. මේ ආදී වශයෙන් අනාගතයේ සිද්ධ වෙන දේවල් ගැනත් ඒ දේශනාවෙන් කියවුණා. ඒ සූත්‍ර දේශනාවත් බරණැස ඉසිපතනාරාමයෙදිම තමයි දේශනා කරල තිබුණෙ. දැන් ඒ සූත්‍රය පොත්පත්වල කොහේවත් දකින්න නෑ. හැබැයි සූත්‍රය පටන් ගන්නෙ ඔය කියපු විදිහට. ඒ සූත්‍රය සම්පූර්ණයෙන්ම කෙස් ගහටම කිසිම ඇද පළුද්දක් නැතිව මට ඇදිල ආවා. ඒ බව මට දැනුණා. හැබැයි එක වතාවයි ආවෙ.

ඒ වගේම මේ කියන කාරණය මීට අවුරුදු 50 කට පමණ පෙර වැඩ හිටපු පොල්අත්තේ බුද්ධදත්ත හාමුදුරුවන්ගෙ පොතකත් සඳහන් වෙලා තියෙනවා. ඒ කියන්නෙ, මෙන්න මේ වගේ සූත්‍රයක් තියෙනවා, ඒක ත්‍රිපිටකයෙන් හැලිල හේතුව මොකද දන්නෙ නෑ, අටුවාවෙ තිබුණට පෙළ දහමෙ නෑ කියල සටහන් කරල තිබුණා. සංඝායනා ගත අටුවාවෙ තිබුණත්, ඇයි පෙළ දහමෙ නැත්තෙ කියන තර්කය තමයි උන් වහන්සේ මතු කරල තිබුණෙ. මුල් ත්‍රිපිටකයෙ තිබ්බ්ච සූත්‍ර බොහොමයක් මේ වෙන කොටත් ඉවත් වෙලා තියෙන බවට සාක්ෂියක් තමයි ඒ.

දැන් එතකොට මේ සතර අපාගත වෙච්ච සිද්ධියෙන් පස්සෙ මනුස්සයෙක් වෙලා ඉඳල, තවත් අත්බැව් කිහිපයකට පස්සෙ ඊටත් වඩා භයානක අවස්ථාවකට මම මුහුණ දුන්නා. ඒ කියන්නෙ කරපු අකුසලයක විපාකයක් හැටියට බුරන්න බැරි බල්ලෙක් වෙලා ඉපදුණා. මේ සිද්ධිය වුණේ දැනට අවුරුදු 700 කට විතර එහා. මී හරක් අත්බැව් 4 ක් ලබල, තවත් මනුස්ස අත්බැව් කිහිපයක් ලබල, ඒ මනුස්ස වෙච්ච එක අත්බැවක කරපු අකුසල කර්මයක් තමයි ඒකට හේතු වුණේ. දැනෙන විදිහට ඒ සිද්ධිය සිද්ධ වෙලා තියෙන්නෙ මිහින්තලය ආශ්‍රිත ප්‍රදේශයක. ඒ කාලෙ ඒ ප්‍රදේශයේ දිවැස් තියෙන හාමුදුරු නමක් දහම් දේශනා කළා. සංඥාවට දැනෙන විදිහට උන් වහන්සේ රහතන් වහන්සේ නමක් වෙන්න ඕන. යම් කිසි අසපුවක තමයි උන් වහන්සේ වැඩ හිටියෙ. සපු කියන්නෙ සර්පයාට. සර්පයා උපමා කරන්නෙ ද්වේශයට. සපු නැති තැන අසපු. ඒ කියන්නෙ ද්වේශය නැති තැන තමයි අසපු වෙන්නෙ. නමුත් අද සමහරු අසපුවලට බැණ බැණ ඉන්නවා. ඒත් ඉස්සර ඉඳන් භික්ෂූන් වහන්සේලා වැඩ හිටපු තැනක් තමයි මේ අසපුව කියන්නෙ. ආශ්‍රමය කියන්නෙ සංස්කෘත භාෂාවෙන්, අසපු කියන්නෙ හෙළ භාෂාවෙන්. ඒ නිසා ඒක නිග්‍රහයට ලක් කරන්න සුදුසු වචනයක් ☞

නෙවෙයි.

මමත් ඉතින් මේ කියන ගම් ප්‍රදේශයේ මනුස්සයෙක් විදිහට ඉපදිලා මේ කියන හාමුදුරුවන් ඇසුරේ නිතර හිටපු කෙනෙක්. දවසක් උන් වහන්සේ බණ කියන කොට, ඔය බුදු හඬ නෙවෙයි බලු හඬ වගෙයි කියල මම උන් වහන්සේට දොස් කිව්වා, නීච කළා, ඒ ධර්ම දේශනාව විවේචනය කළා, ඒ දේශනාව දෙවෙනි කළා. හැබැයි ඒක නොදනුවත් කමින් කිව්ව නෙවෙයි, දැන ගෙනත් ඒ කාලෙ තිබිච්ච මාන්නයෙන් අහංකාරකමට කියපු දෙයක්. ඉතින් ඊට පස්සෙ ඒ තත්ත්වයෙන් ඉඳල මැරිල ගිහින් චුති පටිසන්ධි වෙලා, කට හඬ නැති බුරන්න බැරි බල්ලෙක් වෙලා ඉපදුණා. හැබැයි ඉපදුනේ ඒ ගුරු හාමුදුරුවො ඇසුරේ, ඒ අසපුව ආශ්‍රිතවමයි. උන් වහන්සේගෙ දිවැසට මේ කාරණය ගෝචර වුණා. උන් වහන්සේ දැන ගත්තා, එදා අර කරපු නිග්‍රහයට විපාක වශයෙන් අහවලා අද මෙහෙම බල්ලෙක් විදිහට අත්බැව් ලබල, කට හඬ එන්නෙ නැතිව ඉන්නව කියන කාරණය. මොකද හේතුවට අනුකූලයි ඵලය. බලු හඬ නගනව කියල ඒ උත්තම දහමට නිගරු කරපු නිසා තමයි බල්ලෙක් වෙලත් කට හඬ නැති වුණේ. ඌට බුරන්න බැරි හේතුව මොකක්ද කියල ආවර්ජනය කරන කොට තමයි උන් වහන්සේගෙ දිවැසට මේ කාරණය ගෝචර වුනේ.

ඉතින් මේ කාරණය දැන ගෙන දවසක් උන් වහන්සේ මේ බල්ලගෙ ඔළුව අත ගාල කිව්වා, උඹට ආයෙ කවදාවත් ඔය වගේ දෙයක් වෙන්න එපා කියල. ඒකත් නිකම්ම කිව්ව වෙන්න බෑ. අනුකම්පා-වෙන්, යමක් දැන ගෙනමයි එහෙම කියන්න ඇත්තෙ. ඔළුව අත ගාල ඒ කියපු හඬ ඇහිල බල්ලට වුනත් ඒ වෙලාවෙ සංවේගයක් ඇති වුණා, චිත්ත ප්‍රසාදයක් මතු වුණා. ඒ විදිහට ඔළුව අතගාල කියපු ප්‍රකාශය විශේෂත්වයක් වුණා. මොකද කන්න ටිකක් දුන්නම, ඔළුව අත ගෑවම තිරිසනෙකුට ඒක මතක තියෙනවා. ඉතින් අර වගේ උත්තමයෙක් අනුකම්පාවෙන් එහෙම ආශිර්වාද කළාම, තිරිසන් ගතව ඉන්න කොටත් ඒකෙන් චිත්ත ප්‍රසාදය මතු වුණා. ඒ ඇති වෙච්ච චිත්ත ප්‍රසාදය නිසාම ඒ බලු අත්බැවෙන් මැරිල ගිහින් චුති පටිසන්ධි වෙලා, ඊළඟට නැවතත් මනුස්සයෙක් වෙලා උපන්නා. උන් වහන්සේ කිව්ව වගේම එතනින් පස්සෙ මම තිරිසන් ගත වුනේ නෑ, සතර අපාගත වුනේ නෑ, ඒ බලු අත්බවය තමයි මගේ අන්තිම සතර අපාගත අත්බවය. එතනින් පස්සෙ දිගටම මනුස්ස අත්බැව් තමයි ලැබුවෙ. එහෙම ගිහින් මීට අත්බැව් 4 කට උඩදි තවත් භික්ෂූන් වහන්සේ නමකගෙන් බණ අහල තමයි දහම් අවබෝධය ලැබුවෙ. ඒ කියන්නෙ දැන් ඉන්න මනුස්ස අත්බවයත් එක්ක අත්බැව් 4 කට උඩදි.

එතකොට අර කලින් සඳහන් කරපු ඒ භික්ෂූන් වහන්සේ, රහතන් වහන්සේ නමක් කියල සංඥාවට වැටෙන්න තවත් හේතුවක් තියෙනවා. මොකද එදා මම මනුස්ස වෙලා උන් වහන්සේට නිග්‍රහ කරද්දි, උන් වහන්සේට දිවැස් බල තිබිලත් මොකුත් නොකිය නිහඬව හිටියා. උන් වහන්සේගෙ තිබිච්ච ඒ ශක්තිය නිසාම තමයි ඒ විදිහට නිහඬව හිටියෙ. එහෙම නැතිව ඒකට ප්‍රතිචාර දක්වන්න, කලබල වෙන්න ගියේ නෑ. ඒ තමයි නිවිච්ච උතුමන්ගෙ ගුණවල හැටි.

ඉතින් එදා මනුස්ස වෙලා ඉඳෙද්දි තිබිච්ච මාන්නක්කාරකම, අහංකාර ගතිය නිසා ඒ ප්‍රකාශයේ තිබිච්ච බරපතලකම එදා තේරුනේ නෑ. මොකද මනුස්සයෙකුට තියෙන හැකියාව නිසා, සම්පත්තිය නිසා ඒකෙන් උද්දාම වුනාම ගුණ ධර්ම අමතක වෙනවා. ඊළඟට තිරිසනෙක් වුනාට පස්සෙ එන්නෙ විපාකය. දැන් ඉතින් කලින් වගේ උද්දාම වෙන්න හැකියාවක් නෑ. ඒ වගේ අවස්ථාවක කවුරුහරි කන්න ටිකක් දුන්නම, ඔළුව අත ගෑවම ඒ සතාට චිත්ත ප්‍රසාදයක් ඇති වෙනවා. ගුණ වඩපු කෙනෙක් නම් ඒක විශේෂයක් වෙනවා. එතකොට ඒ සතා, ඒකෙන් ඇති වන චිත්ත ප්‍රසාදය නිසා එතනින් චුත වෙලා උපදින්නෙ ඒ ගුණය මුල් කර ගෙන. පෙර සසරෙ කරපු පිනක් කුසලයක් තිබුණ නම්, අනන්තර - සමනන්තර ප්‍රත්‍යය අනුව ඒ දෙක එකට එකතු වෙලා මනුස්ස වෙලා උපදින්න හේතු යෙදෙනවා.

සටහන

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# නිවනට මග....

සිත කය වදන රැක අකුසලයට පිටුපා
ගත යුතු හරි මගට සිත දහමට ගළපා
නැත ගැලවුමක් පස්කම් සැපතට අතපා
දත යුතු කුමට මිනිසුනි කුණු කය සතපා

උපතයි මරණයයි එකටයි ගෙනාවේ
ලෙඩ වෙයි මහළු වෙයි එපරිදි වුනාවේ
එය වෙයි ලොව දහම දත යුතු මනාවේ
නතු වෙයි මරුට කවුරුද හැම දෙනාවේ

ලොව පොදු දහම සැම දෙය අනියත බවය
නිවනට මෙහා නැත හිමි සතහට සුවය
පව පින දත යුතුය නිම කෙරුමට භවය
සුව සෙත සදනු බැරි කෙනෙකුගෙ පෙර පවය

විඳවන ගැහැට හිරි හැර නිති දෙවේලේ
වළකන ලෙසිනි හිමි තිලකුණු වදාළේ
විඳසුන කියා වැඩුවත් රැය දවාලේ
වැඩි දෙන දහම නොම දැන යති අයාලේ

දෙලොවම දිනන මග බුදු හිමි දෙසූ මගය
සදහම ඉගෙන එම මග යන අය හිඟය
ගුණ දම සමග බුදු දම පිරිහෙන වගය
නිය දම දනුව - නොසිතනු නිවනද ළඟය

දුක නැති කරන මග නම් අරි අටඟි මග
එක වෙයි ''හරි දැක්ම'' එය ගමනකිය දිග
රැක ගත් විට මනස එහෙ මෙහෙ දුවන දඟ
සැකයක් නැත නිවන දවසක දකින වග

පබැඳුම : පානදුරේ එස්.ඒ.එස්. පෙරේරා


# ඕසෝන් ස්ථරය ඇතුළු සොබා දහමේ පැවැත්මට ලෝ වැසියන්ගේ ගති ගුණ බලපාන හැටි

*(පසුගිය කලාපයෙන් - රාජ්‍ය නායකයන්ගේ පහළ වීම දහම් ඇසින්...)*

අද වෙන කොට මුළු මහත් ලෝකයේම අවධානයට ලක්වෙලා තියෙන ඕසෝන් ස්ථරය ඇතුළු සොබා දහමේ විනාසයට මනුස්සයින්ගෙ ගති දූෂ්‍ය වීමත්, ඒවායේ යහ පැවැත්මට මනුස්සයින්ගෙ ගති ගුණ වැඩීමත්, එයින් රටට ලෝකයට වන බලපෑමත් සම්බන්ධයෙන් වැදගත් ධර්ම විග්‍රහයක් තමයි මේ පෙන්වා දෙන්න උත්සාහ කරන්නෙ. ඊට පෙර මේ කියන ඕසෝන් ස්ථරය නිර්මාණය වීමේ හේතු ඵලය දැන ගැනීම වැදගත්. ලෝකයේ බිහිවෙන බුදු, පසේ බුදු, මහ රහත්, ඍෂිවරු ආදී, ලොව සත්‍යය යථාර්ථය දත් ශ්‍රමණ බ්‍රාහ්මණ උත්තමයන් වහන්සේලා විසින් ලෝකයාට වැදගත් ගුණ ධර්ම කියල කොටසක් පෙන්වා දෙනවා. ඒ කියන්නෙ ලෝකයේ යථාර්ථය පෙන්වා දීල, මනුස්සයින් ඇතුළු සත්වයින්ට කරුණාව රැකවරණය දීල, එකිනෙකා සාමයෙන් සමාදානයෙන් සහයෝගයෙන් කටයුතු කරල, ලෝකයේ සශ්‍රීකත්වය රැකෙන ආකාරයේ ගති ලක්‍ෂණවලින් යුත් ගුණ දහම් තමයි ඒ විදියට පෙන්වා දෙන්නෙ. ලෝකයාට මෙත් වඩනවයි කියන්නෙත් ඒ වගේ දෙයක්. එතකොට සාමාන්‍ය මිනිස්සුත් ඒ ආකාරයේ ගුණ දහම් දැන ගෙන, ඒක හරි වැදගත් දෙයක් කියල ඒ ගුණ දහම් තේරුම් ගත් අය ගුණ වඩල ක්‍රියාවට නගන්න පටන් ගන්නවා.

මේ විදියට වඩන ගුණ දහම් නිසා ඇතිවන ශක්තියෙන් ලෝක සත්වයාට විශේෂ ආරක්ෂාවක් සැපයෙනවා. ඒ ගති ගුණවලින් එන හේතුවේ ඵලයක් වශයෙන් තමයි මේ කියන ඕසෝන් ස්ථරය හටගන්නෙ. ''ඕ'' කියන්නෙ ආරම්භ වෙනවා. ඕං කියන්නෙත් යමක් ආරම්භ කරන කොට. ''සෝ'' කියන්නෙ සුව සහගත, යහපතට හේතුවන. ''අන්'' කියන්නෙ ආහාරය. ඕ + සෝ + අන් තමයි ඕසෝන් වුණේ. ඒ කියන්නෙ සත්වයින්ගෙ පෝෂණයට හෙවත් සුවයට හේතු වන්නා වූ ආහාරය පටන් ගන්න තැන, සුවය ආරම්භ වීමට ආහාර වන ස්ථානය. මේ කියන ඕසෝන් ස්ථරයටම තමයි අපේ පැරැන්නන් වේරම්භ වාතය කියල කිව්වෙත්. එතැන තියෙන්නෙ ආරම්භ වේරම්භ කියන ක්‍රියාවලියේ ගති දෙකක්. වේරම්භයට යනවයි කියන්නෙ වැය වෙනවා කියන එක. එතැනට ගියාම ආහාරය බිහිවීමේ ක්‍රියාවලිය වැය වෙලා ඉවර වෙනවා. ඉවර වෙනවත් එක්කම නැවත ආරම්භ වෙනවා. ඒ ආරම්භ වීමත් සමගින් එන වර්ෂාවත් එක්ක ඖෂධීය ශක්තිය හෙවත් ස්වභාවික පොහොර කියන රසායනික සංයුතිය මිශ්‍ර වෙලා පොලවට ඇද හැලෙනවා. ඒ තමයි ගස් කොළන් ආදියේ නැවත ආරම්භය.

එතකොට වේරම්භයට ගිහින් තමයි එතැන ඉඳන් ආරම්භය පටන් ගන්නෙ. ආරම්භ වෙච්ච හේතුවෙන් අන්තිමට ලබන ඵලය තමයි, මනුස්සයින් ඇතුළු සත්වයින් කන බොන ආහාරයේ සශ්‍රීක ඵලදාව. ඵලදාව ආවට පස්සෙ ඒක




කාල බීල එතැන් පටන් ආපසු වේරම්භය පටන් ගන්නවා. ආරම්භයේ අවසානය තමයි එතැන. ඉන්පසු එතැනින් පටන් ගත් එක නැවතත් ගිහින් කාබන්ඩයොක්සයිඩ්, දූවිලි අංශු ආදිය බවට පත් වෙලා කෙලින්ම ඉහලට බිඳි බිඳී ගිහින් ඕසෝන් ස්ථරයට එනකල්ම යනවා. මේ ඕසෝන් ස්ථරය කියන තැනට ගියාම තමයි වේරම්භයට ගියා කියන්නෙ. වේරම්භ වාතය කිව්වෙත් ඒකයි. ''වේ'' කියන්නෙ වැය වෙච්ච දේ. ''රා'' කියන්නෙ ක්‍රියාකාරීත්වය, ඒක කොතැනකවත් නවතින්නෙ නෑ. ''අම්භ'' කියන්නෙ ආරම්භ වෙනවා. එතකොට වේරම්භ කියන්නෙ, වැය වෙච්ච දේ නැවත ක්‍රියාත්මක කරන්න ආරම්භ වෙනවා කියන එක. ප්‍රිය මනාප දේ බිහිවීමේ ආරම්භය.

තවත් විදිහකට පහදනව නම් පැහෙනවා, ඉද්ද වෙනවා කියල වචන 2 ක් භාවිතාවේ තියෙනවා. ඉද්ද කියන්නෙ නැවතුනා කියන එක. පැහෙනවා කියන්නෙ ඊට ගැලපෙන තත්ත්වයට ආවා, පෝෂණය වුනා කියන එක. පැහිල ඉදුණා. කොස් ගෙඩියක් පැහිල ඉදිල කියන්නෙත් මේ වගේ දෙයක්. පැහුනට, ඉදුනට පස්සෙ කපා ගන්නවා. ඒ වගේ හැම ගෙඩියක්ම පැහෙනවා, ඉදෙනවා. ඉදෙන අවස්ථාව කියන්නෙ අවසන් අවස්ථාව. එතනින් පස්සෙ එන දිරා යාම තමයි වේරම්භයේ ආරම්භය. ආරම්භයේ කෙළවර කියන්නෙ වේරම්භයේ පටන් ගැන්ම. වේරම්භයේ අවසානය තමයි ආකාසයට ගිහින් සුද්ධාෂ්ඨක බවට පත් වෙලා යන අවස්ථාව. ඒ කියන්නෙ අන්තිම අවස්ථාව. ඉහළම ස්ථරය. එතනට ගිහින් තමයි නැවත වරක් පොළවට ඇවිත් සකස් කිරීමක් කරන්නෙ.

එතකොට මේ වේරම්භ වාතය කියන්නෙ තනිකරම කාන්දම් වළල්ලක්. ක + අන්දම - ක්‍ෂය වී ගිහින් එන අන්තිම ආකාරය. එහෙම නැතිව නිකම්ම වායුවක් නෙවෙයි, හුළඟ නෙවෙයි. වායුව පසු කරල ඉහළට ගියාමයි ඒක තියෙන්නෙ. ඕසෝන් ස්ථරය කිව්වෙත් ඒකයි. ඕසෝන් කිව්වම ලෝකයේ හට ගත් එක්තරා කාන්දම් වායුමය ස්වභාවයක්. නැවත සුව ක්‍රියාකාරීත්වයට එන්න වායුව සකස් කරල දෙන ආකාරය. ඒක තමයි සුද්ධාෂ්ඨකයෙන් කරන්නෙ. අද හයිඩ්‍රජන්, ඔක්සිජන් ... ආදී වශයෙන් විද්‍යාඥයො දකින පරමාණු නෙවෙයි මේ කියන්නෙ. මේ පරමාණු කියන්නෙ සුද්ධාෂ්ටක පොදියක්. ලෝක සම්මත විද්‍යාවෙ ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන, නියුට්‍රෝන කියන ජීවත් කාය දසක, භාව දසක, වස්තු දසක කියන දසක 30 ක පොදියක්. සුද්ධාෂ්ටක කියන මේ සියුම් කාරණය බුදුන් වහන්සේ තමයි පෙන්වා දුන්නෙ. සුද්ධාෂ්ටක පොදියකින් තමයි විවිධ ජාතියේ සම්මත පරමාණු හැදෙන්නෙ. අද ආවර්තිතා වගුවේ 108 ක් මූල ද්‍රව්‍ය හැදෙන්න මුල මේ කියන සුද්ධාෂ්ටක.

ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන, නියුට්‍රෝන කියන තුනේ සංකලනයක් තමයි මේ මූලික පරමාණුව කියන්නෙ. එතන ඉඳන් තමයි නැවත වරක් මේ ☞

චක්‍රය කැරකි කැරකි ක්‍රියාත්මක කරන්නෙ. මෙතනදි ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන, නියුට්‍රෝන කිව්වම හැම මූල ද්‍රව්‍ය පරමාණුවකටම පොදුයි. උදාහරණ විදිහට රත්‍රන්වල ලෝක සම්මත අන්තිම අංශුව ගත්තම රත්‍රන් පරමාණුව. හැබැයි ඒක බින්දම එන්නෙ ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන, නියුට්‍රෝන. රිදී ගත්තමත් එහෙමයි. හැබැයි රිදී ඉලෙක්ට්‍රෝන, රත්‍රන් ඉලෙක්ට්‍රෝන කියල වෙනම ඒවා නෑ. එතනට ආවට පස්සෙ ඔක්කොම එකයි. එතැනින් පටන් ගෙනයි පරිවර්තනය වෙන්නෙ. ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන, නියුට්‍රෝනවල ඉඳන් පරිවර්තනය වෙන කොට ඉස්සෙල්ලම එන්නෙ මූල ද්‍රව්‍ය බවට පරිවර්තනය. මූල ද්‍රව්‍යවල භ්‍රමණ වේගය ඉතා වැඩියි. එතකොට ඕසෝන් ස්ථරයේ උඩම ස්ථරය කියන්නෙ කාන්දම් වට රවුම. ඒකෙන් තමයි පාලනය කරන්නෙ. ඒ කාන්දමේ භ්‍රමණ ශක්තියේ ක්‍රියාකාරීත්වයෙන් තමයි නැවත වරක් පරිවර්තනයට ශක්තිය ගන්නෙ. මේ කාන්දමට සූර්ය ශක්තිය ලැබුනම තමයි ක්‍රියාත්මක වෙන්නෙ. ඒකෙන් හට ගත්තු දෙවන අවස්ථාව තමයි 108 ක් මූල ද්‍රව්‍ය විදිහට නිපදවෙන්නෙ. ඒ මූල ද්‍රව්‍යත් හරි බලවත්. ඝනීභවනය වෙන්න වෙන්න භුක්ති විඳින මට්ටමට එන කොට ඒවා නිහඬයි. ආරම්භය සකස් වෙන්නෙ එහෙමයි. මේවායින් වායු කියන්නෙ හුඟක් තුනී මට්ටමක්. හයිඩ්‍රජන්, නයිට්‍රජන් ... ආදී වශයෙන් කියන්නෙ ඒ වායුවලට දාල තියෙන නම්. ඒ සියල්ලම අර මූල පදාර්ථ 108 ක කොටස්. පරමාණු හට ගත්තම හයිඩ්‍රජන් පරමාණු, නයිට්‍රජන් පරමාණු ආදී වශයෙන් 108 ක් දක්වාම යනවා.

එතකොට මේ ආකාසය තුළ තියෙන ඕසෝන් කියන විසාල ඝනීභවන කාන්දම් වායුව මේ වගේ ස්වභාවයක් පෙන්වන්නෙ, ඒ අංශු සුද්ධාෂ්ඨකවලට බිඳෙන කොට ඒවායේ න්‍යෂ්ටික බල කඳම්භ මහා ශක්තියකින් ක්‍රියාත්මක වීම නිසා. දැන් මේ විදියට වැය වෙලා ඒ චක්‍රය ඉවර වෙන්නෙ නෑ. නැවත ආරම්භ වෙනවා. ඒ කියන්නෙ ඖෂධීය ශක්තිය, රසායනික ශක්තිය නැවත එකතු කරල නැවත පටන් ගන්නවා. ඒ සඳහා ඒ විදිහට ගෙනිච්ච ද්‍රව්‍යයන්ම නැවත චක්‍රයට දානවා. දැන් ඒක නැවතත් වැස්සත් එක්ක සම්බන්ධ වෙලා ඇවිත් කලින් වගේම ඖෂධීය ශක්තිය ගැබ් වෙච්ච ජලය, අවශ්‍ය කරන ඖෂධීය වායු කොටස්, රසායනික සංයුතිය තියෙන වායු කොටස් ආදිය පොලවට පතිත වෙලා ශාකවලට ඇදගෙන නැවතත් ඵලදාව හදනවා. මේ චක්‍රය තමයි දිගටම ආරම්භ වේරම්භ විදියට යන්නෙ. ඕසෝන් ස්ථරය කිව්වෙත් ඒකයි. ඕසෝන් කිව්වෙ ආරම්භක අර්ථයෙන්, වේරම්භ කිව්වෙ වැය වෙන අර්ථයෙන්. එතැනින් තමයි පටන් ගන්නෙ. ආරම්භය පටන් ගන්න තැනින් තමයි වැහි ජලයේ නයිට්‍රජන් තියෙනව කියල හොයා ගෙන තියෙන්නෙ. නයිට්‍රජන් විතරක් නෙවෙයි එදා සශ්‍රීකව තිබිච්ච කාලයේ කැල්සියම්, පොටෑසියම්, මැග්නීසියම්, පොස්පරස් .... ආදී, ගස්වලට අවශ්‍ය සියලුම රසායනික සංයුතිය ඒ වැස්සත් එක්ක පොළවට ලැබුණා. එතකොට ඒ විදියට ලැබුනෙත් සශ්‍රීක ඵලදාවකට ගැලපෙන පොහොර. ඒ නිසා තමයි වැහි දවස්වලට ගස් කොළන් හොඳින් වැඩෙන්නෙ. ඒ ලැබීම නිසා මනුස්සයින්ට කරදරයක් නැති, විසක් නැති, ස්වභාවික පරිසරයේ හොඳින් වැඩෙන ගස් කොළන් තමයි හටගන්නෙ.

නමුත් දැන් ලැබෙන්නෙ වල් ඵලදාවකට ගැලපෙන පොහොර නිසා, වැස්සත් එක්කම වල් ගස් තමයි පැලවෙන්නෙ. ඒ වැස්ස වල් ගස්වලට හරි සශ්‍රීකයි. නමුත් භව භෝග සම්පත්වලට එච්චර සශ්‍රීකත්වයක් නෑ. මොකද ඒ හැදෙන පොහොර, වල් විදියට හැදිච්ච නිසා ඒවා පෝෂණය වෙන්නෙ වල් ගස්වලට. මේ නිසා වැස්සත් එක්ක එන සියලු පොහොර සියලු ගස්වලට පෝර වෙන්නෙ නෑ. මෙතනදි අපි ශෂ්‍ය මාරුව කියල දෙයක් කරනවා. එක ගොවිතැනක් එක දිගටම කරගෙන ගියොත්, පළමු ඵලදාව හොඳට ලැබිල පසුකාලීනව ඵලදාව අඩු වෙනවා. තව තවත් ඒ බෝගයම වගා කළොත් ඊටත් වඩා ඵලදාව අඩු වෙනවා. මේ විදියට වතාවල් දෙක තුනක් කළාට පස්සෙ ගොවිතැන මාරු කරනවා. කලින් මිරිස් හිටෙව්ව නම් පසුව මුං ඇට වගා කරනවා. එතකොට ඒ බෝගය සශ්‍රීකව හැදෙනවා. මොකද මුං ඇටවලට ඇදෙන පොහොර නෙවෙයි මිරිස්වලට ඇදෙන්නෙ. මිරිස්වලට ඇදෙන පොහොර නෙවෙයි බටුවලට ඇදෙන්නෙ. මේ පොහොරවලත් අපට හොයාගන්න බැරි සූක්ෂම වෙනසක් තියෙනවා.

උදාහරණ විදිහට දැන් පොල් පොහොර, රබර් පොහොර, තේ පොහොර කියල විශේෂ පොහොර වර්ග 3 ක් තියෙනවා. මේවායින් පොල් පොහොර ගත්තම ඵලදාව වැඩි කිරීමට අවශ්‍ය කරන පදාර්ථයන් සකස් කිරීම තමයි කරන්නෙ. එතකොට ඒ පොල් පොහොර දැම්මොත් ගෙඩි සරුවට හැදෙනවා. රබර් පොහොර දැම්මොත් ගෙඩි වැඩි වෙන්නෙ නෑ, කොළ සහ කිරි වැඩි වෙනවා. තේ පොහොර දැම්මොත් කොළ හැදෙනවා. ඒ කියන්නෙ මේ දැන් තියෙන පොහොර ගත්තම එක එක විදිහයි. ඒ තමයි අවශ්‍ය පොහොරවල සංයුතිය කෘතීමව හදා ගන්න හැටි. ඔය විදිහට කෘතීම පොහොර නැත්නම්, මේ හැම එකක්ම අපේ ගතියට අනුකූලව ස්වභාවිකව තමයි හැදෙන්නෙ. සත්වයින්ගෙ මානසිකත්වය අනුව තමයි ස්වභාවිකව ඒ පොහොර සියල්ලම හැදිල එන්නෙ. දැනුත් ස්වභාවිකව හැදිල එන්නෙ එහෙමයි. නමුත් දැන් රසායනික සංයුතියක් එකතු කරල කෘතීම පොහොර හදා ගන්න කොට කෘතීම පරිසරයක් ඊට අනුකූලව සකස් වෙනවා. ඒ හදා ගන්න කෘතීම පොහොරවලින් උපක්‍රමශීලීව තමයි දැන් මනුස්සයා ජීවත් වෙන්නෙ. අර ස්වභාවිකව ලැබිච්ච දේ අභාවයට ගිහින්.

**මනුස්සයින්ගෙ වල් ගති නැත්නම්, වල් ගස් වැඩෙන පොහොර වර්ෂාපතනයත් එක්ක මේ ලෝකයට එන්නෙ නෑ. සියලු ප්‍රයෝජනවත් ගස් කොළංවලට අවශ්‍ය කරන පොහොර වර්ග තමයි වැස්සකින් එන්නෙ.** කිසිම සතෙකුට කිසිම හිංසාවක් නොවෙන්නයි ඒ පොහොර වර්ග හැදිල එන්නෙ. නමුත් දැන් කෘතීම පොහොර දැම්මම සත්තුත් විනාස වෙනවා. කෘමීන්, පණුවන් පවා විනාස වෙනවා. මොකද සීමාව ඉක්මවල දාන්නෙ. නමුත් ස්වභාවිකව කොච්චර වැස්සත් පණුවෙක්වත් මැරෙන්නෙ නෑ. හැබැයි කර්ම වේගයක් ඇවිත් වැස්සට ගහගෙන යන්නෙ නෑ කියන එක නෙවෙයි මේ කියන්නෙ. ඒක වෙනම පැත්තක්. ස්වභාවිකව වැස්සක් වැහැල පොළව තෙමුනට ඒ එන රසායනයන් නිසා පොළවෙ ඉන්න සත්තු මැරෙන්නෙ නෑ. නමුත් අද මනුස්සයා, අපි විද්‍යාවෙන් දියුණුයි කියල කෘතීම වෙලා, පණ්ඩිත වෙලා ඉන්නවා. හැබැයි ස්වභාව ධර්මය කියන විද්‍යාව පරද්දන්න තවත් විද්‍යාවක් ලෝකයේ නෑ. නමුත් අද නවීන විද්‍යාව දියුණුයි කියල ලෝකයා මොට්ටකම් කරනවා. ඒකෙන් අන්තිමට එන්නෙ විනාසය.

ඒ ඒ ගස් කොළං හැදෙන්න අවශ්‍ය පෝර හෝ මොනව හරි දෙයක් තියේ නම් ඒවායේ ස්වභාවයක් තියෙනවා. ඒක මොකක්ද කියන්න අපි දන්නෙ නෑ. මේ වල් ගස් හැදෙන්නෙ මොකෙන්ද, මේ තණ කොළ හැදෙන්නෙ මොකෙන්ද ... ආදී වශයෙන් අපිට එහෙම හොයා ගන්න බෑ. නමුත් ලෝක සම්මත විද්‍යාඥයින්ගෙ තියෙන පටු මනස නිසා නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම් කියන මේ තුන තමයි පෝරවල ප්‍රධාන සංඝටක කියන්නෙ. අද ඔය තුනම තමයි එක එක විදිහට කලවම් කරන්නෙ. වෙනත් දෙයක් ගැන දන්නෙ නෑ. වැඩි ඵලදාවක් ගන්න ඩොලමයිට් කියල තවත් ජාතියක් දානවා. දැනට පොල් ගස්වලටත් ඕක දානවා. නමුත් තව පදාර්ථ කොච්චර

තියෙනවද ? එතකොට ඇයි රඹුටන් වාරයක් තියෙන්නෙ ? ඇයි ගඩුගුඩා, දූරියන් වාරයක් තියෙන්නෙ ? ඇයි වෙසක් මාසෙට හැම තැනම මල් පිපෙන්නෙ ? මොකක්ද හේතුව ? කෝ මල් පිපෙන පොහොර ? කෝ ගෙඩි හැදෙන පොහොර ? එතකොට වාරයක් කියල නැතුව හැමදාම පොල් තියෙනවා. හැබැයි අනෙක් ජාති වගේ පොල් වාරයක් නැති වුනාට, වෙසක් කාලයට පොල් ඵලදාව වැඩියි, පළතුරු වැඩියි. අවාරෙටත් සමහර පළතුරු වර්ග තියෙනවා. නමුත් බොහොම අඩුයි. එතකොට කාලෙකට ඇයි වැඩි වෙන්නෙ, කාලෙකට ඇයි අඩු වෙන්නෙ කියන එකට හේතුවක් කියන්නෙ නෑ. ඍතු විපර්යාසය හරි මොනව හරි කිය කිය ඉන්නව මිසක් පිළිගන්න පුළුවන් හේතු ඵල සම්බන්ධයක් ඉදිරිපත් කරන්නෙ නෑ.

ඉතින් මේ වගේ සශ්‍රීක ගස්වලට ඇදෙන පොහොර නෙවෙයි නිසරු වල් ගස්වලට ඇදෙන්නෙ. මනුස්සයගෙ හිත වල් කරගත්තම තමයි හේතුඵල විදියට වල් ගස් වැල්වලට අවශ්‍ය කරන පොහොර වැස්සත් එක්ක ඇවිත් ඒවා සරුවට හැදෙන්නෙ. ඒවාට ලෙඩක් නෑ, හොඳට හැදෙනවා. නමුත් **මනුස්සයා යහපත් සුචරිත ගුණවලින් වැඩුන නම්, සරු සාර ගුණ වගාවක් හදවතේ තිබුණ නම්, ගුණ ධර්ම පිරි ලෝකයේ සරු සාර ඵලදාවකට අවශ්‍ය පොහොර තමයි වැස්සත් එක්ක එන්නෙ. එතකොට නිසරු වල් වගාවන්ට අවශ්‍ය පොහොර නොලැබී ඒවා අඩාල වෙලා බාල වෙනවා. ඒ නිසා ඒ වල් ගස් වැල්වලින් එන බාධක නැති වෙලා, අමුතුවෙන් වල් පැල නාශක ඉහින්න අවශ්‍ය නැති තත්වයකුත් එනවා. ඒ වගේ ශාක නිකම්ම මැඩ පැවැත්වෙනවා. මනුස්සයින්ගෙ ප්‍රයෝජනයට අවශ්‍ය සශ්‍රීක භව බෝගවලට සශ්‍රීක පොහොර ලැබිල ඒවා නැගී එනවා. ඒකෙන් තමයි හැම තැනම මනුස්සයින්ට ප්‍රයෝජනවත් ශාක ස්වයං ජාතව වැඩෙන්න පටන් ගන්නෙ. එතකොට අමුතුවෙන් පොහොර දමන්න, බෙහෙත් ගහන්න ඕනෙත් නෑ. තැන තැන ශාක හිටවන්න ඕනෙත් නෑ.** මේ තමයි ආරම්භයේ ප්‍රධාන විශේෂ අවස්ථාව. ස්වයං ජාතයෙන් මනුස්සයින්ට ආහාර සඳහා අවශ්‍ය ගස් කොළන් හටගන්නවා කියන්නෙ ඕකට.

දැන් අප්‍රිකාවෙ කොංගෝ වනයේ එක්තරා ප්‍රදේශයක කරපු පරීක්ෂණවලින් හොයා ගත්තු දෙයක් තියෙනවා. ඒ ප්‍රදේශයේ ජීවත් වෙන මිනිස්සු කියන්නෙ, ඒ තියෙන සශ්‍රීකත්වය ඒ අයට දෙවියන් වහන්සේ දුන්නු දායාදයක් නිසා ඒ අය ඒක විනාස කරන්නෙ නෑ කියල. සියලු පළතුරු ඒ ප්‍රදේශයේ කවදාවත් හිඟ වෙන්නෙ නෑ. පිටින් යන අයට පවා ආගන්තුක සත්කාර කරන්නත් එක්ක ඕන තරම් තියෙනවා. වවල හදලත් නෙවෙයි. මොකද කියල හොයන්නත් බෑ. නමුත් නූතන බටහිර සමාජය හිතාගෙන ඉන්නෙ මේ අය මහ වනචාරී ජීවිත ගත කරන ම්ලේච්ඡ ජන කොටසක් කියල. හැබැයි ඒ අයගෙ ඒ සශ්‍රීකත්වය රැකිල තියෙන්නෙ, මේ නවීන ලෝකයේ තියෙන විකාරවලට ගියේ නැති නිසා. නවීන විද්‍යාව පස්සෙ යන්නෙ නැතිව ස්වභාවිකත්වය තුළ ජීවත් වෙනවා. ඒ නිසා ඒ මූලික තත්ත්වය අදටත් වැනසිලා නෑ.

ඉතින් නවීන ලෝකයේ ඉන්න විද්‍යාඥයො කියන උදවිය ඔය ප්‍රදේශයට ගිහින් පස් පිඩක් අරගෙන ඇවිත් පරීක්ෂා





කරල බලල කියනවා, ඒවායේ ජීවාංගර කියල ජීව ශක්තිය දෙන අඟුරු වර්ගයක් තියෙනව කියල. ඒ අඟුරුවලින් ඵලදාව ලැබෙන්න ශක්තිය දෙනව කියල තමයි ඒ අය නිගමනය කරන්නෙ. හැබැයි ඒ අඟුරු වර්ගය හරි මොකක් හරි එහෙම තියෙන්නෙ ඇයි කියල ඒ අය දන්නෙ නෑ. ඉතින් නූතන සමාජය ඒ අයට ම්ලේච්ඡයි කියල කිව්වට, ඒ අයට ලෞකික සම්පත්තියක් ලබන්න ඒ වාසනාව තියෙනවා. නමුත් මෙච්චර නවීන තාක්ෂණික ලෝකයේ ඒ සශ්‍රීකත්වය නෑ. අද අවාරෙට ගෙඩි හදන්න පුළුවන් මොකෙන්ද? කාබයිඩ් ගහල අන්නාසි පූදිනව කියන්නෙ හරියට පොඩි දරුව බඩ දරුවෙක් කළා වගේ වැඩක්. ඒක හරියන වැඩක් නෙවෙයි. ස්වභාවිකත්වයෙන් ඒ ගස්වල ගෙඩි හැදෙන්න, පූදින්න ක්‍රමයක් තියෙන්නෙ ඕන. දැන් අවාරෙට හදා ගන්න සමහර එළවළු පළතුරු පැහැයෙන්, රසයෙන්, ගුණයෙන් අඩුයි. නමුත් ස්වභාවික ගෙඩි එහෙම නෑ. හැබැයි ඒකට අවශ්‍ය ඒ පොහොර මොනවද කියල තවම හොයා ගන්න බැරි වෙලා තියෙනවා. එතකොට ඒවා අර ම්ලේච්ඡයි කියන මිනිස්සුන්ට කොහෙන්ද? ඇයි ඒවා අනෙක් ප්‍රදේශවල නැත්තෙ? ඒ අයට ම්ලේච්ඡයි කියන්නෙ කවුද? ලෝක සම්මතයේ සමහර උගත් කියන පණ්ඩිතයො. දැන් මේ රාමුව ඇතුලෙ ඉඳගෙන, අපි මෙච්චර දියුණුයි කියල පණ්ඩිතකම් කියනවා. නමුත් ඒකෙන්ම ලෝකය විනාස වෙලා යනවා.

ඉතින් මේ විදියට හේතුඵල වශයෙන් සිද්ධ වෙන විශ්ව ක්‍රියාවලියක් තියෙන බව බුදු දහම තුළත් පටිච්ච සමුප්පාද ධර්මයෙන් පෙන්වා තියෙනවා. නමුත් ඒක පිළිගන්නෙ නැති නිසා අද දුක් විඳ විඳ දඟලනවා. විවිධ කෘතීම පොහොර, බෙහෙත් වර්ග හදනවා, ගහනවා. දැන් ඉතින් තවත් එහාට පොහොර සැර, කෘමි නාශක සැර වැඩි කළොත් සත්තු විතරක් නෙවෙයි මනුස්සයොත් මැරෙන මට්ටමට විස වැඩි වෙලා තියෙන්නෙ. දැන් එයින් එහාට මොකක්ද කරන්නෙ කියන උභතෝකෝටික ප්‍රශ්නයට මුළු ලෝකයම මුහුණ දීල තියෙන්නෙ. නමුත් බුදු දහම තුළින් මේ කියන තැනට නැවත ආව නම් තමයි ප්‍රශ්නයට විසඳුම් ලැබෙන්නෙ. වෙන කිසිම විසඳුමක් නෑ. ඒක තමයි සත්‍ය විසඳුම.

ඉතින් දස අකුසලයෙන් වෙන් වෙලා, සාමයෙන් සමාදානයෙන් සහයෝගයෙන් ලබැඳියාවෙන් කටයුතු කරමින්, සත්වයන් ඇතුළුව එකිනෙකාට ආරක්ෂාව සලස ගෙන කටයුතු කරන ගුණයක් තියේනම්, ඒ නිසා ඇතිවෙන්නා වූ ශක්තිය තමයි ඒ සශ්‍රීකත්වය ඇති කරන්නෙ. ඒ ශක්තිය ගිහින් සැතපුම් ගණනාවක් එහායින් තියෙන ඕසෝන් ස්ථරය බල ගන්වල ඝනීභවනය කරනවා. ඝනීභවන වුණාම සූර්යාගෙන් එන පාරජම්බුල ආදී විස කිරණ පොලවට එන්නෙ නෑ. ඒ තුළින් එන්නෙ තනිකරම ආලෝක ගතිය. මේ ආලෝක කිරණ නිසා ලෝකයේ ආලෝකය වැඩි වෙලා උෂ්ණත්වය අඩු වෙනවා. මොකද ගස් කොළන් වැඩෙන්න මූලිකවම අවශ්‍ය වෙන්නෙ ආලෝකය මිසක් උෂ්ණත්වය නෙවෙයි. ඒ කාරණය හොඳින් දැක බලා ගන්න පුළුවන් අවස්ථාවක් තියෙනවා. තණකොළ පිඩක් අරගෙන පොල් කටුවකින් වහල තිව්වොත්, අව්වෙන් ලැබෙන උෂ්ණත්වය නම් කිසි අඩුවක් නැතිව ලැබෙනවා. නමුත් ☞

ආලෝකය නොලැබීම නිසා හරිතප්‍රද කියන කොළ පාට නොවැඩී කහ පාට වෙලා සුදු පාට වෙනවා. එතනින් ගහ මැරෙන්නත් හේතු වෙනවා. එහෙනම් ආලෝකය වැඩි කරල උෂ්ණත්වය අඩු කරන්නෙ මේ කියන ඕසෝන් ස්ථරයෙන්. නමුත් දැන් සිද්ධ වෙලා තියෙන්නෙ මොකක්ද? මනුස්සයින්ගෙ ගති දූෂ්‍ය වීම නිසා ඕසෝන් ස්ථරය තුනී වීමෙන් ආලෝකය අඩුවෙන් ලැබිල ඉතිරිය උෂ්ණත්වය වශයෙන් වැඩියෙන් ලැබෙනවා. මේ නිසා මුහුදේ අයිස් කඳු පවා දිය වෙලා මනුස්සයින්ට ජීවත් වෙන්න තිබ්බ්ච ගොඩබිම් ප්‍රමාණයත් ක්‍රමයෙන් මුහුදට බාදනය වෙමින් තියෙනවා.

එතකොට මේ ඕසෝන් ස්ථරය මනුස්ස ලෝකයේ ඉන්න සත්වයින්ට, බාහිර ලෝකවලින් එන විස කිරණ වළක්වල සෙත් ශාන්තියකට හේතු වන්නා වූ ආලෝකය ලබා දෙමින්, නිරෝගී කයකට අවශ්‍ය කිරණ පෙරා දෙන ස්ථානයක් ලෙසත් ක්‍රියා කරනවා. ඒ වගේම විශ්වයේ තියෙන උල්කාපාතයක්වත් මේ පොළවට වැටෙන්න පෙර ඉවතට විසි කරමින්, මනුස්සයින් ඇතුළු සත්ව සංහතියට කරදරයක් හිරිහැරයක් නොවන තත්ත්වයක් ඇති කරන්නත් මේ ඕසෝන් ස්ථරයේ ශක්තිය නොපෙනෙන පැත්තකින් ක්‍රියා කරනවා. සූර්යා ඇතුළු වෙනත් ග්‍රහලෝකවලින් එන විස කිරණ පොළවට එන්න පෙර, සෙත් ශාන්තියට හේතු වන සුව කිරණක් බවට පරිවර්තනය කරල නැවතත් මේ ලෝකයට එවන්නත් ඕසෝන් ස්ථරය හේතු වෙනවා. මේ නිසාත් අර කියපු විවිධ රෝගාබාධ හැදෙන්න තිබ්බ්ච පරිසරය නැති වෙලා, හොඳ සුවදායී පරිසරයක් නිර්මාණය වෙන්න හේතු වෙනවා.

ඉතින් මනුස්සයින්ගෙ ඇතිවන ශාන්ත හිත්වලින් තමයි ඕසෝන් ස්ථරය ඝනීභවනය වෙලා බල ගැන්වෙන්නෙ. මනුස්සයින්ගෙ ගුණ ධර්ම වැඩි වෙන කොට ඝනීභවනය වැඩි වෙලා, ලෝකයට එන ආලෝක ප්‍රමාණයත් වැඩි වෙලා උෂ්ණත්වය අඩු වෙනවා. එතකොට සශ්‍රීක පොළවකුත්, සෞම්‍ය දේශගුණයකුත් තමයි ලෝකයට ලැබෙන්නෙ. ඒක විශේෂ ගුණයක්. හැම තැනම ආලෝකයි, සිසිලයි. ගස් වැල්වලට අවශ්‍ය පෝෂණයත් නියම විදියට ලැබෙනවා. කටුක ගස්වලට වඩා මෘදු ගස් කොළන් වැඩෙන්න පටන් ගන්නවා. මේ නිසා මනුස්සයින්ට එලදාව ලැබිල සශ්‍රීකත්වය නිකම්ම හටගන්නවා. පුරුදු වෙච්ච පළතුරු, එළවලු ආදියට විශේෂයි. ඒ විදියටයි සශ්‍රීකත්වය ස්වයං ජාතව හැදෙන්නෙ. හැබැයි මේ කියන කාරණයේ මූල ධර්මය තියෙන්නෙ මනුස්සයා අතේමයි. මනුස්සයින් එකිනෙකාට ආරක්ෂාව සලසා ගෙන අනුන්ට හිංගි හිංසා නොකර, සතුන්ට පවා ආරක්ෂාව සලසල දීල, සමගියෙන් සමාදානයෙන් මේ ගුණ ධර්මයන් තුළ කාලයක් ජීවත් වුණා නම්, ලෝකයේ හැම තැනම ඒ ඒ මට්ටම්වල හැටියට ඕසෝන් ස්ථරය ඝනීභවන වෙලා බලවත් වෙනවා.

දැනට ලෝකයේ සමහර ප්‍රදේශවල ඒ ඝනීභවන මට්ටම ටිකක් හරි ඉතුරු වෙලා තියෙනවා. නමුත් සමහර ප්‍රදේශවල ඕසෝන් මට්ටම තුනී වෙලා සිදුරු හැදිල තියෙනව කියලත් විද්‍යාඥයින් හොයා ගෙන තියෙනවා. ඊට අමතරව සැතපුම් ගණනක් ඈතට විහිදුනු ඕසෝන් ස්ථරය අද වෙන කොට සැහෙන ප්‍රමාණයකින් තුනී වෙලා තියෙනව කියල හොයා ගෙන තියෙනවා. මේ නිසා වෙනත් ලෝකවලින් එන විස කිරණ වැදිල මනුස්සයින්ට පිළිකා හැදිල විනාස වෙන්නත්, ගස් කොළන් පවා විකෘති වෙලා විනාස වෙලා එලදාව අඩු වෙන්නත් හේතු වෙලා තියෙනවා. එහෙනම් ලෝකයේ මේ ඕසෝන් ස්ථරය ඒ විදියට යම් පමණකින් හෝ ඝනීභවනය වෙලා පිහිටන්නත් හේතුවක් තියෙනවා. හුඟක් රටවල් ගත්තම, නවීන විද්‍යාව දියුණු වෙන කොට බුදු දහමට වඩා භෞතිකවාදී අදහස් වැඩි වෙනවා. එතකොට කොහොමත් ගුණ ධර්ම ගණන් ගන්නෙ නෑ. පිං පවු පිළිබඳ විස්වාසයක් නෑ. මේ නිසා ලෞකික ලෝකයේ යැපීමට, සුඛෝපභෝගීව ජීවත් වීමට ඕනම නොකටයුත්තක් කරනවා. බල්ලො මරල හරි සල්ලි හම්බ කරන රටවල් පවා බිහි වෙලා තියෙන්නෙ ඒ නිසා. ඒ වගේ මනුස්ස වර්ගයා විනාස කරන්න විස ද්‍රව්‍ය, අවි ආයුධ ආදිය නිෂ්පාදනය කරන රටවල් අද වෙන කොට සුලභව තියෙනවා.

මේ වගේ තත්ත්වයන්ට ලෝකයේ බහුතරයක් රටවල් පත්වෙලා තියෙන නිසා, සමස්ථ ලෝකයේ තියෙන ඕසෝන් ස්ථරය තුනී වෙලා තියෙනවා. මොකද මනුස්සයින්ගෙ අසාධාරණය නිසා ඇති වෙච්ච දූෂිත මානසිකත්වය තමයි ඒකට බලපාන්නෙ. ඒ නිසා ඇති වෙච්ච මහා භූතයන්ගෙ විකෘතිතාවයේ ප්‍රතිඵලය තමයි මේ සිද්ධ වෙලා තියෙන විනාසය. නමුත් සාපේක්ෂව ගත්තොත් ලෝකයේ තියෙන බොහොමයක් රටවල් අතරින් සමහර රටවල ඔය කියන ගුණ ධර්ම යම් පමණකට හරි රැකිල තියෙනවා. තෙරුවන් වඳින, බණ භාවනා කරන, ලෝකයාට මෙත් වඩන, දෙවි බඹුන් අදහන, දෙමව්පියන්ට වැඩිහිටියන්ට ගුරු දෙගුරුන්ට සලකන, එකිනෙකාට අන්‍යෝන්‍ය සහයෝගය දෙන ගුණ ධර්ම යම් පමණකට හරි ඉතිරි වෙලා තියෙනවා. ලෝකයේ කොහේ හරි එහෙම ගුණ ධර්ම වඩන පිරිස් ඉන්නව නම්, ඒ ගුණය තමයි ඕසෝන් ස්ථරයෙන් පෙන්වන්නෙ. ඉතින් මුළු ලෝකයම පංච දුශ්චරිතයෙන් වෙන්වෙච්ච සුචරිත යහපත් ගුණ ධර්ම වඩන පිරිසක් බවට පත් වුණා නම්, අර තුනී වෙච්ච ඕසෝන් ස්ථරය නැවත වැඩෙන්න පටන් ගන්නවා. එහෙම වුණා නම් විසාල පරිසර ශාන්තියක් උදා වෙලා අධික සූර්ය රශ්මිය ලෝකයට එන්නෙ නෑ. රස්නය ආලෝකය බවට පරිවර්තනය වෙලා එන්නෙ. රස්නයත් එක්ක තියෙන විස කිරණ, සැඩ ගතිය එන්නෙ නැතිව යනවා. ලෝකයේ සිද්ධ වෙන මේ වගේ ධර්මානුකූල පරිවර්තන මගින් තමයි මනුස්සයින්ට අවශ්‍ය කරන කාලගුණ දේශගුණ රටාවන් හැඩ ගැහිල යහපතක් උදා කරල දෙන්නෙ.

සහරා වගේ කාන්තාර ප්‍රදේශ ගත්තොත් මේ ඕසෝන් ස්ථරය බොහොම තුනී වෙනවා. ඒක හරි භයානකයි. මොකද හේතුව යම් යම් කාලවලදි සාපය මුල් කරගෙන ඒ ඒ පැතිවල ඇති කරපු දෙස් දෙවොල් නිසා. එතකොට ඒ සඳහා ඇසුරු කරපු ගති ලක්ෂණ, කිරණ ශක්තියක් විදියට ඒ ඒ ප්‍රදේශවල පිහිටනවා. හරියට කාන්දම් කැල්ලක් වානේ කැල්ලකට සම්බන්ධ කරල ටික වෙලාවක් ගියාම වානේ කැල්ලෙත් කාන්දම් ශක්තිය පිහිටනව වගෙයි. මේ වගේ ස්වභාවයක් ලෝකයෙත් තියෙනවා. ලෝකයේ යම් කිසි ප්‍රදේශයක මනුස්සයින්ගෙ දූෂිතභාවය වැඩි නම්, ඒ ප්‍රදේශය ඇසුරු කරන කොට කිරණ කාන්දම් ශක්තියක් හැදෙනවා. ඒක නරකටයි හැදෙන්නෙ. ඒක එතැන් පටන් හොඳ පැති විකර්ෂණය කිරීමට විශ්වයට බලපානවා. එතකොට හැදෙන්න තිබ්බ්ච ඕසෝන් වළල්ල ඇතුළු පෝෂණ ධාතුව නැතිව යනවා. ඕසෝන් පටලයට අවශ්‍ය ශක්තිය නිපදවෙන්නෙ නෑ. යහපත් චිත්තජ රූප කලාප නිපදවීම නතර කරන්නත්, නිපදවල තිබ්බ්ච උතුජ රූප කලාප විනාස කරන්නත්, පසුව නිපදවෙන විස රූප කලාප හේතු වෙනවා. මේ නිසා ලෝකයේ යහපත් ශක්තිය විකෘති වෙලා ඕසෝන් පළුදු වෙලා යනවා. අන්තිම ප්‍රතිඵලය තමයි විශ්වයෙන් ලෝකයට විස කිරණ ඇවිත් මහා විනාසයක් වීම. මනුස්සයින්ගෙ ගති ගුණත් විනාස වෙලා ලෙඩ රෝග හැදිල භව භෝග සම්පත් විනාස වෙලා යනවා.

දැන් මහ විනාසයක් වෙන්න යනවයි කියන එකටත් හේතුවක් තමයි, උත්තර ධ්‍රැවයේ සහ දක්ෂිණ ධ්‍රැවයේ අමතර ජලය විදිහට තියෙන හිම කඳු කඩා වැටීම. නමුත් මේ කියන ගති ☞

# මත භේදාත්මක වූ අන්තරාභවිකයා හෙවත් ගන්ධබ්බයා

*පසුගිය කලාපයෙන් -*
*සත්ත්වයාගේ භවයෙන් භවයට යන ගමන....*

අන්තරාභවිකයා පිළිබඳවත්, චුතියට අනතුරුව පටිසන්ධිය පිළිබඳවත් අද වෙන කොට නොයෙක් මත භේද පැන නැගිල තියෙනවා. චුතියට පසු පටිසන්ධිය වෙනව කියලත්, අන්තරාභවයක් නෑ කියන්නෙ අභිධාර්මික මතයක් කියලත්, අභිධර්ම මතය ඉවත් කරන්න ඕන කියලත් කියන මේවා එක මතයක්. (අභිධාර්මික කියන්නෙ අභ්‍යන්තරය, සැඟවුණු දේ, ගැඹුරු දේ කියන අදහස).

ඒ වගේම සූත්‍ර පිටකයට වඩා අභිධර්මය බුද්ධි ගෝචර නිසා, පිළිගත යුත්තේ අභිධර්ම මතය බවත් තවත් පිරිසක් කියනවා. (සූත්තර විස්තර කියල දෙකක් තියෙනවා. සුළු කරල, කුඩා කරල, කැටි කරල පෙන්වපු දේ සූත්තර. විස්තර කියන්නෙ, විස්තර කරල විග්‍රහ කරල පෙන්වපු දේ. පිටක + අය - පිටකය කියන්නෙ, එකින් එක පද බැඳල එකතු කරනවා කියන අර්ථය)

නමුත් බුදු රජාණන් වහන්සේ සත්ත්වයින්ගෙ චුති-පටිසන්ධි බලන කොට, සතරමං සන්ධියක තියෙන කඩ වීථියක උස් තැනක ඉඳන් බලන කෙනෙකුට කඩවලින් එළියට එන, කඩවලට ඇතුළුවන, ඒ මේ අත ගමන් කරන ජනයා පේන්නෙ යම් සේද, ඒ වගේම චුත වෙමින් සිරුරු නම් ගෙවල් අතහැර නව සිරුරු පහල කරන තුරු සැරිසරන සත්ත්වයන් දිවැසින් දැකපු ආකාරය සවිස්තරව පෙන්වා තියෙන නිසා, කවුරු මොනව කිව්වත් අන්තරාභවයක් තියෙන බවත්, අන්තරා පරිනිබ්බායි කියල සමහර මග ඵල ලාභීන් චුත වීමත්, ඉපදීමත් අතර රහත් වෙලා පිරිනිවන් පානව කියල පෙන්වා තියෙන නිසාත්, අන්තරාභවයක් තියෙන බවට අද හේතු සාධක පෙන්වන සමහර උදවිය, මරණ මොහොතට ගොදුරු වෙලා නැවත ජීවත් වන තත්ත්වයට ඇවිත් යම් යම් අය ඒ විදිහට සිරුරෙන් පිට වෙලා



ගිහින් නැවත සිරුරට පිවිසෙන හැටිත් ... මේ ආදී කරුණු ගෙනහැර පාමින් අන්තරාභවය පිළිගත යුතු කරුණක් කියල තවත් මතයක් ගෙන එනවා.

නමුත් මෙතනදි බුදුන් වහන්සේගෙ දේශනා පරස්පර නොවන බවත්, මේ කාරණා දෙකම සත්‍ය බවත් පෙනී යනවා. ඒ වගේම පෙර හිටපු පඬිවර උතුමන්ටත් වැරදීමක් සිදු වෙලා නැති බව මේ ගැන විග්‍රහ කරල බලන කොට හොඳින් වටහා ගන්න පුළුවන්. මේ බුද්ධ වචනය ධර්මානුකූලව විග්‍රහ කරල බැලුවම ඊට පිළිතුර ලැබෙනවා. ''කථංච භික්ඛවේ ජාති, යං තේසං තේසං සත්තානං තම්හි තම්හි සත්ත නිකායේ ජාති, සංජාති, ඔක්කන්ති, අභිනිබ්බත්ති, ඛන්ධානං පාතුභාවෝ, ආයතනානං පටිලාභෝ අයං වුච්චති භික්ඛවේ ජාති ?'' මෙයින් කියවෙන්නෙ මොකක්ද ?

මහණෙනි, ජාතිය නම් කුමක්ද? යම් ඒ ඒ සත්ත්වයෝ ඒ ඒ සත්ත්ව නිකායන්හි ජාතියක්, ජාති සම්බන්ධයක්, උප්පත්තියට එළඹීමක්, අභ්‍යන්තර වැඩීමක්, ස්කන්ධයන්ගේ පහල වීමක්, ආයතනයන්ගේ යළි ලැබීමක් වේද මහණෙනි, මේ ජාතිය යැයි කියනු ලැබේ.

මෙතනදි ජාති කියල පෙන්නුවෙ අවස්ථා හයක සම්පිණ්ඩනයක්. දෙවනුව ජාති කියල කිව්වෙ, මරණ මොහොත එළඹිලා චුති චිත්තක්ෂණයේ අතරක් නැතිව පහල වෙන පටිසන්ධි චිත්තක්ෂණය හෙවත් පටිසන්ධි ජාතිය. ඒක ''නාම රූප පච්චයා සළායතනං'' කියල පෙන්වපු තැන පළමු ආයතනය වූ මනායතනය, හෘද රූපය සමග කර්මජ ශක්තියෙන්

---

ගුණ වැඩුව නම් ඒක එහෙම වෙන්නෙ නෑ. මුහුදට ගොඩ වෙන්නෙ නෑ. මුහුද සමග ගැටීමක් ඇති වෙන්නෙ නෑ. නමුත් බැරි වෙලා හරි තියෙන හිම කඳු ටික දිය වෙලා ආවොත් මහා විනාසයක් වෙනවයි කියන එක අමුතුවෙන් කියන්න දෙයක් නෑ. එහෙම වුණොත් ලෝකයේ සෑහෙන රටවල් ප්‍රමාණයක් විනාස වෙන්න පුළුවන්. ඒක වලක්වන්න තියෙන එකම ක්‍රමය තමයි මනුස්සයින් ගුණ දහම් වඩල යහපතට පැමිණීම. එතනදි බුදු දහම විතරක් නෙවෙයි, ලෞකික වූ මොන දහමකින් හරි ගුණ දහම් වැඩුව නම්, ඒ කියන යහපත් වාතාවරණය උදා වෙනවා. අබුද්ධෝත්පාද කාලයක වුණත් ගුණ දහම් තියේ නම්, ඒ කාලෙටම කියල ඕසෝන් ස්ථරය විනාස වෙන්නෙ නෑ. මොකද ඒ වගේ කාලවලත් පෙරුම් පුරන බෝධිසත්වයින්, ඍෂිවරුන් හරහා ගුණ දහම් ලෝකයට ලැබෙනවා. මේ සඳහා අවශ්‍ය ගුණාංග වෙන්නෙ දස අකුසල්වලින් වෙන් වීම. ඒ ගුණ ධර්ම වඩන ප්‍රමාණයන්ට අනුකූලවයි ශක්තිය විශ්වයට විහිදිලා සශ්‍රීකත්වය ලැබෙන්නෙ. හැබැයි එතනදි බුදු දහම විශේෂයි. බුදු දහමෙ පෙන්වන ආර්ය ගුණ වඩන කොට ඒ එන ශක්තිය අනෙක් ඒවාට වඩා බලවත්.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වෑහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

පහල වෙනවා.

කර්මජ ශක්තිය - කර්ම බලය තුළින් චේතනාව මූලිකව හිතෙන් පහල කරල, ඒ ශක්තිය කර්ම ශක්තිය බවට පත් කරනවා. ඊට පස්සෙ ඒ ශක්තිය ක්‍රියාත්මක වෙන්න හිතක් අවශ්‍ය නෑ. උදාහරණ විදිහට රහතන් වහන්සේ නිරෝධ සමාපත්තියට සම වැදුනට පස්සෙ හිතක් නෑ. නමුත් කය ජීවත් කරවීම හා ආහාර දිරවීම සිද්ධ කරනවා. ඒ කර්ම බලයෙන් ජනිත කරන ශක්තියෙන්.

මේ තමයි ජාති කියන කාරණා හයෙන් ජාති නම් වූ පළමු අවස්ථාව. දෙවැනි අවස්ථාව තමයි සංජාති කියන, කර්මජ බලය හා චිත්තජ බලය මුල් කරගෙන අන්තරාභවික සත්ත්වයා ලෙස කර්මජ චිත්තජ ශරීරයෙන් හැදිච්ච අඟ පසඟ ඇති සියුම් වූ ජාතීන්ගෙන් එකතු වෙලා හටගත් අවස්ථාව. (චිත්තජ බලය - කර්ම බලය මුල් කර ගෙන හිත විසින් ජනිත කරන ශක්තිය. ඒක හිතක් ඇතිව ක්‍රියාත්මක වෙනවා.)

ඔක්කන්ති කියන්නෙ තුන්වන අවස්ථාව, උපතක් සඳහා එළඹුණු අවස්ථාව. සුදුසු උපතක් ලැබෙන කල් කර්ම ශක්තියේ ක්‍රියාවලියට අහු වෙලා සැඩ පහරකට අහු වෙච්ච පරඬලා පතක් වගේ, මහා සුළඟකට අහු වෙච්ච සරුංගලයක් වගේ, තමන්ට අවශ්‍ය විදිහට කැමති සේ පාලනය කර ගන්න බැරි, කර්ම ශක්තියෙන් හා චිත්තජව නැගෙන නාම රූපයන් නිසා ඊට අනුව විඤ්ඤාණ පහල වෙමින් ඒ විඤ්ඤාණවලට අහුවෙන නාම රූපවල ආකාරයන් ඇහෙන, දැනෙන සේ වැටහෙමින් ඒ කර්ම ශක්තියට ගෝචර වෙලා ඒ මේ අත සුදුසු විදිහට ඇදී යමින් ගත කරන අවස්ථාව.

මේ ඔක්කන්ති කියල කියන්නෙ සුදුසු වෙලාව, පරිසරය ආදිය කර්ම ශක්තියේ බලයෙන් මූලිකව හැඩ ගැහෙමින් සුදුසු උපතක් කරා අන්ඩජ, ජලාබුජ, සංසේදජ කියන උප්පත්ති ස්ථානයකට එළඹෙන අවස්ථාව. ඕපපාතික සත්ත්වයින්ට මේ වගේ ඔක්කන්ති අවස්ථාවක් නෑ. ඔවුන්ගෙ ඔක්කන්තිය විදිහට තියෙන්නෙ ගැබට එළඹීම නෙවෙයි, ඒ ඒ ස්ථානයට එළඹීම. උදාහරණයක් විදිහට දෙවියෙක් දේව විමානයක ඉපදිලා ඒ ස්ථානයට ඇතුළු වුණා කියන්නෙ, එතැන ඔක්කන්ති වුණා කියන එක. නමුත් අනෙක් අවස්ථාවලදි මවු ගැබකට වන ඔක්කන්තියකදි ඊට අවශ්‍ය නිර්මාණය කරන රසායනික පරිසරය එතැන තියෙනව නම්, එතැනට ඔක්කන්ති වෙලා ඊට පස්සෙ ඒක අල්ලගෙන කය වැඩෙනවා.

සමහර වෙලාවට මේ ඔක්කන්ති අවස්ථාව මේ විදිහෙ එකක් වෙන්නත් පුළුවන්. ඒ වගේම ඒක පින් පවු අනුව ලැබෙන තීරණාත්මක අවස්ථාවක්. උදාහරණයක් විදිහට, මනුස්සයෙක් මැරිල මිනිස් භවයකට පටිසන්ධි ලබන්න, මිනිස් හෘද රූපයක් ඇතිව ජාති හෙවත් පටිසන්ධි ක්ෂණය ලබල, සංජාති නම් කර්මජ හා චිත්තජ ශරීරය ලබල ඉන්නව කියල හිතුවොත්, මේ කියන්නෙ කර්ම ශක්තියේ බලයට ප්‍රධාන වශයෙන් යටත් වෙලා පාලනය වන අවස්ථාවක්. හරියට සුදුසුකම් අනුව පත්වීමක් දෙන්න තියෙන නුපුහුණු අනියම් සේවකයෙක් වගෙයි. අනියම් සේවකයගෙ සුදුසුකම් මත පත්වීම දෙන්න, කාලයක් පරීක්ෂණ අවස්ථාවකට පත් කරනවා. ඒ කාලය තුළ ඒ පුද්ගලය පිළිබඳ විවිධ මත ඉදිරිපත් වෙන්න පුළුවන්. යම් කිසි වැඩක් බාර දුන්නම ඒ පුද්ගලයගෙ දුශ්චරිතයක් ගැන පෙත්සමක් ආයතනයට ලැබෙන්න පුළුවන්. පුද්ගලයා හිටපු තැනින් වෙන තැනකට මාරු කරන්න පුළුවන්. වයස මදිය කියල ආපසු යවන්නත් පුළුවන්. සුදුසුකම් මදිය කියල කල් දමන්න පුළුවන්. මේ වගේ වැඩ සිද්ධ වෙන්න පුළුවන්. නමුත් ඒ පුද්ගලයට ස්ථිර පත්වීම දුන්නට පස්සෙ එහෙම කරන්න බෑ. තත්ත්වයෙන්, ස්ථානයෙන් පලවා හරින්නෙ නැතිව ඒ ස්ථානයේම තියල අමාරු වැඩ කොටස් දෙන්නත් පුළුවන්. හොඳ නම් ප්‍රසංසා කරන්නත් පුළුවන්. එහෙම කළත් පත්වීම අවලංගු කරන්නෙ නෑ.

මේ වගේ මේ සංජාති අවස්ථාවෙ ඉන්න සත්ත්වයා මිනිස් හෘද රූපය ඇතිව පහල වෙලා මවු කුසකට යවන කල් ඉන්න අනියම් නුපුහුණු අවස්ථාවක ඉන්නෙ. මේ සංජාතිකයගෙ පරිවාර කර්ම බලය ප්‍රවෘත්ති විපාකයකට සුදුසු බව ලබල, පසුපස දුක සැප දෙන්න සුදුසු විදිහට වර්තනය වෙමින් ඇදෙනවා. වර්තනය වෙනවා කියන්නෙ ආරම්භයේ පටිසන්ධියකින් පටන් ගෙන ඉදිරියට යෑම. පටිසන්ධි වුණාට පස්සෙ එතැන් පටන් ගෙන කවදා හෝ චුතියක් එනකල් ඒ හටගත් කයට එන විපාක, ප්‍රවෘත්ති විපාක වෙනවා. මෙතනදි චක්‍රයක් තමයි ක්‍රියාත්මක වෙන්නෙ. උදාහරණ විදිහට අපි යම් කිසි ශක්තියක් එක පාරටම රෝදයකට දුන්නොත් ඒ රෝදය කරකැවෙනවා. දැන් ඒක අමුතුවෙන් කරකවන්න ඕන නෑ. අර දීපු ශක්තියෙන් කරකැවෙනවා. මෙතනදි කොච්චරවත් වර්තනයක් තමයි වෙන්නෙ. වර්තනය වෙවී වේගය අඩු වෙනවා. කැරකීම නවතින්න යන කල් යම් කිසි ශක්තියක් දීල තියේ නම්, ඒ ගානට තමයි ඒ කැරකීමට ආයුස තියෙන්නෙ.

පටිසන්ධියෙන් දෙන ආයුස කියන්නෙත් එහෙම දෙයක්. බඹරයක් බිම ගැහුවම හයියෙන් කරකැවෙනවා. ඒක තීක්ෂණ වෙච්ච තරමට කැරකෙන වේගය වැඩියි. හැබැයි රවුමක් කැරකෙන කොට ඒකට බාධකයක් / ප්‍රතිරෝධයක් එනවා. ඒ බාධකයේ තරමට කැරකීමත් අඩු වෙනවා. ඝට්ටනය වෙන්න වෙන්න කැරකීම අඩු වෙනවා. ඒ වගේ පටිසන්ධියේදි ලැබුණු ජීවිතයට ආයුස අඩු වැඩි වෙන්නෙ මේ වර්තනයෙන්. අවසාන වෙන කල් වර්තනයක් තමයි වෙන්නෙ. අන්තිමට වර්තනය නතර වුනාම කැරකිලා වැටෙනවා. හරියට බඹරය කැරකිලා වැටුන වගේ. එතකොට ඒකට හිමි කාලය ඉවරයි. අවසානයේ සිද්ධ වෙන්නෙ චුතිය. ඒ කියන්නෙ කර්මක්ඛය හෝ උභයක්ඛය මරණයක්. ඊට පස්සෙ පටිසන්ධියක් එක්ක අලුත් භවයක් තමයි හදන්නෙ. නමුත් ආයුක්ඛය මරණයක් වුනොත්, වර්තනයේ වේගය තවමත් තියෙන නිසා ඒ ජාතියේම කයක් හදනවා.

දැන් හිතුවොත්, මාස තුනකින් සංජාතිකයාට තමන්ට පරිවාර වන පින් බලයක් නොතිබුණා කියල, දැන් ඒ සංජාතිකයා මිනිස් උපතක් ලැබුවත් ඔක්කන්තිය හෙවත් උපදින්න ඇතුල් වන ගැබ ඉතා දුප්පත් ස්ත්‍රියකගෙ වෙලා එතන උපතට ඇදිල යන්න පුළුවන්. මේ අතර මහත් සිල්වත් පිරිසකට දාන දෙමින් ඒ මියගිය කෙනා වෙනුවෙන් සම්පත් වැඩෙන දාන පින්කමක් නෑදෑයො විසින් සිද්ධ කරල පින් අනුමෝදන් කළා කියල හිතුවොත්, එතකොට ඒ පිනේ ප්‍රතිඵල ගන්න පුළුවන් සුදුසු භවයක ඒ සංජාතිකයා හිටිය නම්, **"උන්න මේ උදකං වට්ටං යථා නින්නං පවත්තති ඒව මේව ඉතෝ දින්නං පේතානං උප කප්පති"** කියන බුදු වදන අනුව, යම් ජල කඳක් මුහුද කරා යන්නේ යම් සේද, එසේම මේ කළ පින එයින් පෝෂණයට සිටින ප්‍රේතයා කරා ගමන් කරයි කියන සිදු වීම සිද්ධ වෙනවා. මේකත් සියුම් විග්‍රහයක්. ජල කඳ එන බව මුහුද දන්නෙ නෑ. ජල කඳත් මුහුද කරා යන බවක් දන්නෙ නෑ. නමුත් ඉවුරු දෙකට මැදි වෙච්ච ජල කඳ පහළට ගලා යෑම ධර්මතාවයක්. ඒ නිසා ඒක එසේම සිද්ධ වෙනවා.

හැබැයි මේ උපමාවෙදි, වහින වැස්ස සාමාන්‍ය පොදු වැස්සක් නම්, ඇල දොළ ගංගාවලට වතුර යන්නෙ නෑ. ☞

ඒක එහෙම්ම පොළවට උරා ගෙන නතර වෙනවා. එතකොට එහෙම වැස්සක් මුහුද කරා යන්න හේතු වෙන්නෙ නෑ. මුහුද කරා යන්න නම් හොඳට පිටාර යන මහ වැස්සක් වහින්න ඕන. එහෙම වැස්සොත් තමයි ඒ වතුර ඇල දොළ ගංගා ආදියට ගිහින් එතැනින් මුහුදට යන්නෙ. ඒ වගේ, **කරන පිනත් මළගිය අයට අනුමෝදන් වෙන්න නම්, චිත්ත ප්‍රසාදය නැගෙන්න පුළුවන් විදිහෙ මහ බලවත් පිනක් වෙන්න ඕන. ඒ කියන්නෙ සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත සිතකින් කරන පිංකමක් වෙන්න ඕන. ඒව තමයි ප්‍රබලම පිං වෙන්නෙ. එහෙම නැත්නම් ඥාතීන්ට පිං අනුමෝදන් කළාට, ඒ පින ඒ අය කරා යවන්න තරම් ප්‍රමාණවත් නෑ.**

තවත් විදියකින් කියනව නම්, හරියට ගොඩ බිමට පිනි බැව වගේ. මොකද ගොඩ බිමට පිනි බැව කියල ඒක මුහුදට යන්නෙ නෑ. හැබැයි ඒ පිනි බැම නිසා වට පිටාවෙ සීතලත්, තෙතමනයත් තියෙනවා. නමුත් ඒක ජලයක් නිෂ්පාදනය කරන්න තරම් ප්‍රමාණවත් නෑ. ඒ නිසා මුහුද කරා යෑමක් සිද්ධ වෙන්නෙත් නෑ. එතකොට එහෙම වෙන්න නම් පොද වැස්සත් මදි, සාමාන්‍ය වැස්සත් මදි, මහ වැස්සක් වැස්සොත් තමයි අර විදිහට මුහුද කරා යන්නෙ. පින් ශක්තිය සංජාතිකයාට ලැබෙන්නෙත් එහෙමයි. එතකොට ඒ සංජාතිකයා ඔක්කන්ති අවස්ථාවෙ හිටිය නම් දැන් ඉන්නෙ මවු කුස තුළ. පාලනය වෙන්නෙ කර්ම ශක්තිය ප්‍රධාන කරගෙන. පින ලැබිච්ච විගස ප්‍රවෘත්ති විපාකය බලවත් වෙනවා. දැන් ඒ සංජාතිකයාට දුගී පැල්පත උරුම නෑ. ඒ නිසා කර්ම ශක්තියෙන් ආපසු ඇදිල ඇවිත් සුදුසු මවු කුසකට ගෙන යනවා. එතකොට අර කලින් කුසට සුදුසු කෙනෙක් හිටියොත්, මවගෙ ජීවය හා සම්බන්ධ ගැබේ හටගත් සිරුරට වෙනත් සුදුසු සංජාතිකයෙක් (අන්තරාභවිකයෙක්) ඇදිල එන්නත් පුළුවන්.

හැබැයි ඒ වගේ අවස්ථාවකදි වුනත්, වෙනත් ගන්ධබ්බයෙක් ඒ ගැබට ඇදිල ආවොත්, එක පාරටම නිකම්ම එහෙම එන්නෙ නෑ. සමහර විට ඊට අවශ්‍ය පරිසරය හැදිල, ඒ මවු ඇතුලු පවුලේ අනෙක් අයගෙත් සසර පිනක් තිබුන නම්, ඒ මවු ගැබට එන්න හේතුව පෑදිලා එනවා. ඒ නිසා තමයි සමහර උදවිය කියන්නෙ, ළමය බඩට ආවම අපිට හරියන්න පටන් ගත්තා, ළමය උපන්නට පස්සෙ අපිට හරි ගියා... ආදී වශයෙන්. ඒක බොරුවක් නෙවෙයි. එහෙම අවස්ථා තියෙනවා. මොකද ළමයගෙ බලවත් පින නිසා ඒ ගෙදර උදවියටත් උපනිශ්‍රය ලැබිල, ඒ අයගෙ සසරෙ තිබිච්ච පෙර පිනක් ඇදිල එන්න හේතු යෙදෙනවා. එහෙම ඇදිල ඇවිත් ඒ ළමය උපන් තැන සම්පත් ගෙන දෙනවා. එහෙම හේතු නැත්නම් තමයි ඒ ගැබෙන් ඉවත් වෙලා වෙනත් තැනකට යන්නෙ.

මේ වගේ අවස්ථාවකදි කලින් හිටපු ගන්ධබ්බය එතකල් හදාගත්තු මස් ලේ කයින් පිට වෙලා ගියත්, ඒ සියුම් මස් ලේ කයේ ජීවය පවත්වන ක්‍රමයක් තියෙනවා. මවුගේ රුධිරය ඇතුළු පෝෂ්‍ය සාරයේ ශක්තියෙන් තමයි ඒ ගන්ධබ්බයට අවශ්‍ය ඔක්සිජන් ලැබෙන්නෙ. දරුවගෙ ශරීරය තනියෙන් ආස්වාස ප්‍රාස්වාස කරන්න තරම් තවම ප්‍රබල වෙලා නෑ. ඒ වුනත් ඒ ළපටි ශරීරය ටික වෙලාවක් යන කල් නිරෝගි ශක්තියෙන් තියෙනවා. උදාහරණ විදිහට කෙනෙකුට වකුගඩුවක් බද්ධ කරන කොට, ඒ වකුගඩුව පැයක්



එකහමාරක් විතර යන කල් නරක් නොවී තියා ගන්න පුළුවන්. සමහර විට ඉදිරියේදි තාක්ෂණයේ තියෙන දියුණුවේ හැටියට එහෙම නරක් නොවී දවස් ගණනක් වුනත් තියාගෙන බද්ධ කරන්න පුළුවන්. ඒ වගේ, ගැබක් නරක් නොවී තියෙන වෙලාවක තවත් ජීවයක් (ගන්ධබ්බයෙක් / සංජාතිකයෙක්) ඇතුල් වෙන්න පුළුවන්. මොකද ඒ ළපටි ශරීරය ගැබ ඇතුලෙ තියෙන කොට එහෙම ලේසියෙන් නරක් වෙන්නෙ නෑ.

ඒ වගේ ගැබ ඇතුලෙ දරුවෙක් හට ගෙන පසුව ගන්ධබ්බය ඒ ගැබින් පිට වෙලා ගියත්, ඒ බාගෙට හැදිච්ච මස් වැදූල්ල / ශරීර කූඩුව හදිස්සියේ කුණු වෙන්නෙ නෑ. ඒක යම් කිසි කාලයක් නරක් නොවී තියෙනවා. ගැබට එන්න ඉන්න ගන්ධබ්බයගෙ කර්ම ශක්තිය බලවත්නම් ඒ හේතුවෙනුත් ඒක රැකිල තියෙන්න පුළුවන්. අන්න ඒ අතර කාලය තුළ ඒ ගැබට එන්න හේතු තියෙන ඒ වගේ තවත් ගන්ධබ්බයෙක් ඇවිත් ඒ මවු කුස තුළම අර මස් වැදූල්ල අල්ල ගෙන වැඩෙන්න පුළුවන්.

දැන් මේ කාලෙ වෙන කොට ඉපදිච්ච ළමයි ගැන පර්යේෂණ කරල හොයා ගත්තු නොයෙක් පුනර්භව කතා තියෙනවා. සමහර විට මෝහනය වගේ ක්‍රමයකින් නිද්‍රා ගත කරල ඒ අයගෙ උප්පත්තිය අහනවා. ඒ සමහර කතා අහන කොට, පෙර අත්බවේ මැරිල තවත් තැනක උපදින්න මාස ගණනාවක් ගිහින් තියෙනවා. අහවල් ස්ථානයෙදි මළා, මේ ස්ථානයෙදි උපන්න කියල කියනවා. ඒ වගේම සමහර විට කලාතුරකින් අවස්ථාවල ඒ පුද්ගලය මැරිල මාස 8 ක් විතර යන කොට තමයි නැවත ළමයෙක් විදිහට ඉපදිලා බිහි වෙලා තියෙන්නෙ. හැබැයි ගැබට මාස 10 ක් විතර ගිහින් තමයි ඉපදෙන්න ඕන. එතකොට මැරෙන්නත් මාස 2 කට පෙරද ගැබට ඇතුල් වුනේ කියල ලොකු ප්‍රශ්නයක් එනවා. මොකද දරුවෙක් බඩේ ඉන්නව නම් මාස 9 - 10 ක් යන කල් උපදින්නෙ නෑ. නමුත් බලන කොට ඉපදිලා තියෙන්නෙ ගැබට ඇතුල් වෙලා මාස 8 කට පස්සෙ. ඒ වගේ අවස්ථා තියෙනවා. හැබැයි ඒකට පිළිතුරු වෛද්‍යවරු දන්නෙත් නෑ.

මාස 2 කට පස්සෙ අර මුලින් තිබිච්ච ගැබෙන් ගන්ධබ්බය පිට වෙලා ගියත්, ඒ පිට වෙච්ච ගන්ධබ්බයගෙ මස් වැදූල්ල තියෙනවා. ගැබ ඇතුලෙ තියෙන නිසා ඒක නරක් නොවී තියෙනවා. දැන් නරක් වෙන්න පෙර එතැන් පටන් මාස 2 කට පස්සෙ එතනට ගැලපෙන වෙනත් සුදුසු ගන්ධබ්බයෙක් ඔක්කන්ති වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ඒ පිට වෙච්ච ගන්ධබ්බයම නැවත ඇදිල ඇවිත් ඔක්කන්ති වෙන්නත් පුළුවන්. එතකොට මාස 8 කින් තමයි දරුව බිහි වෙන්නෙ. නමුත් මාස 10 ක් මෝරපු කයක් සහිතව තමයි උපදින්නෙ. ඉතින් මේ කාරණය තවමත් වෛද්‍යවරුන්ට හොයා ගන්න බැරි වෙච්ච දෙයක්. මොකද සියුම් කර්මජ කය නිසා ඒක විද්‍යාවට අහු වෙන්නෙ නෑ. එතකොට කලින් හිටපු ගන්ධබ්බය ගැබට ඇතුල් වෙලා (ඔක්කන්ති වෙලා) මාස 2 ක් ගිහින් මැරිච්ච නිසා තමයි, ඊළඟ ළමය (ගන්ධබ්බය) ගැබට ඇතුල් වෙච්ච තැන් පටන් මාස 8 ක් ගිහින් උපදින්න

හේතුව. ඒ අවස්ථාවෙ මොකද වෙන්නෙ කියන කාරණය වෛද්‍ය විද්‍යාවෙන් හොයාගන්න බැරි වුනාට, ධර්මානුකූලව සිද්ධ වෙන්නෙ ඕකයි.

මෙතනදි නිබ්බත්ති, අභිනිබ්බත්ති කියල අවස්ථා 2 ක් ගැන ධර්මයේ සමහර තැන්වල පෙන්වා තියෙනවා. නිබ්බත්ති කියන්නෙ නිෂ්පාදනයේ පටන් ගැන්ම. අභිනිබ්බත්ති කියන්නෙ එතැන ඉඳන් නිෂ්පාදනය පටන් ගෙන, ඒ නිෂ්පාදනයට තව තවත් එකතු වෙවී නිෂ්පාදනය වීම. හරියට මුලින්ම කැටයකට කාසියක් දාල, කල් යන කොට තව තවත් කාසි එකතු වෙලා කැටය පිරෙනව වගේ. හැම වෙලාවෙම නැතත් එහෙම සිද්ධ වෙන අවස්ථා තියෙනවා. අන්න ඒ වගේ සඳහන් කරල තියෙන්නෙ, අර විදිහට මුල් ගන්ධබ්බය ගැබෙන් පිට වෙලා ගියාට පස්සෙ ගැබේ ඉතිරි වෙච්ච සියුම් මස් ලේ කයට වෙනත් සංජාතිකයෙක් හෙවත් ගන්ධබ්බයෙක් ඇවිත් සිද්ධ වෙන වැඩීමක් පෙන්වන්න. ඒ විදිහට ජාති, සංජාති, ඔක්කන්ති, නිබ්බත්ති, අභිනිබ්බත්ති, ඛන්දානම් පාතුභාවෝ, ආයතනානං පටිලාභෝ කියල කොටස් 7 ක් ගැන ධර්මයේ සමහර තැන්වල පෙන්වා තියෙනවා.

මීළඟට හතරවනුව තියෙන්නෙ අභිනිබ්බත්ති අවස්ථාව. ඒ කියන්නෙ අභ්‍යන්තර වූ නිපදවීම. දැන් කරජ කාය සඳහා මවුගෙන් හරි කොහොම හරි ඕජස් ලබමින් කරජකායාගේ පෙනෙන සිරුර ගැබක පහල කරනවා. කරජ කායමය වූ රූපත් ඒ ඇසුරින් ලබන වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ පහල කිරීමට සුදුසු පරිදි ඇස, කන, දිව, නාසය, ශරීරය පහල කරනවා. මේ තමයි පස්වනුව තියෙන ඛන්ධානං පාතුභාවෝ කියන ස්කන්ධයන් පහළ කරන අවස්ථාව. දැන් ඒ ජීවියාගෙ ඇසට පෙනීම, කනට ඇසීම, නාසයට ගන්ධය, දිවට රස, ශරීරයට ස්පර්ශය ලබන්න සුදුසු විදිහට සැකසිලා, සංසාරයේ අනන්තව පටන් කරගෙන එන වැඩපිළිවෙළ ඉදිරියටත් ගෙනියන්න මේ ආයතනයන් ලබා ගෙන බිහිවෙනවා. ආයතනානං පටිලාභෝ කියන හයවන අවස්ථාව තමයි ඒ. මේ කාරණා හය එකතු වෙලා ජාති කියන කරුණ සිද්ධ වෙන බව තමයි බුද්ධ භාෂිතය. දැන් කිසිම මත භේදයක් හටගන්න කාරණයක් නෑ.

එතකොට පසුගිය කලාපයෙන් විග්‍රහ කරපු, ගොවියා චුත වෙලා පටිසන්ධියට ඇල්លුවෙ බලු හෘද රූපයක් බව සඳහන් කළා. ඒ නිසා සංජාති විදිහට බල්ලෙකුගෙ නාම රූප, ඒ ගති නිමිති අනුව හැඳුණු විඤ්ඤාණයෙනුත් නැවත ප්‍රබල කරමින් ගති කය විදිහට ලබනවා. ඒ සංජාති වූ සූක්ෂම ශරීරය ලැබුනම දැන් ඒ සංජාතිකයා බලු යෝනියට අයිතියි. (මේ වගේ අවස්ථාවන් බොහොමයක් සමාධියෙන් අත්දැකල තියෙන බව වහරක අභයරතනාලංකාර හිමියන් පවසනවා. ඒ වගේ අවස්ථාවක් හෙළ බොදු පියුම 38 වන කලාපයේ අභයරතනා-ලංකාරය තුලින් ඉදිරිපත් කරල තියෙනවා.) ඒ ස්ථානයේ බලු රැලක් හිටිය නම්, අනියම් ස්ත්‍රිය ගැන බැඳුණු ගතියක්, නාම රූප විදිහට නැගෙන නිසා ගති පරිසරය විදිහට අහුවෙන්නෙත් ඒ ප්‍රදේශයමයි. ඒ ප්‍රදේශයේ ඒ ගෙදර බල්ලන් හිටිය නම්, ඒ බලු රැලට කර්ම ශක්තියෙන් මෙහෙයවල බලු සංජාතිකයා (ගන්ධබ්බයා) බලු රැල ඇසුරෙ ගැවසෙනවා. ඒ කර්ම ශක්තිය මුල් කරගෙන සුදුසු ගැබකට කරුණු පිහිටනවා. බලු සංවාසයකදි හේතු ලබන ගන්ධබ්බයා, සුළියකට අහු වුණා වගේ කර්ම ශක්තියේ බලයට අහු වෙලා සූක්ෂම පරමාණුක හෘද රූපයෙන් ගැබ තුළ කළලය අල්ල ගෙන ඔක්කන්ති අවස්ථාවට එළඹෙනවා. දැනීමත්, විඳීමත් හැර ඉන් එහා හිතන්නවත් මොළයක් නැතිව, පරිවාර කර්ම විදිහට සැඩ ගති ලබමින් රැස් කරන, පතන බලාපොරොත්තු යටපත් කරල, විඳින්නත් දැනගන්නත් පමණක් මොළය ඇතිව ඒ බලු සංජාතිකයා දැන් කරජ කායක් සමගින් ගැබ තුළ නිපදවෙන අභිනිබ්බත්ති අවස්ථාවට එළඹෙනවා.

එතැන් පටන් රූපය බලු වේශයෙන් කරජකාය (ඝනීභවනය වූ කය හෙවත් මස් ලේ කය) නිපදවමින් බල්ලෙකුට හිමිවන විදිහට රූපයත්, වේදනාව හෙවත් දැනීමත්, සංඥා හෙවත් හැඳිනීමත්, සංඛාර හෙවත් මොට වූ ලසු වූ රැස් කිරීමත්, විඤ්ඤාණය බල්ලෙකුට අදාල බලාපොරොත්තුවක් නැගෙන විදිහට ඇස, කන, දිව, නාසය, ශරීරය පහල කරමින් ඛන්ධානං පාතුභාවෝ කියන අවස්ථාව ක්‍රියාත්මක වෙනවා. ඒවා සම්පූර්ණ කරමින් ළපටි මෘදු ශරීරයකින් සංජාති අවස්ථාවේ ගති ලක්ෂණත් උරුම කරගෙන ගතියට අනුව වැඩෙන ශරීරයකටත් ආකාර, ලිංග, නිමිති, උද්දේස, ප්‍රඥප්ති ආදියටත් අනුකූල හිමිකම් උරුම කරගෙන, එපමණකින් වැඩීම සම්පූර්ණ වන ගති උරුම කරගෙන බලු පැටියෙක් විදිහට උපදිනවා. දැන් ඒ සත්වයාට ආයතනයන්ගේ යළි ලැබීම සිද්ධ වෙලා ඉවරයි. මේ තමයි ආයතනානං පටිලාභෝ කියන අවස්ථාව. එතැන් පටන් ඒ ජීවිතය අවසන් වෙන කල්ම, කර්ම ශක්තියේ බලය නෑයා කරගෙන, පිළිසරණ කරගෙන, දායාද කරගෙන, කරපු පාපයන්ගේ විපාකවලට සුදුසු විදියට ප්‍රතිඵල ලබමින් ජීවිතය පවත්වනවා. විපාක වශයෙන් තිරිසනාට පිහිටන්නෙ ආහාර, නිද්‍රා, භය, මෛථුන කියන කාරණා 4. ආහාර කියන්නෙ, ආහාර සොයා ගැනීමේ ඉඩ / හැකියාව තිරිසනාට තියෙනවා. ඊට පස්සෙ ඒ සතාට නිදා ගන්න ඕන නම් ඒකට අවස්ථාව ලැබෙනවා. භය කිව්වම ජීවිත ආසාව සහ මරණ භය ඇති වෙනවා. මෛථුනය කියන්නෙ කාම සේවනය. ඒකට අවස්ථාව තියෙනවා.

දැන් මේ ජාති, සංජාති ... ආදී වශයෙන් පෙන්වන අවස්ථා 6, මස් ලේ කය සහිත සත්වයෙක් පහළ වීමට විතරක් නෙවෙයි, ඒ ඒ මොහොතක පහළ වන අවස්ථාවන්වලටත් යොදා ගන්න පුළුවන්. උදාහරණ විදිහට අඹු දරුවො, දේපළ ඉඩ කඩම්, යාන වාහන, රන් රිදී, මුතු මැණික් ... ආදී මේ සියල්ලම ජාති බව ජාති ධර්ම සූත්‍රයේ විග්‍රහ වෙනවා. දැන් මේ කියන ජාති ලෝකයට පහළ වෙලා තියෙන කොට, ඒවා හරි වටිනවයි කියල ආස්වාදයෙන් ගත්තම සංජාති බවට පත්වෙනවා. ඔය ආදී වශයෙන් මේ අවස්ථා 6 විවිධාකාරයෙන් විග්‍රහ කරන්න පුළුවන්. නමුත් ඒ කාරණය මේකත් එක්ක පටලවා නොගත යුතු නිසා, මෙතනදි ප්‍රධාන වශයෙන් විග්‍රහ කළේ සත්වයෙකුගේ පහළ වීමට අදාලව අවස්ථා 6 ක සම්පිණ්ඩනය.

විශේෂයෙන් මෙතන ඉන්නෙ සත්වයෙක් / පුද්ගලයෙක් නෙවෙයි, හේතු ඵල ක්‍රියාවලියක් බව පෙන්වන්නත් මේ විග්‍රහය වැදගත් වෙනවා. ඒ කියන්නෙ මේ නාම රූප ධර්ම කියන ඒවා එක විදිහකට පවතින සත්වයෙක් / පුද්ගලයෙක් නෙවෙයි. නමුත් ලෝකයා මේ අවස්ථාව ඝන සංඥාවෙන් අරගෙන සත්වයෙක් / පුද්ගලයෙක් ඉන්නව කියල හිතාගෙන ඉන්නවා. හැබැයි මේ තියෙන්නෙ හේතු ඵල පරම්පරාවක්. එහෙම නැත්නම්, මේ ඉන්නෙ ඒකාකාරීව පවතින සත්වයෙක්, මමත් එයින් එක්කෙනෙක් තමයි කියල මාන්නයක් හදා ගන්නවා. එතකොට ලෝකයේ තියෙන සම්පත් මම, මගේ කර ගන්න පොර කනවා. මම මෙහෙම කෙනෙක් කියල මාන්නයක් හදා ගන්නවා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# කේන්ද්‍රයෙන් පෙන්වන හේතු ඵල දහම ....

**5 වන කොටස**

පසුගිය කලාපයෙන් විශේෂයෙන් පැහැදිලි කළේ හතර කේන්ද්‍රය පාළු අයගෙ ස්වභාවය ගැන. ඉතින් හතර කේන්ද්‍රය පාළු වුනත් ඒ හැමෝම ඒකෙන් දුක් විඳින්නෙ නෑ. පින් කුසල් නිසා හතර කේන්ද්‍රය පාළු වෙන කොටසකුත් ඉන්නවා. එතකොට අනිත් අය කතා කරල ඒ පුද්ගලයව නගා සිටුවනවා. තමන් දන්නෙම නැතිව ජයග්‍රහණය කරනවා. ඒ වගේම පාපය නිසා හතර කේන්ද්‍රය පාළු වෙන කොටසකුත් ඉන්නවා. එතකොට උන් හිටි තැන් නැති වෙනවා.

ඒ වගේම කුජ 1 ට ආවොත් හිසට වෙඩි වදිනව (මොනව හරි පහරක් එල්ල වෙනවා) කියන කාරණයත් පැහැදිලි කළා. හැබැයි ඒ ඒක පැත්තක් විතරයි. එතනදිත් ග්‍රහය කොටුවේ තැන්පත් වෙලා තියෙන අංශක ගණන අනුව වෙඩි වදින ස්ථානය වෙනස් වෙන්න පුළුවන්. ඒ වගේම හිසට වෙඩි වදිනව කිව්වම, මස් ලේ හිසට වෙඩි නොවැදී, ඒ වගේ අවස්ථාවක මානසික පරිවර්තනයක් වෙන්න පුළුවන් බවත් පැහැදිලි කළා. හැබැයි ඒ කාරණය බලන්න ඕන අනික් ග්‍රහයින්ගෙත් පිහිටීම මත. ඒ සියල්ලම සලකා බැලුවම තමයි හරියට ප්‍රතිඵලය කියන්න පුළුවන් වෙන්නෙ.

උදාහරණ විදිහට රවි, බුධ සමග 10 වැන්නෙ ඉන්නව නම් ඥාන යෝගයක්. රවිගෙන් පෙන්වන්නෙ ක්‍රියාකාරීත්වය. බුධ දූන ඉගෙනීමට සම්බන්ධයි. 10 වැන්න නව නිෂ්පාදනයන්ට සම්බන්ධයි. මේ තුනේ සංකලනයෙන් තමයි ඥාන යෝගය එන්නෙ. ඒ වගේම ගුරු රෝගස්ථානයේ හෙවත් සතුරු ස්ථානයේ (6 වැන්නේ) හිටියොත් ඒ පුද්ගලයට නිතර නිතර රෝගාබාධ හැදෙන්න පුළුවන්, සතුරු කරදර එන්න පුළුවන්. මොකද ගුරු කියන්නෙ ප්‍රධාන වශයෙන් ගුරුහරුකම් දෙන ග්‍රහයා. ඒ වගේම ප්‍රමාණයෙන් ගත්තත් විශාලම ග්‍රහයා. ඉතින් රෝගස්ථානයේ පිහිටියොත් ඒ අවශ්‍ය ගුරුහරුකම් ශක්තිය හරියට නොලැබී ප්‍රවෘත්ති විපාක හඹා ඒම වැඩි වෙන්න පුළුවන්. ඒ වගේම සිකුරු පුණ්‍යස්ථානයේ හෙවත් 9 වැන්නෙ පිහිටියොත් ඒ පුද්ගලය ලේසියෙන් කාමයන්ට පොළඹවන්න බෑ. සිකුරු කියන්නෙ කාමයට අධිපති. පුණ්‍යස්ථානයෙන් කරන්නෙ පිනට දහමට නැඹුරු වෙලා දන් දෙන එක. එතකොට කාම සම්පත්තිය බාල වෙනවා. ඊළඟට සඳු 8 වැන්නෙ හිටියොත් මවුගෙන් රැකවරණය නොලැබෙන්න පුළුවන්. සඳු මවුට සහ හිතට සම්බන්ධයි. ළමයෙකුට ප්‍රධාන වශයෙන්ම ආරක්ෂාව දෙන්නෙ මව. 8 වැන්න කියන්නෙ මාරකස්ථානය. මාර කිව්වම රක්ෂණයෙන් මිදෙනවා. එතකොට මවුගෙන් එන ආරක්ෂාව, ලැබීම් අඩු වෙලා කරදර එන්න පුළුවන්.



හැබැයි මේ විදිහට ඒ ඒ ග්‍රහයින්ගෙ තැන්පත් වීම අනුව පලාඵල කියන්න නම්, මීට පෙර විග්‍රහ කළා වගේ ඒ ඒ කොටුවෙ ග්‍රහයා තැන්පත් වෙලා ඉන්න අංශක ගණනත් බලන්න ඕන. එක කොටුවකට අයිති අංශක 30 ළදරු, ළමා, තරුණ, මැදි, මහළු කියල අවධි 5 කට බෙදුවම, එක අවධියකට අංශක 6 ක් එනවා. ග්‍රහය ඉන්නෙ ඒ රාශියේ කී වෙනි අංශකයෙද කියල බලන්න ඕන. ඒ අනුව තමයි හරියට ප්‍රතිඵල කියන්න පුළුවන් වෙන්නෙ. එතකොට ග්‍රහය ළදරු කාලයේ නම් බලවත් නෑ. ළමා කාලය නම් සාමාන්‍යයි. තරුණ කාලය විශේෂයි, බොහොම බලවත්. මැදි කාලය සාපේක්ෂව හොඳයි. මහළු වයසත් බොහොම දුර්වලයි. ඒ කියන්නෙ අංශක 1 - 5, 25 - 30 කියන ළදරු / මහළු අවධියේ ග්‍රහයො තැන්පත් වෙලා ඉන්නව නම් මොන කොටුවෙ හිටියත් ඒක බලවත් නෑ, දුර්වලයි. ඒ නිසා ග්‍රහය රාශියක හිටිය පලියට ප්‍රතිඵල කියන්න බෑ. උදාහරණ විදිහට මිථුන, බුධට අයිතියි. හැබැයි බුධ ලග්නස්ථානයේ (1 වැන්නේ) තැන්පත් වෙලා හිටියත් ඒ ළදරු (අංශක 1-5) හෝ මහළු (අංශක 25-30) අවස්ථාවක නම් ප්‍රතිඵල දුර්වලයි. නමුත් අද ග්‍රහ පලාඵල බලන කොට මේ කාරණය සැලකිල්ලට ගන්නෙ නෑ. රාශියේ බුධ ඉන්නව කිව්වොත්, ඒක විතරක් අරගෙන ප්‍රතිඵල කියන්න යනවා. නමුත් එතකොට ප්‍රතිඵල වරදිනවා.

ඊළඟට කේතු 7 වැන්නෙ ඉන්න කොටත් විවාහයට බාධකයි, පවුල් කඩාකප්පල් වෙනවා ... ආදී වශයෙන් කියනවා. නමුත් ඒකෙත් දෙපැත්තක් තියෙනවා. හොඳට වගේම නරකට හිටින අවස්ථාත් තියෙනවා. කේතු 7 වැන්නෙ හිටියම හොඳ පැත්ත ගත්තොත්, ඒ පුද්ගලය තනිකඩව ඉදෙද්දිත් අනිත් අය විසින් කන්න බොන්න දීල නගා සිටුවන්න පුළුවන්. ඒ කියන්නෙ පින් පැත්ත වඩල තිබුණොත් පවුල් ජීවිතයක් නැතත් කාගෙන් හරි උදව් ඇවිත් ජීවිතය නගා සිටුවනවා. කේතු පාප පැත්තට හිටියොත්, විවාහ කෙනෙක් නම් පවුල් කඩාකප්පල් වෙන්න පුළුවන්. ඒ වගේ රැකි රක්ෂා නැති වන අයත් දෙගොල්ලක් ඉන්නවා. එක කොටසක් තමන්ට ධනය සම්පත් තියෙන නිසා රැකි රක්ෂා කරන්නෙ නෑ. අනික් කොටස තමන්ට එහෙම අවස්ථාවක් නැති නිසා රැකි රක්ෂා කරන්නෙ නෑ. මේ විපාක 2 ක්. කේතු 7 වැන්නෙ හිටියමත් මේ වගේ දෙපැත්තක් තියෙනවා.

ඒ වගේම යම් කිසි පුද්ගලයෙක් කරපු යමක් ඇත්නම්, ඒක විපාකයට ඇදල එන්න ඊට සමාන පරිසරයක් ගොඩ නැගෙන්න ඕන. මේ විදිහට ගොඩ නැගෙන පරිසරය ජ්‍යොතිෂ විද්‍යාව තුළ ඊට ගැළපෙන කාල පරාසයකින් ඒ රටාවට අනුව පෙන්වල තියෙනවා. මේ කාලයට මේ දසාව එනවා .... ආදී වශයෙන් ☞

ජ්‍යොතිෂ විද්‍යාව තුළ දසා ක්‍රමයක් තියෙනවා. මෙතනදි දසාව කියල හඳුන්වන දසා කාල 9 යි තියෙන්නෙ. මොකද නවග්‍රහයො හරහා තමයි ඒ දසා කාලය එන්නෙ. **දසාව කියන්නෙ දාස බවට ආවයි කියන එක. දසාවෙ නිරුක්තිය බැලුවම ඒ කාරණය පැහැදිලි වෙනවා. දස + ආව - දසාව. වහල් වෙනව කියන එකම තමයි මේ කියන්නෙ. යම් කිසි කෙනෙක් දේපළකට, මිල මුදලකට, ඉඩ කඩම්වලට හෝ වෙනත් යමකට වහල් වෙලා කටයුතු කරන්න පුළුවන්. එහෙම නැත්නම් යහපතින් ජයග්‍රහණයක් ලබන්න ඕන නිසා කාට හරි වහල් වෙලා කටයුතු කරන්නත් පුළුවන්. හොඳ නරක දෙපැත්තටම වහල් වෙනව කියන එක තමයි දාස වෙනව කියන්නෙ. දාසකම් කරනව කියන්නෙත් ඒකයි. ඒ කියන්නෙ මේ හැම සත්වයෙක්ම ලෝකයට දාස වෙලා ඉන්නෙ. මොකද ග්‍රහණය කරගත්තොත් දාස බවට පත් වෙන්න සිද්ධ වෙනවා. එතකොට දසාව ග්‍රහයන් හරහා තමයි විපාක දෙන්නෙ. ග්‍රහණයෙන් සම්පූර්ණයෙන්ම මිදුනයි කියන්නෙ අරිහත් ඵලය. එතකොට දාස භාවයෙනුත් මිදෙනවා. එතකල් හැම කෙනෙක්ම ලෝකයට විවිධ පැතිවලින් දාස වෙලා ඉන්නෙ. කාගෙ හරි ග්‍රහණයට අහු වුනොත් දාස භාවයට පත් වෙනවා.**

උදාහරණ විදිහට හාමුදුරු නමක් පොඩි ළමයෙක් මහණ කළා කියල හිතුවොත්, දූන් ඉතින් කියන දේ අහල දාසය වගේ ඉන්න ඕන. කියන විදිහට ඉගෙන ගන්න ඕන. ඒකට දුක් විඳින්න ඕන. දැනුවත් වෙන්න නම් එහෙම කරන්න ඕන. හැබැයි ඒ යහපත් පැත්තට. නරකට වුනත් ඒ වගේම තමයි. කාගෙ හරි ග්‍රහණයට අහු වුනොත් දාස බවට පත් වෙලා ඒ කියන විදිහට වැඩ කරන්න ඕන. පෙර කාලෙ තිබ්බ්ච සම්ප්‍රදායට අනුව ළමයෙක් වුනත් අවුරුදු දාසය වෙන කල් බාල වයස්කාර විදිහට තමයි සැලකුවෙ. එතකොට කාගෙ හරි රැකවරණයක් යටතෙ කියන දේ අහල ඒ විදිහට ඉන්න ඕන. ඒ කියන්නෙ දාස බවට පත් වෙලා. අවුරුදු දාසයෙන් පස්සෙ තමයි ඒ තත්ත්වයෙන් මිදෙන්නෙ. ලෝක සම්මත කතාවටත් ඒ කාරණය ගැලපෙනවා.

මේ කොයි පැත්ත වුනත් යම් කිසි ග්‍රහයෙක්ගෙ මහ දසා කාලයක් ආවම දාස බවට පත් වෙච්ච හේතුවේ හොඳ හෝ නරක ප්‍රතිඵලය තමයි ඒකෙන් එන්නෙ. උදාහරණ විදිහට සෙනසුරුගෙ මහ දසාවක් ආවොත් ඒ අපලය හෝ සපලය ගෙවන්න වෙනවා. නමුත් මේ දසාවෙ කාල පරාසය ගත්තම ග්‍රහයො 9 දෙනාට නව ආකාරයි. මනුස්සයෙකුගෙ පරමායුස අවුරුදු 120, 9 ට බෙදල රවිට 6 යි, සඳුට 10 යි, කුජට 7 යි, බුධට 17 යි ... ආදී වශයෙන් කියන්නෙ ඒ ඒ දසාවන්. ඕක තවත් සියුම් වෙන කොට අතුරු දසාව කියල එකකට බෙදෙනවා. එතකොට රවිගෙ රවි දසාව, රවිගෙ සඳු දසාව, රවිගෙ කුජ දසාව ... ආදී වශයෙන් ග්‍රහයො 9 දෙනාටම ඒ ක්‍රමය එනවා. ඊළඟට විදසාව කියල එකක් තියෙනවා. ඒ කියන්නෙ අතුරු දසාවක් නැවතත් ඒ වගේම 9 කට බෙදෙනවා. ඊළඟට සූක්ෂම දසාව කිව්වම ඒ විදසාවත් තවත් 9 කට බෙදෙනවා. අන්තිමට අති සූක්ෂම දසාව කිව්වම සූක්ෂම දසාවත් 9 කට බෙදෙනවා. අති සූක්ෂම කියන්නෙ පැය ගණනට බලන ක්‍රමයක්. කෙනෙක්ගෙ ජීවිත කාලය හුඟක් සියුම් කරල පැය ගණනට දසා බලන ක්‍රමයක් තියෙනවා.

මේ මහ දසාවක් ගත්තම අපල සහ සපල දෙකටම පොදුවේ එන කාල 9 ක් තියෙනවා. නව ග්‍රහයින්ගෙන් තමයි ඒ කාල 9 එන්නෙ. ඒ කියන්නෙ දස අකුසල හෝ දස කුසල කර්මයක් කළාම නව ග්‍රහයො හරහා ඒ දහය ප්‍රති විපාක දුන්න හැටි එදා හිටපු ඍෂිවරු දැක්කා. මේ දහය ආවෙ මේ මේ කාලවල මේ මේ පරිසරයෙදි .... ආදී වශයෙන් ඒක හැඩ ගැහුණ හැටි පෙන්වල, ඒ පටන් ගත්තු තැන ඉඳල කුසල් හෝ අකුසල් 10 ආපු හැටි කාල 9 කට වෙන් කරල පෙන්නුවා. දස පුණ්‍ය ක්‍රියාවක යෙදිල හිටිය නම් දසාව එන්නෙ හොඳ පැත්තට. දස අකුසලයක යෙදිල හිටිය නම් දසාව එන්නෙ නරක පැත්තට. උදාහරණයක් විදිහට ප්‍රාණ ඝාතයක් කරල තිබුණ නම් දසා නවයෙන් එකක් නරක පැත්තට පිහිටනවා. අභය දානයක් දීල තිබුණ නම් 9 න් එකක් හොඳ පැත්තට පිහිටනවා. ප්‍රාණ ඝාතය මුල් කරගෙන අනුන්ට හිංගි හිංසා කරපු යම් කාලයක් ඇත්ද, ඒ කියන්නෙ ඒ නවයෙන් ඒ විපාක ලබන කාලය එළඹිලා නම්, නරක දසාවක් ඇවිත් තියෙන්නෙ කියල කියනවා. දස අකුසලය මුල් කර ගෙන යමක් සිද්ධ වුනා නම් ඒක විපාක දෙන කාලයට ඒ නරක දසාව ලබනවා. ඒ වගේම තමයි කරපු හොඳ ක්‍රියාවක් මුල් කරගෙන විපාක දෙන කොට දසාව හොඳ වෙනවා. මේ ආකාරයෙන් දසාව හොඳ නරක දෙපැත්තටම තියෙනවා.

උදාහරණයක් විදියට කියනව නම්, සෙනසුරුගෙ දසාව නරකයි කියල කියනවා. හෙණයට හුරු වුන, එහෙම නැත්නම් අනුන්ගෙ විනාසයට කටයුතු කරපු කොටස ආවම හෙණහුරුගෙ නරක දසාවක් තමයි එන්නෙ. නමුත් සෙනසුරු දසාව හොඳට පිහිටපු කෙනාට කෙළවරක් නැති ලැබීම් එනවා. දසා 9 න් එහෙම දසාවක් එන කොට, විනාසයට හුරු වන පැත්ත වළක්වල දීපු අයගෙ දසාව එන්නෙ හොඳ පැත්තට. උදාහරණ විදිහට කෙනෙකුට ආපු මාරක බාධක, හෙණ ගැහුව වගේ වළක්වල හොඳ පැත්තක් ලබා දෙන්න පුළුවන්. ඒ කියන්නෙ කෙනෙක්ගෙ පාපයට හෙණ ගස්සවනවා. එතකොට ඒක යහපතට හේතු වෙනවා. ඒ වගේම දුක්පත් මනුස්සයෙක්ගෙ දුක්පත්කමට හෙණ ගැස්සෙව්වයි කියන්නෙ දුක්පත්කම නැති කරල ඒ මනුස්සයට ගොඩ එන්න අත හිත දුන්නයි කියන එක. එහෙම කරපු අයට සෙනසුරුගෙ හොඳ දසාව ලබනවා. එහෙම නැත්නම් ඒ කාලයෙදි මාරක බාධක නම් දීල තිබුණෙ නරක පැත්තට බලපානවා.

ඒ වගේම කෙනෙක්ගෙ හිතට වද දීල තිබුණ නම් සඳුගෙ දසාව නරක විදිහට එනවා. හිතේ සතුට ඇති වෙන විදිහට කටයුතු කරල තිබුණ නම් සඳුගෙ හොඳ දසාව එනවා. ඒ වගේම නරක පැත්තට සටන් කළොත් කුජගෙ නරක දසාව. යහපතට සටන් කළොත් කුජගෙ හොඳ දසාව. කුඩා දරුවෙක් බොහොම චාරිත්‍රවත්ව සුචරිතවත්ව හදන්න යම් පිරිසක් උනන්දු වෙන කොට, තව පිරිසක් කුඩා දරුවන් දුසිරිතට ලක් කරන්න උනන්දු වෙනවා. බුධ කියන්නෙ ඉගෙනීම්වලට, පොඩි අයට ආධාර උපකාර කරපු කාලය. පොඩි දරුවෙකුට කවල පොවල ඇති දැඩි කරන්න ඕන, ගුණ ධර්ම උගන්වන්න ඕන, හරි හම්බ කරල දෙන්න ඕන. ඉතිං ඒකට අවශ්‍ය විදියට කෙනෙක් කටයුතු කරන කොට, තව කෙනෙක් අවස්ථාව බලල අයුතු ප්‍රයෝජන අරගෙන දුෂ්චරිතයට පොලඹවන්න උත්සාහ කරන්න පුළුවන්. ඒ කියන්නෙ පොඩි දරුවෙකුට කරන ලද වැඩ සහ අවැඩ. ඒකට හිමි දසාව තමයි බුධ දසාව. දුෂ්චරිත, පාප කර්ම කරපු කෙනෙකුට දසාව ආවොත් බුධගෙ නරක කාලයක් තමයි ලබන්නෙ. සුචරිතව යහපත්ව කරපු කටයුතු ඒ කාලෙදි ආව නම්, බුධගෙ දසාව යහපත් වෙනවා. මේ ආකාරයට නවග්‍රහයින්ගෙන්ම එන එකම දසාව, හොඳ සහ නරක දෙපැත්තටම පිහිටන්නෙ කරපු පිං පවු අනුව කියල අවබෝධ කරගන්න ඕන.

අපල උපද්‍රව, දුක් කරදර මනුස්සයින්ට ඇති වෙන්නෙත් හේතුවක් ඇතිව. බලාපොරොත්තු වෙන්නෙ හොඳක් වුනාට, වැඩියෙන්ම ලැබෙන්නෙ දුක් කරදර. මොකද, සසරෙදි වැඩි හරියක් කරල තියෙන්නෙ හොඳ දේවල් නෙවෙයි. අවැඩ අසාධාරණ කියන නරක පැත්ත තමයි වැඩියෙන්ම කරල තියෙන්නෙ. ඉතිං පෙර සසරෙ කරපු නරක පැත්ත විපාක විදියට එනකොට තමයි මෙහෙම අපල කාලයක් එනව කියන්නෙ. ඒක එක ☞

පාරටම ගෙවිල යන්නෙත් නෑ. මේ වගේ අපල උපදුව අවස්ථාවලදී බුදුන්, දහම්, සඟුන් කෙරෙහි චිත්ත ප්‍රසාදය ඇති කරගෙන වැඩ කටයුතු කරන්න ඕන. සමහර අවස්ථාවලදී අපල උපදුවවල බරපතලකම නිසාම, තුණුරුවන් කෙරෙහි සිත පැහැදීම පවා සිද්ධ නොවෙන්න පුළුවන්. ඒ වගේ වෙලාවට මේ අපල උපදුව ඉවත් කර ගන්න නව ගුණ යන්ත්‍රය හුඟක් උපකාරී වෙනවා. ඒ වගේ නව ගුණ යන්ත්‍රයක් හරියට හදා ගන්න හැටි හෙළ බොදු පියුම 13 වන සඟරා කලාපයෙන් පැහැදිලි කරල තියෙනවා.

කෙනෙක් ලෞකික වශයෙන් යම් කිසි කර්මයක් කරන කොට ඒකට සීමා සහිත විපාකයක් උරුම වෙන සීමා සහිත අසාධාරණයක් වෙලා තියෙන්න පුළුවන්. පින් පවු දෙකෙන් හැදිච්ච මේ ලෝකයේ ජීවත් වෙන කොට ලෞකික වශයෙන් මොන විදියකින් හරි කර්මයක් කළොත් බොහෝ කොටම ඒකට සීමා සහිත අසාධාරණයක් සම්බන්ධයි. හැබැයි ආනන්තරීය පාප කර්මයක් නොවන අවස්ථාවලදී, උතුම් වූ බුද්ධෝත්පාද කාලයකදී, අප්‍රමාණ කුසලයක් නගන්න පුළුවන් සාසනයක් තියෙන කාලයක, ඒවාට වන්දි ගෙවා ගන්න පුළුවන්කමක් තියෙනවා. අකුසලයක් කරපු කෙනෙකුට, කර ගත්ත කුසලයකින් වන්දි ගෙවීමේ හැකියාව තියෙනවා. කෙනෙක් අතින් යම් කිසි අවැඩක් වුනාම, සමහර වෙලාවට මෙච්චර වන්දියක් ගෙවන්න කියල සිදු වෙන අවස්ථා තියෙනවා. ඒකෙන්, කරපු අසාධාරණයට වන්දි ගෙවල නිදහස් වෙන්න පුළුවන්. නොගෙව්වොත් විඳින්න සිද්ධ වෙනවා. ලෝක සම්මත නීතිය තුළත් මේ කාරණය දකින්න තියෙනවා. වැරැද්දක් කරල නීතියෙන් වන්දි ගෙවන්න කියල නියම වුනොත් ගෙවන්න ඕන. නැත්නම් හිරේ ලගින්න ඕන. මේ වගේ අපි හැමෝම බැහැල ඉන්න තැන ක්‍රියාත්මක වෙන්නෙ ලෝක අධිකරණයෙන්. මේ ලෝක අධිකරණය තුළ කර්මයට විපාකය ගෙන දෙන යම් ක්‍රම රටාවක් තියෙනවා. ඒක කිසි කෙනෙකුට වෙනස් කරන්න හැකියාවක් නෑ. පාප කර්මයක් කළොත් දුක්ඛිත විදියට හරි හම්බ කරල හෝ මේ ලෝකයට වන්දි ගෙවල නිදහස් වෙන්න ඕන. තමන් ලෝකයට යම් අවැඩක් කළා නම්, ඒ අවැඩ සංසිඳුවාලන්න, තමන් ඒ ණය ගෙවන කල් බේරෙන්න බෑ.

යම් කිසි අපලයක් තියෙනව නම්, ඒ අපලය කොයි වගේ එකක්ද, ඒකට හේතුව මොකක්ද කියල හොයා ගන්න ඕන. ඒක මාරකයක් එන අපලයක්ද ? කොයි විදියෙ මාරකයක් එන අපලයක්ද ? එහෙම නැත්නම් හිඟා කන්න සිද්ධ වෙන ජාතියේ අපලයක්ද ? කොයි ආකාරයට ඵල දෙන අපලයක්ද ? ... මේ ආදී වශයෙන් ඒ පිළිබඳව විස්තර කරන්න හැකියාව තියෙන්න ඕන. මේ අපල කියල එන්නෙ කර්ම විපාකයන්. ජ්‍යොතිෂය අනුව අපලය ඇති වෙච්ච හැටි පේන්නෙ නෑ. නමුත් ප්‍රතිඵලය පේනවා. ඒ ප්‍රතිඵලය මුල් කරගෙන අභවල් ග්‍රහයගෙන් මෙහෙම අපල කරනවා, සෙනසුරු මහා අපලකාරී ග්‍රහයෙක්, සෙනසුරු ලබපු කාලෙට ලොකු අපල එනවා ... ආදී වශයෙන් ග්‍රහ වස්තු පිට අපල ප්‍රශ්නය දාල, ඒ ග්‍රහයො නිසා තමයි මෙහෙම වෙන්නෙ කියල සමහරු හැඟීමක් ඇති කරවනවා. මේ හැඟීම බුදුන් වහන්සේ වැඩ ඉන්න කාලෙත් ජ්‍යොතිෂවේදීන් දුන්න නිසාම තමයි, නුඹලා කර ගත්ත පාප කර්ම නුඹලාට ඵල දෙනවා, ග්‍රහ වස්තු ඒවාට මොනව කරන්නද කියල උන් වහන්සේ දොස් කිව්වෙ.

ඒ කියන්නෙ ග්‍රහ වස්තු ක්‍රියාත්මක වීමක් නෑ කියන එක නෙවෙයි මේ පෙන්නුවෙ. තමන් කරපු කර්ම වේගයට අනුකූලව විපාක ඵලයක් හට ගන්න යම් කිසි දෙයක් සිද්ධ වෙන බව මනුස්සයො දන්නෙ නෑ. ඍෂිවරු දන්නෙත් එක්තරා සීමිත ප්‍රමාණයක්. ඍෂිවරු තමන්ගෙ සමාධියට හිත යොමු කරල බැලුවම, ක්‍රියාත්මක වන ක්‍රියාදාමය ප්‍රතිඵල වශයෙන් පෙන්වා දුන්නා. එතැන් පටන් දිවැසට පෙනිල, අභවල් ග්‍රහයගෙන් තමයි මේ කිරණ එන්නෙ කියල පෙන්වා දුන්නා. මේ කිරණ වැදිල මෙහෙම තමයි විස වෙන්නෙ කියල පෙන්වා දුන්නා. මේ ආකාරයට ඒ ඒ ග්‍රහයගෙ අපලෙ තමයි මේ ඵල දෙන්නෙ කියල පෙන්වා දුන්නා.

ඒ අපල දුරු කරගන්න ක්‍රමවේද විදිහට මැණික් පැළඳවීම ආදිය කළාම, ඒ ග්‍රහයගෙන් එන කිරණ ශරීරයට නොවදින බවත්, අහකට විසි වෙන බවත් පෙන්වා දුන්නා. මේ විදියට ඍෂිවරු තමන්ගෙ දිවැසට දැක්ක කොටස පෙන්වා දුන්නා. ඒ තමයි ඍෂිවරුන්ගෙ දිවැස්වල මට්ටම. නමුත් බුදුන් වහන්සේගෙ දිවැසට එහෙම කොටසක් විතරක් නෙවෙයි පේන්නෙ. කිසි අඩුවක් නැතුව සියල්ල සියලු ආකාරයෙන් උන් වහන්සේගෙ දිවැසට පේනවා. සර්වඥතා ඥානයෙන් යුක්ත බුදු මනසට නොපෙනෙන දෙයක් නෑ. ඒ නිසා බුදු රජාණන් වහන්සේ ඒ කාරණය හරියට පෙන්වා දුන්නා. අපලයට හේතුව ග්‍රහයගෙන් නිකුත් වන කිරණයට එහා ගිය දෙයක් බවත්, කෙනෙක් කරන ලද හොඳ හෝ නරක හෝ කර්මයක් ඇත්ද, එතැනට එනකල් මේ අපලය දිවෙන බවත් පෙන්වා දුන්නා. එතැනින් පටන් ගත්ත ගමන ක්‍රියාත්මක වෙලා විවිධාකාර ක්‍රමවලින් අපල උපදුව විදිහට එන බවත්, මේවා නැති කරගන්න නම් ඒවාට වන්දි ගෙවා නිදහස් විය යුතු ආකාරයත් පෙන්වා දුන්නා.

නැකත් ආදියත් මේ වගේමයි. ''මනසාචේ පසන්නේන භාසතිවා කරෝතිවා තතෝ නම් සුඛ මන්වේති ඡායාව අනපායිනී.'' ඒ කියන්නෙ යම් කිසි පුද්ගලයෙක් ප්‍රසන්න මනසකින් යුක්තව කටයුතු කරන කොට, ඒ චිත්ත ප්‍රසාදය මුල් වෙච්ච පහන් සිතින් කරන කියන කටයුතුවලින් ඒ පුද්ගලයාට වරදින්න තැනක් නෑ. මොකද ඒ අවස්ථාව වෙන කොට ඒ පුද්ගලයා ශ්‍රද්ධා, සීල, සුත, ත්‍යාග, ප්‍රඥා කියන කාරණා පහකින් යුක්තව, පහන් සිතකින් ඉන්න මොහොතක්. ධර්මානුකූල මෙනෙහි කිරීමක් මෙතනදී සිද්ධ වෙනවා. මෙබඳු වූ පහන් සිතකින් කරන කියන කටයුත්තක් ඇත්නම්, ඒක සාර්ථක වෙන්න හේතු තියෙනවා. ආනන්තරීය පාප කර්මවල ශේෂ විපාක හැර, ඒ හේතු බිඳ ගෙන එන්න වෙන කිසිම බලවේගයකට හැකියාවක් නෑ. මේ ආකාරයේ පහන් සිතකින් යුක්ත වන පුද්ගලයාට ''උත්‍රසල'' හෙවත් ''උතුරුසල'' නැකතයි කියල කියනවා. ඒ නිසා ලෝකයා උතුරුසල නැකත පෙන්වන්නෙ බොහොම සුභ නැකතක් විදිහට. මනා සතර සතිපට්ඨානයෙන් යුක්තව කටයුතු කරන යමෙක් ඇත්ද, ඒ පුද්ගලයාට හැම මොහොතම උතුරුසල නැකත තමයි කියල බුදුන් වහන්සේ පෙන්වා දුන්නා.

බුදුන් වහන්සේ නැකත පිළිබඳව ඒ ආකාරයට කරුණු පෙන්වා දුන්නත්, උන් වහන්සේ කියපු කාරණය සියලු දෙනාම බාර ගත්තෙ නෑ. ඒ කාලෙ විවිධාකාර මති මතාන්තර දරපු මිනිස්සුත් හිටියා. මේ මිනිස්සු, අද දවස මොකක්ද, අද නැකත මොකක්ද කියල බමුණන්ගෙන් අහල දැන ගත්තා. බුදුන් වහන්සේගෙ ශ්‍රාවකයොත් මේවා දන්නව ඇති කියල හිතල, බුද්ධ ශ්‍රාවකයන්ගෙනුත් මේ වගේ ප්‍රශ්න අහල, උන් වහන්සේලා දන්නෙ නෑ කිව්වම, හවත් ගෞතමයන්ගෙ ශ්‍රාවකයො මහා මොට්ට ජාතියක්, මුකුත්ම දන්නෙ නෑ, දවස දන්නෙත් නෑ, නැකත දන්නෙත් නෑ, මාසෙ දන්නෙත් නෑ කියල ඒ මත දරපු මිනිස්සු දොස් කියන්න පටන් ගත්තා. මේ කාරණාව බුදුන් වහන්සේට සැළ කළාම, මනුස්සයො සම්මත කර ගෙන තියෙන දේවල් එහෙම අයින් කරන්න ලේසියෙන් බැරි නිසාත්, ඔවුන්ව ආර්ය අපවාදයකට ලක් නොකර ඒකට අවශ්‍ය මට්ටමට කරුණු දැන ගෙන ඉන්න කියලත් ශ්‍රාවක භික්ෂූන් වහන්සේලාට පැහැදිලි කළා.

ලෝක සම්මතයේ මනුස්සයො භාවිතා කරන යමක් ඇත්ද, මනුස්සයො නිසාම භික්ෂූන් වහන්සේලාටත්

# තද උණ රෝගයට අත් දුටු බේතක්...

උණ රෝගය කියන්නෙ විශේෂයෙන් කාලයකට වසංගතයක් වගේ පැතිරිලා යන රෝගී තත්ත්වයක්. මේ කාලය වෙන කොටත් රටේ හැම තැනම වගේ සීග්‍රයෙන් පැතිරිලා යන වසංගත උණ රෝග තත්ත්වයක් ඇති වෙලා තියෙනවා. බෝ වන රෝග අතර ඉතා ඉක්මනින් පැතිරිලා යන රෝගී තත්ත්වයක් තමයි උණ. ඊට අමතරව සාමාන්‍යයෙන් කෙනෙකුට උණ රෝගය වැළඳීම, වෙනත් රෝගී තත්ත්වයක් නිසාත් ඇති වෙන්න පුළුවන්. මේ උණ රෝගයට හේතු ඵල සම්බන්ධය ධර්මානුකූලව මීට පෙර මේ සඟරාවෙන්ම විග්‍රහ කරල තියෙනවා. ඒ වගේම හැම උණ රෝගයකටම ප්‍රත්‍ය වෙන, උණ ශාකයෙන් හදා ගන්නා බේතකුත් මීට පෙර හෙළි කරල තියෙනවා.

ඒ වගේම මේ උණ රෝගය වැළඳුනාම සමහර අවස්ථාවල මොන බේතක් ගත්තත් උණ බහින්නෙ නැතිව තද උණ ගතියෙන් ශරීරය පෙළෙන අවස්ථා තියෙනවා. ඒ වගේ වෙලාවට ඇති වන වේදනාව පිළිබඳව සමාජයේ හුඟ දෙනෙකුට අත්දැකීම් තියෙනවා. තමන්ගෙ එදිනෙදා රැකී රක්‍ෂා කටයුතු විතරක් නෙවෙයි, නිකං ඔළුව උස්සගෙනවත් ඉන්න බැරි තරම් වේදනාකාරී තත්ත්වයක් ඇති වෙනවා. අන්න ඒ වගේ වෙලාවට ඉතා ඉක්මනින් උණ බැහැල යන අත් දුටු ප්‍රත්‍යක්‍ෂ ඖෂධයක් වහරක අභයරතනාලංකාර හිමියන් විසින් මීට අවුරුදු කිහිපයකට පෙර බෙහෙත් සමාධියට හසු කර ගෙන තියෙනවා. ඉතා පහසුවෙන් හදාගෙන පාවිච්චි කරන්න පුළුවන් මේ අත් බේත, විශේෂයෙන් උණ රෝග කාරක වෛරසය නිසා ඇති වන පෙළෙන උණ ගතිය



සමනය කරල ශරීරය සාමාන්‍ය තත්ත්වයට පත් කිරීමට සමත් වෙනවා.

මේ සඳහා අවශ්‍ය වෙන්නෙ කලාඳුරු අල සහ දෙහි ඇඹුල් හෝ පොල් විනාකිරි විතරයි. මේ කලාඳුරු අල අරගෙන දෙහි ඇඹුල්වලින් ගල ගා ගන්න (අඹර ගන්න) ඕන. එහෙම නැත්නම් කලාඳුරු අල සියුම් වෙන්න අඹර ගෙන දෙහි ඇඹුල් වෙනුවට පිරිසිදු පොල් විනාකිරිවලින් දිය කරල, දියාරු මට්ටමට අනා ගන්න පුළුවන් නම් වඩා හොඳයි. ඒ කියන්නෙ දෙහි ඇඹුල් වෙනුවට පිරිසිදු පොල් විනාකිරි වඩාත් සුදුසුයි. හැබැයි මේ කිසිම අවස්ථාවකදි අනුපාතයක් අවශ්‍ය වෙන්නෙ නෑ. කලාඳුරු අල දියාරුවක් වගේ අනාගන්න පුළුවන් මට්ටමට දෙහි ඇඹුල් හෝ පොල් විනාකිරි තිබුණම ප්‍රමාණවත්.

දැන් මේ විදිහට හදාගත්තු බේත, කන් පෙති දෙපැත්තෙ සහ කන් වටේට උදේ හවස ආලේප කරන්න ඕන. ආලේප කරල තියෙන්න ඕන විශේෂ කාල සීමාවක් කියලත් නෑ. බොහෝ කොටම වේලක් දෙකක් ආලේප කරන කොට තද උණ ගතිය බැහැල යනවා. එහෙම නැත්නම් උණ ගැනෙන කොට නැවත නැවතත් ආලේප කරන්න පුළුවන්. ඒ වගේම උණ නිසා හට ගත්තු හිසරදයක් තියේ නම්, මේ බේත නළලෙ ආලේප කරල රෙදි කැල්ලකින් ප්ලාස්ටරයක් වගේ දාගන්නත් පුළුවන්. ඉතා ඉක්මනින් හිසරදය සහ උණ රෝගී තත්ත්වය සමනය වීම මේ ප්‍රතිකාරයේ තියෙන විශේෂත්වයක්.

සටහන
**නීතිඥ චන්දන සිරිවර්ධන**

---

මනුස්සයින්ගෙ සිරිත් විරිත් භාවිතා කරන්න සිද්ධ වෙන අවස්ථා තියෙනවා. ඒ විදිහට භික්ෂූන් වහන්සේලාට මනුස්සයින්ගෙ සිරිත් විරිත් අනුගමනය කරන්න වෙච්ච හොඳ උදාහරණයක් තියෙනවා. බුදුන් වහන්සේ වැඩ ඉන්න කාලයෙදි මිනිස්සු අතර කෙනෙකුට කිවිසුමක් ගියාම ''ආයුබෝං'' කියන සිරිතක් තිබුණා. මේක ඉස්සර ඉඳන් ආපු සිරිතක්. වරක් බුදුන් වහන්සේට කිවිසුමක් ගිය අවස්ථාවක, එතන හිටපු ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා සියලු දෙනා එක්වරම ආයුබෝං කියල කිව්වා. එතකොට බුදුන් වහන්සේ, මහණෙනි, කිවිසුමක් ගියාම ආයුබෝං කියල කිව්වම ආයුස වැඩි වෙනවද කියල ඇහුවා. නෑ ස්වාමීනි කියල කිව්වම, එහෙනම් ඇයි එහෙම කියන්නෙ කියල ඇහුවා. මිනිස්සු කියන නිසා අපිත් එහෙම කියන බව ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා කිව්වා. ඊට පස්සෙ උන් වහන්සේ එසේ නොකියන ලෙස දුකුලා ඇවතක් පැනෙව්වා. ඉතින් භික්ෂූන් වහන්සේලා මනුස්සයින් අතර ඉන්න කොට, මනුස්සයින්ට කිවිසුමක් ගියාම භික්ෂූන් වහන්සේලා සද්ද නොකර හිටියා. භික්ෂූන් වහන්සේලාට කිවිසුමක් ගියොත් මිනිස්සු ආයුබෝං කියල කිව්වා. නමුත් භික්ෂූන් වහන්සේලා, ඔබලාට සුවපත් වේවා කියල කිව්වා. ඊට පස්සෙ මිනිස්සු, භවත් ගෞතමයන්ගෙ ශ්‍රාවකයෝ මහා පුදුම ජාතියක්, ආශිර්වාද කළාම ආශිර්වාදයක්වත් කරන්නෙ නැහැනෙ කියල භික්ෂූන් වහන්සේලාට දොස් කියන්න පටන් ගත්තා. ඒ නිසා සමාජයට ගියාම මිනිස්සු අතර එහෙම දෙයක් තියේ නම්, ඒ වගේ අවස්ථාවල විතරක් ආයුබෝං කියන්න කියල බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට උපදෙස් දුන්නා. මනුස්සයින්ගෙ තියෙන මත සහ ගති දිට්ඨ මංගල, සුත මංගල, මුත මංගල යනාදී වශයෙන් බොහොම ලේසියෙන් මුල් බැහැගෙන තියෙන නිසා, ඒවාට විරුද්ධ වුනාම මිනිස්සු දොස් කියනවා, ඒ නිසා ඒකෙ ස්වභාවය අනුව අරුත තේරුම් අරගෙන ආශිර්වාද කරන්න, නමුත් භික්ෂූන් වහන්සේලා අතරේ මේ වගේ වැඩක් නැති දේවල් කරන්න එපා කියල උපදෙස් දුන්නා.

සටහන
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# වාස්තු විද්‍යාවේ හේතු ඵල සම්බන්ධය දහම් ඇසින් ....

**5 වන කොටස**

ප්‍රධාන වශයෙන් වහලක යම් කිසි මූට්ටුවක් ගත්තම ඒ මූට්ටුවෙන් අරීයව සහ ගෝලාකාරව විස කිරණ නිකුත් වන බවත්, ඒ විස කිරණ යම් කිසි විදිහකට කපා හැරියෙ නැත්නම්, මනුස්සයාට අහිතකර බලපෑම් එල්ල වන බවත් පසුගිය කලාපයෙන් පැහැදිලි කළා. දැන් මේ වගේ මූට්ටුවකින් කිරණ විහිදෙනවයි කියන කාරණයත් එක්තරා ආකාරයකට විද්‍යානුකූලව පැහැදිලි කරන්න පුළුවන්.

උදාහරණ විදිහට යම් කිසි සිමෙන්ති ගඩොල් කැටයක් ගත්තොත් ඒකෙ ප්‍රධාන වශයෙන්ම තියෙන්නෙ සිමෙන්ති සහ වැලි. හැබැයි නිකං සිමෙන්තියි වැලියි අරගෙන තද කරල කොටුවක තිව්වොත් ඒක තියෙන්නෙ නෑ, විසිරිලා යනවා. නමුත් ඒකට ජලය ටිකක් දාල මිශ්‍ර කරල තිව්වොත් තද වෙලා තියෙනවා. එතකොට මේ ජලය නිසා තමයි ගඩොල් කැටයට ඒ ආකෘතිය ඒ විදිහට පවත්වාගෙන යන්න පුළුවන් වෙලා තියෙන්නෙ. එහෙම නැතිව ගල්, වැලි, සිමෙන්තිවලට ඒ හැඩය තනියෙන් පවත්වන්න බෑ. ඒ සියල්ල එකතු කරල වතුර නොදා ලී රාමුවකට දාල ගැලෙව්වොත් ඒ ආකෘතිය තියෙන්නෙ නෑ, විසිරෙනවා. ඒ නිසා ජලයෙන් තමයි ඒ ආකෘතිය ඒ විදිහට රඳව ගෙන තියා ගන්නෙ. එතකොට සිමෙන්ති, වැලි ආදිය ගානට හයිවෙලා ආකෘතියකට අනුව පිහිටනවා.

මෙන්න මේ වගේ අවස්ථාවක කිරිලියානු කැමරාවකින් ඡායාරූප ගත්තොත් ඒ ගඩොල් කැටයේ හතර වටින්ම කිරණ පිටවෙනව දැක බලා ගන්න පුළුවන්. නිකං ගල් කැටයක් ගත්තත් ඒ වගේ වටේට කිරණ පිට වෙනවා. නමුත් ඒවා එකිනෙකට සම්බන්ධ කරල පරිහරණයට ගන්න කොට තමයි ඒ කිරණවල බලපෑම එන්නෙ. මේ හැම එකක්ම ඝනීභවන වුනාම ස්ථාවරයි. අන්න ඒ වගේ ස්ථාවර අවස්ථාවකින් තමයි මේ කිරණ පිට වෙන්නෙ. එතකොට ඒ ආකෘතිය ඒ විදිහට තියා ගන්න නාම රූපයක් හැදිල තියෙන්නෙ. ඒ විදිහට කිරණ පිටවෙන්නෙත් අර ආකෘතියේ ශක්තිය ගැබ් වෙලා හයි වෙලා තියෙන නිසා. එතකොට නිකං සිමෙන්ති, වැලිවලට නොතිබ්ච්ච ශක්තියක් දැන් ගඩොල් කැටයට තියෙනවා.

මේ වගේ අවස්ථාවක ඒ ගඩොල් කැටයේ සියුම් අංශුවල තියෙන පරමාණු ගත්තොත් වටේට තියෙන්නෙ ඉලෙක්ට්‍රෝන. ඒ ඉලෙක්ට්‍රෝනවල ශක්ති පථවල තියෙන ශක්ති ප්‍රමාණයන් තීරණය වෙන්නෙ ෆෝටෝන අංශුවලින්. ඒ කියන්නෙ විද්‍යුත් චුම්භක තරංග. ඒවා බොහොම සියුම් අංශු. මේ අංශු ඉලෙක්ට්‍රෝනවලින් අවශෝෂණය කර ගෙන ලොකු කරල ඒවායේ ශක්තිය ගැබ් කරනවා. ඒ ශක්තියෙන් තමයි ඒ ආකෘතියේ හැඩය පවත්වගෙන ඉන්නෙ. ඒකෙන් මිනිස් ඇසට නොපෙනෙන සියුම් කිරණ පිට වෙනවා.



මේ වගේ ගඩොල් කැට 2 ක් සම්මුඛව තිව්වොත් ඒ දෙකෙන්ම විහිදෙන කිරණ එකිනෙක කැපිල යනවා. ඒ වගේ ඉරට්ටෙ සංඛ්‍යාවක් තියෙන කොට තමයි එකක කිරණ අනිකෙන් කැපෙන්නෙ. ලී කෑල්ලකත් මේ කියන කිරණ තියෙනවා. හැබැයි ලී කෑලි 2 ක් එකට මූට්ටු කළොත් ඒ මූට්ටුවෙන් තමයි බලපෑම් කරන කිරණ පිටවෙන්නෙ. ඒ නිසා ඒ වගේ මූට්ටු ඉරට්ටෙ සංඛ්‍යාවක් තිබුණට ගැටළුවක් නෑ. එකකින් එන කිරණ අනිකෙන් කැපිල යනවා. එකම ද්‍රව්‍ය නිසා තමයි එහෙම එකකට එකක් කැපෙන්නෙ.

නමුත් මේ කිරණ පිටවීම යකඩවලට නෑ. මොකද යකඩවල තියෙන්නෙ ඉලෙක්ට්‍රෝන ජලාශ. ඒ කියන්නෙ, යකඩ පරමාණුවක් ගත්තම ඉලෙක්ට්‍රෝන මහ ගොඩක් තියෙනවා. යකඩවලින් විදුලිය ගමන් කරන්නෙත් ඒකයි. ඒ ඉලෙක්ට්‍රෝන ජලාශය නිසා අර වගේ විස කිරණ පිටවීමක් යකඩ මූට්ටුවකින් සිද්ධ වෙන්නෙ නෑ. මොකද ඉලෙක්ට්‍රෝන ගොඩක් නිසා සමස්ථ යකඩයේම ඍණ (-) කිරණ තියෙන්නෙ. නමුත් අනෙක් ද්‍රව්‍යවල තියෙන්නෙ ධන (+) කිරණ. ඒ නිසා තමයි ලී වගේ දේවල්වලින් විදුලිය ගමන් නොකරන්නෙ. එතකොට මනුස්ස කයත් ධන කිරණ කයක් නිසා විදුලිය ගමන් කරන්නෙ නෑ. ඒ නිසා මනුස්ස ශරීරයට ධන කිරණ ප්‍රත්‍ය වෙනවා.

මෙන්න මේ හේතුව නිසා තමයි ජපන් ජාතිකයන් $H_2O$ කියන ජල අණුවෙන් H (හයිඩ්‍රජන්) පරමාණුවක් ගලවල HO කියන ධන කිරණ තියෙන ජලය පානය කරන්න යොදා ගන්නෙ. සමස්ත ජලයෙන් H 1 ක් ගැලෙව්වම මුළු ජලයටම ධන ශක්තිය ගැබ් වෙනවා. දැන් අර H 1 ක් ගලවපු ජලය පානය කළාම ඒකෙ තියෙන ධන කිරණ ශක්තිය ශරීරයේ තියෙන ධන කිරණ ශක්තියට එකතු වෙලා ශක්තිය වැඩි වෙනවා. ඒ නිසා මනුස්සයගෙ කාර්යක්ෂමතාවයත් වැඩි වෙනවා. H පරමාණු 2 ක් තියෙන කොට ධන කිරණ ශක්තිය අඩු වෙලා ඍණ කිරණ ශක්තිය වැඩි වෙනවා. $H_2O$ වල H 1 ක් ගැලෙව්වම ඒක ධන ආරෝපිත වෙන නිසා ඒ ධන අංශු ශරීරයට ප්‍රත්‍ය වෙනවා. ඍණ අංශු තිබුණොත් ශරීරයේ ශක්තිය උරා ගන්නවා. මේ ක්‍රමය ජපන් ජාතිකයින් ශක්තිය වැඩි කර ගන්න ප්‍රයෝග සම්පත්තියක් විදිහට පාවිච්චි කරනවා.

යකඩ 2 ක් මූට්ටු කළාම විස කිරණ පිට නොවුනට අධික ඉලෙක්ට්‍රෝන සාන්ද්‍රණය නිසා යකඩවලින් ශරීරයේ තියෙන ධන ශක්තිය අවසෝෂනය කරනවා. ඒ නිසා තමයි යකඩවලින් හදපු වාහනයක ගමනක් ගිහින් ආවම ඇඟට අමාරු වෙන්නෙ. ඒ යකඩවල තියෙන ඍණ කිරණවලට ශරීරයේ තියෙන ධන කිරණ ශක්තිය උරා ගන්නවා. යකඩ ඇඳක නිදා ගත්තමත් මේ වගේ දෙයක් සිද්ධ වෙනවා. ඒ වගේ යකඩ ඇඳක නිදා ☞

ගෙන උදේට නැගිටල බැලුවොත් හරියට පොල්ලකින් ගැහුව වගේ මුළු ශරීරයටම අමාරුයි. ඒ කාරණය ශරීරයට දිගු කාලීනව බලපානවා. ඒක ශරීරයට විසයි. යකඩ පුටු, යකඩ මේස, යකඩ උළුවහු, දොර ජනෙල් ආදිය පාවිච්චි කිරීම ශරීර සෞඛ්‍යයට එතරම් හිතකර නොවන්නෙත් මේ හේතුව නිසා. යකඩ තරම් නැතත්, ඒ වගේ විදුලිය සන්නයනය කරන ඇලුමිනියම් ආදී අනික් ලෝහත් මේ හේතුව නිසා ඒ තරම්ම පාවිච්චියට සුදුසු නෑ. නමුත් අද මේ කාරණය හුඟ දෙනෙක් දන්නෙ නෑ. ඒ නිසා පුළුවන් තරම් මේ වගේ අවස්ථාවල ලීයෙන් හදපු දේවල් පාවිච්චි කිරීම තමයි වඩා සුදුසු වෙන්නෙ. ප්ලාස්ටික් උපකරණ ආම්පන්නවල වුනත් යකඩවල තරම් හානියක් නැති වුනාට අර ලීවල තියෙන ස්වභාවික ශක්තිය නෑ. ඒ කියන්නෙ මොනම කටයුත්තකටවත් යකඩ පාවිච්චි කරන්න එපා කියන එක නෙවෙයි, 100% ක්ම නරකයි කියන එක නෙවෙයි. තැනේ හැටියට පාවිච්චි කරන්න ඕන.

දූන් කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන්, එතකොට විදුලිය ඉතා හොඳින් ගමන් කරන රත්රන්, රිදී ආදියෙන් හදපු විවිධ ආභරණ පළඳින කොටත් ඔය ප්‍රශ්නය එන්නෙ නැත්ද කියල. නමුත් එතනදි රත්රන්, රිදී කියන්නෙ ලෝහ වර්ග වුනාට, ඒවායේ අඩංගු සතර මහා භූත විශේෂ ගති ගුණයන්ට අනුව සකස් වෙලා තියෙන්නෙ. උදාහරණ විදිහට මීට කලිනුත් විග්‍රහ කළා වගේ ස්වර්ණ කියන්නෙ ස්ව + අරණ හෙවත් තමන්ගෙ සිතේ සටනක් නැති නිදහස් ගතියට අදාල ගුණය. රිදී කියන්නෙ සෘද්ධිමත් ගතියට අදාල ගුණය. මේ අනුව ඒ ඒ ද්‍රව්‍යවල පිහිටන වෙනස් ගුණ නිසා ඒ ස්වභාවය වෙනස් වෙනවා.

මේ කාරණය තවත් උදාහරණයකින් පැහැදිලි කරනව නම්, බුදුන් වහන්සේගෙ බුද්ධ ශරීරයත් සතර මහා භූතවලින් හැදිල තියෙන්නෙ. සාමාන්‍ය මනුස්සයෙක්ගෙ ශරීරයත් සතර මහා භූතවලින්මයි හැදිල තියෙන්නෙ. නමුත් බුද්ධ ශරීරයේ සතර මහා භූත උන් වහන්සේගෙ විශේෂ ගුණවලට අනුව සකස් වෙලා විසාල පරිවර්තනයකට භාජනය වෙලා තියෙන්නෙ. ඒ නිසා සාමාන්‍ය මනුස්සයෙකුගෙ ශරීරයකට නැති විශේෂත්වයක් බුද්ධ ශරීරයට තියෙනවා. ඒ වගේ දෙයක් තමයි මෙතනදි සිද්ධ වෙන්නෙත්. ඉතින් මේ වගේ දේවල් වාස්තු විද්‍යාවෙ පැහැදිලි කරල තියෙන දේවල් නෙවෙයි, විද්‍යාවෙන් පැහැදිලි කරන්න පුළුවන් දේවල්.

ඊළඟට වහළක් ගත්තම මේ මූට්ටු කතාව ප්‍රබලවම බලපානවා. මූට්ටුවකින් අරීයව, ගෝලීයව සහ ත්‍රිමානීයව තමයි කිරණ විහිදෙන්නෙ. හරියට ශබ්දයක් පිට කළාම වටේටම හඬ ඇහෙනව වගේ. විදුලි බුබුලක් ගත්තමත් හතර වටේටම ගෝලයක් වගේ තමයි ආලෝකය විහිදෙන්නෙ. මූට්ටුවකින් කිරණ විහිදෙන්නෙත් ඒ විදිහට. ඒ විහිදෙන කිරණ යම් කිසි දුර ප්‍රමාණයක් ඇතුලත ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා මූට්ටු ඔත්තෙ සංඛ්‍යාවක් තිබුණොත් එකකින් එන විස කිරණ ඉතිරි වෙන නිසා ඒ ගැන සැලකිලිමත් වෙන්න ඕන. වහළක මුදුන් යට ලීය ගත්තම, ලීයෙ මැද ප්‍රදේශයට මූට්ටු නොඑන්න තනි ලීයක් දාල මූට්ටු එන ස්ථාන, වහළ දෙපැත්තෙ කෙළවරට තල්ලු කරන තරමට හොඳයි. මොකද බ්‍රහ්ම ශක්තිය වැඩිපුරම ඇදෙන්නෙ ලීයෙ මැද ප්‍රදේශයට. ඒ මැද ප්‍රදේශයේ මූට්ටු නැති වුනොත්, ඒ කලාපය සුද්ද නිසා සුද්ද බ්‍රහ්ම කිරණ ඇදල එන්න පහසුවක් වෙනවා. එතකොට මුදුන් යට ලීය ගෘහ මූලිකයාට බලපාන නිසා හැම තිස්සෙම ඒ මැදට යොදන ලී කෑල්ල ගෘහ මූලිකයගෙ උසට වඩා වැඩි වෙන්න ඕන. ඒ නිසා මැද ලීය පුළුවන් තරම් දිගට අරගෙන, මදි වෙන ටිකට දෙපැත්තෙන් මූට්ටු දාල ලී කෑලි යොදා ගත්තම ගැටළුවක් නෑ.



ඊළඟට අද හුඟක් ගෙවල්වල තියෙන දෝසයක් තමයි කවාකාර අඩ සඳ ආකාරයේ උළුවහු හෝ ඇතුල් වෙන ස්ථාන යොදා තිබීම. සාමාන්‍යයෙන් ඉර හඳ වගේ කවාකාර හැඩය දාන්නෙ වන්දනාමාන ගරු බුහුමන් කරන පන්සල් වගේ පූජනීය ස්ථානවලට. ගිහි ගෙවල්වලට ඒ වගේ හැඩයක් දැම්මොත් දොස් එනවා. අඩ සඳ, සඳකඩ පහන කියන වචන ගත්තම සඳ කියන්නෙ හිතේ සතුට. ඒ කියන්නෙ කාම සතුට. මොකද සඳු තමයි කාමච්ඡන්දයට අධිපති වෙන්නෙ. කඩ කියන්නෙ කඩ වෙනවා. ඒ කියන්නෙ කාමච්ඡන්දය කඩ වෙනවා. ඒ සඳ කඩ කළාම සිත පහන් වෙනවා. සඳකඩ පහන කියන්නෙත් ඒකයි. කාමච්ඡන්දය කඩ වුනා කියන්නෙ පංච නීවරණවලින් ඉතිරි 4 ත් දුරු වෙනවා. ඒ කියන්නෙ සම්මා සමාධිය නැගෙනවා. එතකොට කාම සුඛයක් නැති නිසා පන්සල් වගේ පූජනීය ස්ථානවලට ඒ හැඩය ගැලපෙනවා. මොකද ඒ වගේ තැනක කාම සතුට කොහොමත් කඩ වෙන්නමයි අවශ්‍ය වෙන්නෙ. එතකොට තමයි ලෝකෝත්තර සුවය ලැබෙන්නෙ. හැබැයි ඔය හැඩය පංච කාම සම්පත් භුක්ති විඳින්න හදාගත්තු ගෙදරක තිබුනොත්, ඒකට විරුද්ධ දෙයක් ක්‍රියාත්මක වෙලා ඒ සතුටට බාධා එනවා. එතකොට ඒ ගෙදර ගැටුම් ඇතිවෙන්න, කරන කියන ගිහි කටයුතු අසාර්ථක වෙන්න හේතු වෙනවා. ඒ නිසා ගිහි ගෙදරක නම් ඒ වගේ උළුවහු ආදී ස්ථාන හතරැස් කරල තමයි හදන්න ඕන.

ඒ වගේම අද හුඟක් ගෙවල්වල ළිං වෙනුවට වතුර ගබඩා කරල තියෙන ටැංකි පාවිච්චි කරන නිසා, ඒ වතුර ටැංකිය තැන්පත් කරල තියෙන ස්ථානය ගැනත් සැලකිලිමත් වෙන්න ඕන. බැරි වෙලා හරි වතුර ටැංකිය පෝරණුව උඩ තිව්වොත් ඒ ගෙදර අයට නොයෙක් කරදර බාධක ඇවිත් එකිනෙකා රණ්ඩු සරුවල් කරගෙන, එකිනෙකාට එකිනෙකා නොරිස්සුම් ස්වභාවයක් පෙන්නුම් කරන්න ගන්නවා. මොකද ඒ වගේ අවස්ථාවකදි යටින් ගින්නයි, උඩින් ජලයයි තිබුනම එකිනෙකට විරුද්ධ දෙයක් තමයි ක්‍රියාත්මක වෙන්නෙ. එක දිගටම ඒ විදිහට තියෙන කොට හැම තිස්සෙම ප්‍රතිවිරුද්ධව තමයි ඒ අංශු ක්‍රියාත්මක වෙන්නෙ. ඒ නිසා වතුර ටැංකියක් තියනව නම් ඒ වගේ රත් නොවන වෙනත් තැනක තැන්පත් කරන්න ඕන.

විද්‍යානුකූලව ගත්තත් ජල ධාතුවයි, ගිනි ධාතුවයි එකිනෙකට ප්‍රතිවිරුද්ධයි. යම් කිසි තෙත් වෙලා තියෙන දෙයක් වේල ගන්න ඕන වුනාමත් අව්වට තමයි දාන්නෙ. තාප ධාතුවට හැම වෙලේම ජල අණුවල වෙනසක් ඇති කරන්න පුළුවන්. ඒ දෙක එකට තිව්වම ජල පරමාණු තාපය උරා ගෙන හැම වෙලේම ගැටීමක් ඇති කරනවා. ඒකෙන් හට ගන්න කිරණ ගැටලුකාරියි. ඒ කිරණ නිසා, නිවසේ කිරණ ක්‍රියාත්මක වීමට බලපෑමක් එල්ල වෙලා ඒ ගෙදර ඉන්න මනුස්සයින්ටත් ඒක බලපානවා.


මේ වගේම දෙයක් කුස්සියක ළිප ළඟ, වතුර කරාමය සහිත බේසම (සින්ක් එක) සවි කළාමත් සිද්ධ වෙනවා. එතකොට කුස්සියේ නිතර ගැවසෙන ගෘහණිය හෝ කවුරු හරි ඉන්නව නම්, ඒ පුද්ගලයට නිතර නිතර සෙම් අමාරු හැදෙනවා. මේ කාරණය අවශ්‍ය නම් ප්‍රායෝගිකව අත්හදා බලන්නත්

පුළුවන්. මෙතනදිත් අර කලින් වගේම ජල අංශුවලට තාප අංශුවලින් නිතරම ශක්තිය උරා ගැනීම නිසා ඒ ස්ථානයේ පරිසරය වෙනස් වීමක් තමයි සිද්ධ වෙන්නෙ. වතුර ටිකක් ළිපේ තියල උණු කරගන්නව වගේ දෙයක් නෙවෙයි මෙතනදි වෙන්නෙ. නිකං රස්නෙ වැදි වැදී කුරෝලු කර කර පහර ගැහීමක්. උදාහරණ විදිහට රතිඤ්ඤ කරලක තියෙන වෙඩි බෙහෙත් ටික පිටට අරගෙන ගිනි තිව්වට, නිකං පත්තු වෙලා යනව මිසක් හානියක් වෙන්නෙ නෑ. නමුත් ඒ වෙඩි බෙහෙත් ටිකම රතිඤ්ඤ කරලට දාල පත්තු කළාම මහ විසාල ශබ්දයක් එක්ක කම්පනයක් ඇති වෙනවා. මේ වගේ දෙයක් මෙතනදිත් සිද්ධ වෙනවා. ඒ බලපෑම නිසා සෙම තියෙන අය හිටියොත් කෙලින්ම ඇදුම හැදෙන්නත් බලපානවා. ඒ නිසා සාමාන්‍යයෙන් අඩි 5 - 6 ක් විතර ඈතින් ළිපේ රස්නය නොවදින්න තමයි වතුර කරාමය සහිත බේසම සවි කරන්න ඕන.

හැබැයි මෙතනදි ජල ධාතුව කියන්නෙ ජලය නෙවෙයි. කිරිලියානු කැමරාවකින් ඡායාරූප ගත්තම, ඒ වගේ තැනක මුළු ප්‍රදේශයම ඉතා සියුම් කිරණ ධාරාවකින් වැහිල තියෙන බව දැක බලාගන්න පුළුවන්. ඒ කියන්නෙ මේ කිරණ ලෝකයේ මහ කැලඹීමක් තමයි සිද්ධ වෙන්නෙ. එතකොට ජල කරාමයක් ඇරියම වතුර වැක්කිරීම එක කාරණයක්. ඒක භෞතිකව මස් ලේ ඇහැට පේන දෙයක්. නමුත් මේ වගේ ආපෝ, තේජෝ කියන ධාතු දෙක එකට ඝට්ටනය වීම නිසා මිනිස් ඇසට නොපෙනෙන නාම රූප ගොඩක් නිෂ්පාදනය වෙනවා. හරියට මස් ලේ කයත් එක්ක තියෙන සූක්ෂම මනෝ කාය (ඇස්ට්‍රල් බොඩි) වගේ, භෞතික ජල අණුත් එක්ක සම්බන්ධ සූක්ෂම ජල ධාතුවක් තියෙනවා. අන්න ඒ සූක්ෂම ජල ධාතුව තමයි මෙතනදි ක්‍රියාත්මක වෙන්නෙ. එතකොට මේ නාම ලෝකය (ඕරා වළල්ල) තමයි ඝට්ටනය වෙලා නරකට හිටින්නෙ. රූප ලෝකයේ සිද්ධියක් නම් ඒ ස්ථානයේ වීදුරුවක් හරි මොනව හරි ඝනකම දෙයක් දාල ඒ සම්බන්ධය වහන්න පුළුවන්. නමුත් එහෙම කළයි කියල මේ දෝසය අරින්න බෑ. මොකද ඒක නාම ලෝකයේ සිද්ධ වෙන දෙයක් නිසා. කට්ටල් දැමීමකදි කරන්නෙ, මෙන්න මේ නාම ලෝකයෙන් එන විස කිරණ එන්න දෙන්නෙ නැතිව අවහිර කිරීමක්. ඉතින් ඒක හරියට දැන ගෙන, තැනට අනුකූලව ඒ කියන දෝස හරියට බලල කරන්න ඕන දෙයක්.

හැබැයි මේ වගේ අවස්ථාවකදි ශරීර උෂ්ණත්වය වැඩි, සෙම ගතිය අඩු අයට නම් මේ කියන බලපෑම ඒ තරම් නොදැනෙන්න පුළුවන්. ඒ අයට තියෙන ප්‍රතිශක්තිකරණය නිසා ඒකෙන් ඒ තරම් බලපෑමක් නොවෙන්න පුළුවන්. නමුත් සෙම තියෙන අයට ඒ බලපෑම තවත් වැඩි වෙනවා. ඒ වගේම ඒ කාලයට කෙනෙක්ගෙ තියෙන පුණ්‍ය විපාක ශක්තිය ඉහළ නම්, ඒ නිසත් මේ වගේ දෝස ඒ කාලයට නොඑන්න පුළුවන්. සමනන්තර - අනන්තර ප්‍රත්‍යය තමයි මෙතනදිත් ක්‍රියාත්මක වෙන්නෙ. විපාක දෙන්න පරිසරයක් සකස් කරල දීමක් තමයි මේ වගේ දෝසවලින් කරන්නෙ.

ඒ වගේම පසුගිය කලාපයෙන් විස්තර කළ නන්දා, භද්‍රා, ජයා, රිට්ටා, පූර්ණා කියන අවස්ථා 5 ගත්තම, කම්පනය




අඩුවෙන් තියෙන නන්දා, ජයා, පූර්ණා කියන අවස්ථා 3 ත් එකිනෙකට සර්ව සම නෑ. ඒ ස්ථාන හොඳ වුනාට ඒවායේ පිහිටන ශක්ති එකිනෙකට වෙනස්. මොකද ඒ ස්ථානවල කම්පන රටාවන් එකම ස්වභාවය වගේ පෙනුනට සර්ව සම නෑ. භද්‍රා, රිට්ටා කියන කම්පනය වැඩි ස්ථාන දෙක ගත්තමත් ඒ වගේ. විස ස්වභාවය ඒ දෙකේම සමාන නෑ. ගොඩනැගිල්ලක් ගත්තොත් ඒකෙ කෙළවර කම්පනය වෙන්නෙ නෑ. ඒ වගේ කම්පනය නොවන කලාපයක බිත්ති කණු වගේ බර දරන්න සුදුසුයි. හැබැයි ඒ විදිහට සුදුසු වුනත් ඒ කලාපයේ සඵල බව අඩු වැඩි තැන් තියෙනවා. ඒකත් සාපේක්ෂයි. තවත් විදිහකින් කියනව නම්, සාපේක්ෂව ගත්තම හොඳ තැනකත් යම් කිසි මට්ටමක නරක තැන් තියෙනවා.

ඉතින් ගෙයක් හදන කොට මේ වාස්තු බලනවයි කියන්නෙ, මේ දෝස 100% ක්ම නැති කිරීමක් නෙවෙයි. පුළුවන් තරම් දෝස අඩු කරල ඒකෙන් එන හානිය අඩු කිරීමක් තමයි හරියට වාස්තු විද්‍යානුකූලව ගෙයක් හදන කොට කරන්නෙ. එතකොට අත්තිවාරම ලොකු පුංචි වුනා කියල දෝස වෙනස් වෙන්නෙ නෑ. මොකද ගෘහ මූලිකයගෙ වඩු රියන අරගෙන තමයි වර්ග ප්‍රමාණය හදන්නෙ. එතනදි පුරුෂයෙකුගෙ නම් දකුණු අතත්, ස්ත්‍රියකගෙ නම් වම් අතත් තමයි වඩු රියන මනින්න යොදා ගන්නෙ.

බිත්ති වගේ බර එන තැන් අර කියන කම්පනය වන ස්ථානවලට යොදන්න එපා කිව්වම කෙනෙකුට ගැටළුවක් මතු වෙන්න පුළුවන්, එතකොට වටේට යන අත්තිවාරම බරක් නෙවෙයිද කියල. නමුත් අත්තිවාරම වටේට දාල සියල්ලම අඛණ්ඩව එකතු වුනාම ඒක උඩට තමයි මේ කාරණය බලපාන්නෙ. එතකොට ඒක තමයි කම්පනය වන තැටියක් විදිහට ක්‍රියාත්මක වෙන්නෙ. ඒ වටේට තියෙන්නෙ රාමුව. ඒ රාමුව ගැටළුවක් වෙන්නෙ නෑ. ඒක නැතිව ගෙයක් හදන්න බෑ. නමුත් ඒක ඇතුලෙ බිත්ති බඳින කොට අර වගේ වැඩිපුර කම්පනය වන තැනක බිත්ති බැන්දොත් ඒ දෝසය එනවා. අන්න ඒ වගේ ස්ථානවලට බිත්ති, බර උසුලන කණු වගේ ඒව යොදන කොට සැලකිලිමත් වෙන්න ඕන.

ඒ වගේම සමහර ගෙවල්වල විවෘත ස්ථානවල, හතර වටින්ම විවෘත, බර උහුලන කණු (බිත්ති ඇතුලෙ තියෙන කණු නෙවෙයි) ඔත්තෙ සංඛ්‍යාවක් එන විදිහට දාපු අවස්ථා තියෙනවා. ඒකත් සුදුසු නෑ. මොකද ඒ වගේ විවෘත තනි කණුවකිනුත් අර විදිහට විහිදෙන විස කිරණ කැපෙන්න විදිහක් නෑ. එතකොට ඒ වගේ කණුවක් මුල (ඒ කියන්නෙ ඒ කලාපයට අහුවෙන අඩි 3 ක් විතර වටේට) පුද්ගලයෙක් නිතර නිතර ඉඳගෙන ඉන්නව නම් ඒකත් හොඳ නෑ. හරියට බරක් කර තියාගෙන ඉන්නව වගේ අපහසුතාවයක් තමයි එතකොට එන්නෙ. නමුත් ඒ හේතුවෙන් ඒක වෙනව කියල තේරෙන්නෙ නෑ. ඒ නිසා ඒ වගේ කණුවක් අසල ඉන්න මනුස්සයටත් ඒක බලපානවා. හැබැයි මේ කියන්නෙ නිකං ලස්සනට හදපු කණු නෙවෙයි, ගේ බර දරාගෙන ඉන්න හදපු කණු.


මේ කාරණය උදාහරණයකින් පහදන්නත් පුළුවන්. පොලිතින් බටයක් අරගෙන එක පැත්තක් මුද්‍රා තියල, අනෙක් පැත්තෙන් හුළං පුරවල ගැට ගහල ඒ බටය වටේට සිදුරු විද ගන්නවා. දැන් උඩයි යටයි තෙරපන කොට ඒ වටේට අරීයව (Radialy) වායුව විහිදෙන්න ☞

ගන්නවා. ඊට පස්සෙ ඒ පොලිතින් බටයම වතුර පුරවල අර විදිහටම උඩින් යටින් තෙරපුවොත් එතකොටත් අරියව ජලය විහිදෙන්න ගන්නවා. මේ වායු සහ ජලය වගේම, කොන්ක්‍රීට් යොදපු කණුවකටත් ඉහළින් බර පටවන කොට, අර විදිහටම අරියව විද්‍යුත් චුම්බක තරංග හෙවත් ෆෝටෝන පිට කරනවා. ඒවා හුගක් සැරයි. මොකද හේතුව යමක් අපහසුතාවයකින් දරාගෙන ඉන්න කොට පිටවන කිරණත් සුද්ධ ඒවා නෙවෙයි, විස කිරණ.

උදාහරණයක් විදිහට මනුස්සයෙක්ගෙ කර උඩ ලොකු බරක් තිව්වොත්, ඒ මනුස්සයට ඇති වන මානසිකත්වය හොඳ එකක් නෙවෙයි. එතකොට ඒ මානසිකත්වය නිසා පිටවන කිරණත් සුද්ධ නෑ. මේ වගේ අවස්ථාවක් ඕරා කැමරාවකින් හෝ කිරිලියානු කැමරාවකින් ඡායාරූප ගත කරල බැලුවොත්, මනුස්සයගෙ ඕරා වළල්ල රතු පාටයි. මොකද තරහ ගිහින් ද්වේශ සහගත මානසිකත්වයක් ඇතිවෙලා තියෙන නිසා. අන්න ඒ වගේ දෙයක් මේ විදිහට බර දාපු කණු අසලත් සිද්ධ වෙනවා. මනුස්සයෙක් ඒ ළඟ හිටියොත් විස කිරණ වදිනවා. නමුත් ඒක තේරෙන්නෙ නෑ. හරියට උදේ ඉඳන් රෑ වෙන කල් X කිරණ කාමරයක හිටිය වගේ. ඒ නිසා තනි කණු තියෙන්න හොඳ නෑ. අර වගේ එකකට එකක් කැපිල යන විදිහට කණු ඉරට්ටෙ සංඛ්‍යාවක් තියෙන්න ඕන. හැබැයි අර වගේ බර උසුලන විවෘත කණු 2 ක් තිබුණත් ඒ කණු 2 අතර කැපෙන හරි මැද නිතර ඉන්නත් හොඳ නෑ. ඒ නිසා කණු ඔත්තෙ සංඛ්‍යාවක් තියෙන අවස්ථාවකදි ඒ කණුව ඉවත් කරන්න පුළුවන්, නැත්නම් තවත් කණුවක් දාල ඒ දෝසය මග හරින්න පුළුවන්.

එහෙමත් නැත්නම් කණුවෙ පළලට වඩා තුන් ගුණයකටත් පොඩ්ඩක් වැඩි වෙන්න, තිරස් අතට කණුවෙ උසටම ගඩොල් බැඳල වෙනස් කළොත් ඒ කණුවේ හැඩය බිත්තියක / තාප්පයක හැඩයක් බවට පත් වෙලා අර දෝසය කැපිල යනවා. උදාහරණ විදිහට කණුවෙ පළල අඟල් 9 ක් නම් අඟල් 28 ක් විතර දිග අතට, ඒ වගේම ගේ පෙනුමට බාධා නොවන විදිහට සුදුසු පැත්තකින් ඒ කණුවට යා කරල, කණුවෙ උසටම බිත්තියක් බැඳල, සුදුසු විදිහට සම්බන්ධ කළාම ඒ දෝසය ඉවත් වෙනවා. අර මීට කලින් කියපු කට්ටල් දාන ක්‍රමයෙදිත් මේ වගේ දෙයක් තමයි සිද්ධ වෙන්නෙ. එතකොට ඒ කට්ටල්වලින් එන සෙත් කිරණවලින්, අර දෝස නිසා එන කිරණ එකකට එකක් කැපීමක් තමයි සිද්ධ කරන්නෙ. දෝසය කැපෙන එක ක්‍රමයක් තමයි ඒ.

ඉස්සර හිටපු වැඩිහිටියො ළමයින්ට උළුවස්සක් මැද තනි කකුලෙන් ඉන්න එපා කියල කිව්වෙත් මේ වගේ හේතු නිසා. මොකද උළුවස්සක් අසලත් මේ විස කිරණ විහිදීමේ බලපෑම තියෙනවා. වට්ටෙ එක දිගට යන රාමුවක් එක පාරටම කැඩිච්ච තැනක් තමයි උළුවස්සක් කියන්නෙ. එහෙම කැඩුනම එතන ශක්ති හානියක් වෙනවා, විස කිරණ පිට වෙනවා. මේ විදිහෙ දොර මුල්ලක වට්ටෙ කිරිලියානු ඡායාරූප අරගෙන, කිරණ හානි වෙන හැටි පෙන්වපු අවස්ථා අන්තර්ජාලයෙන් දැක බලා ගන්න පුළුවන්. ඒත් එක්කම දොරවල්, උළුවහු නැති තැනක ගත්ත ඡායාරූපත් එක්ක ඒවා සන්සන්දනය කරල බැලුවම, පැහැදිලිවම අවස්ථා 2 ක් පෙන්නුම් කරනවා. දොර ජනෙල්, උළුවහු ආදිය තියෙන තැන්වල කිරණ රතු පාටයි, මොකද දෝස තියෙන නිසා. සාමාන්‍යයෙන් දෝස නැති අනෙක් තැන්වල කිරණ ලා කහ පාටයි. ඒ කියන්නෙ එක තැනක ශක්ති හානියක් වෙලා.




එතකොට ඒ වගේ තැනක තනි කකුලෙන් හිට ගෙන ඉන්න කොට ශරීරයට ඒ විස කිරණ වැදිල ශරීරයේ සමතුලිත බව බිඳ වැටෙන්න හේතු වෙනවා. එහෙම තනි කකුලෙන් ඉන්න කොට ඒ කිරණ කැරකිලා හිස් මුදුනට එනවා. එතකොට ශරීරයේ එක අංශයක කිරණ මාධ්‍යය වැඩි වෙනවා. මොකද මේ මනුස්ස ශරීරයක් ගත්තම හරියට මෑ ඇටයක පියළි 2 ක් වගේ දෙපැත්තක් තියෙනවා. නාහෙ බැලුවොත් හරි මැදින් කෙළින් රේඛාවක් තියෙනවා. ඒක තොල්, නිකට ආදී වශයෙන් පහළට යන කල්ම හරියටම මැදින් ගිහින් දෙපැත්තට බෙදෙනවා. ඒ දෙපැත්ත එකට බැඳිල තියෙන්නෙ. තනි පැත්තකින් සත්වයෙක් හැදෙන්නෙ නෑ. ජනකාණුවකින් පියළි 2 ක් විදිහට පටන් ගෙන වැඩෙන කොට තමයි තනි ජීවියෙක් බවට පත් වෙන්නෙ. ඒ හැදෙන ජීවියාගෙ හදවත පැත්ත ප්‍රධානයි, අනෙක් පැත්ත අප්‍රධානයි. හදවත තියෙන පැත්තත් එක්ක බැඳිල අනිත් පැත්තත් වැඩ කරනවා. මොළයේ සියුම් ලේ නහර, ස්නායු ආදිය ගත්තත් එක පැත්තක ඒවා අනිත් පැත්තත් එක්ක එකින් එක බැඳිල එතිල තමයි වැඩ කරන්නෙ. දෙපැත්තම එකට සම්බන්ධයි. ඒ නිසා තමයි එක කනක ආබාධයක් ආවත් ශරීරයේ සමතුලිත බව නැති වෙන්නෙ. එතකොට තනි කකුලෙන් හිට ගෙන ඉන්න කොටත්, අර විස කිරණ නිසා ශරීරයේ සමබරතාවයට බාධා එනවා. ඉතින් මේ වගේ තැන්වලින් එන දෝසත් අර කට්ටල් දානව කියන පැරණි ක්‍රමයට ඉවත් කර ගන්න පුළුවන්.

එතකොට මේ සියලු කරුණු කාරණා සලකල බලන කොට, දොර ජනෙල් ආදිය ඕනවට වඩා හිර කර ගන්නෙ නැතිව ගෙයක් තිබුනොත් තමයි වඩා හොඳින් ඵල දෙන්නෙ. ආදි බ්‍රහ්ම කල්පික මනුස්සයොත් එක්ක බැලුවොත්, ඇත්තටම මේ ගෙයක් කියන්නෙ හොඳකට හදාගත්තු එකක් නෙවෙයි. ආභස්සර බඹ ලොවින් ආපු මනුස්සයින්ට එදා ගෙවල් දොරවල් තිබුනෙ නෑ. මොකද ස්වයං ප්‍රභා ආලෝකයෙන් ජීවත් වෙච්ච සියුම් ශරීර තිබුණෙ. අවු වැසි, ස්වභාවික විපත්, සොර සතුරු කරදර තිබුණෙ නෑ. පස්සෙ තමයි එදා තිබිච්ච ශක්තීන් පිරිහිලා ගිහින් වෙනම වැට කඩොලු ගහගෙන ගෙවල් දොරවල් හදාගෙන පංචකාම සම්පත්තිය භුක්ති විඳින්න ගත්තෙ. දැන් ඉතින් අවු වැසිවලින්, මැසි මදුරුවන්ගෙන්, සොර සතුරන්ගෙන් ආරක්ෂා වෙන්න ගෙයක් නැතිව බෑ. ඒ විදිහට ග්‍රහණය කර ගෙන භුක්ති විඳින්න හදා ගත්තු එක තමයි ගෘහය කියන්නෙ. දැන් ඉතින් කරන්න දෙයක් නැති කමට තමයි ගෙයක් හදා ගන්නෙ.

නමුත් එහෙම හදාගත්තු ගෙයක වුනත්, අර විදිහට දොර ජනෙල්, බිත්ති, උළුවහු අඩු වෙන තරමට ස්වභාවිකත්වයට නැඹුරු වෙන නිසා අර වගේ දෝස එනව අඩුයි. හැබැයි මනුසස්යෙක්ගෙ ඕරා වළල්ල ප්‍රබල නම් මේවායින් එන දෝසවල බලපෑමත් අඩුයි. නමුත් කර්ම විපාකයක් ඇවිත් හෝ තමන් ළඟ තියෙන ගුණ ධර්ම හීන වීමක් නිසා හෝ ඕරා වළල්ල දුර්වල වුනොත්, අර දෝසවලින් එන බලපෑම වැඩි වෙනවා. එතකොට හිටි ගමන් පුද්ගලය යන එන මං නැතිව පැත්ත වැටෙන්න පුළුවන්. සමහර විට හෘදයාබාධයක් වගේ දෙයක් හිටි ගමන් එන්න පුළුවන්. ඉතින් මේ සාම්ප්‍රදායික හැම දේකටම ඇත්තක් තිබුනත්, අද ඇත්ත මොකක්ද කියල හේතු ඵල වශයෙන් හොයා ගන්න බැරි එකයි ගැටළුව වෙලා තියෙන්නෙ.

සටහන
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ 45 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**ශ්‍රම දායකත්වය** -

♦ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ♦ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ♦ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ♦ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ♦ සමන් සිල්වා මහතා - කළුතර ♦ එස්.එම්. ජයසේකර මහතා - මාලබේ ♦ ඩබ්.ඒ. තිලිණවතී මහත්මිය - කඩවත ♦ කැළුම් ලංකේශ්වර මහතා - නෙළුව ♦ පර්ෆෙක්ට් කම්පියුටර් ආයතනයේ කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ♦ නන් අයුරින් දායක වූ පින්වතුන්

**මූල්‍යමය දායකත්වය** -

♦ ආසිරි වනිගරත්න මහතා සහ දීපිකා සන්දනායක මහත්මිය ඇතුළු පවුලේ සැම - මහරගම - රු.15,000/- ♦ චාමික සිරිමාන්න මහතා සහ සවණී නිසංසලා කුලසේකර මහත්මිය - පන්නිපිටිය - රු.10,000/- ♦ ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම - කුරුණෑගල - රු. 10,000/- ♦ සමන් සිල්වා මහතා - කළුතර - රු. 10,000/- ♦ තුසිත නාකන්දල මහතා, සරූපා නාකන්දල මහත්මිය, දෙවින්යා දුව - ගල්කිස්ස - රු. 10,000/- ♦ ශීලා පොඩිමැණිකේ මහත්මිය - ආයුර්වේද රෝහල මීරිගම - රු.10,000/- ♦ එච්.ඩී. සරිත් මහතා - ගාල්ල - රු.10,000/- ♦ ඉන්දික තොටවත්ත මහතා - අම්බලන්ගොඩ - රු.5,000/- ♦ අමිත් හඳුගොඩ මහතා ඇතුළු පවුලේ සැම - අත්තිඩිය - රු. 5,000/- ♦ අමිල සල්ගාදු මහතා - බෝමිරිය - රු. 5,000/- ♦ ගයාන් පුෂ්පික ඉන්ද්‍රජිත් ලොකුමාන්න මහතා, හිරෝෂානි ලොකුමාන්න මහත්මිය, සෙනුත් ලොකුමාන්න පුතා - ගල්කිස්ස - රු. 5,000/- ♦ සොනාලි සමරදිවාකර මෙනවිය - මහරගම - රු. 5,000/- ♦ වසන්ත කොළඹආරච්චි මහතා ඇතුලු පවුලේ සැම - කොට්ටාව - රු.5,000/- ♦ කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනට සහභාගි වන පින්වතුන් - රු. 3,000/- ♦ ජනක හපුආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - ගිනිගත්හේන - රු. 3,000/- ♦ කේ.එම්. සමන්ත ප්‍රදීප් මහතා - කඹුරුගමුව, මාතර - රු.3,000/- ♦ ටී.ටී.පී. සිල්වා මහත්මිය - නාගොඩ කළුතර - රු.2,500/- ♦ ඔස්ටින් ප්‍රනාන්දු මහතා ඇතුළු පවුලේ සැම - පොල්ගහවෙල - රු. 2,000/- ♦ ජයනාත් සුභසිංහ මහතා - හෝමාගම - රු. 2,000/- ♦ සංජය රණවීර මහතා - මහරගම - රු.2,000/- ♦ විපුල සංජීව මහතා ඇතුලු පවුලේ සැම - හෝමාගම - රු.2,000/- ♦ හරිතා ජයසූරිය මහත්මිය සහ මනෝජ් මල්ලවආරච්චි මහතා - මීරිගම - රු.2,000/- ♦ උපුල් පරාක්‍රම සිල්වා මහතා - මාරවිල - රු.2,000/- ♦ ගංගා කෝදාගොඩ මහත්මිය - බොරැල්ල - රු. 2000/- ♦ එස්.ජී.ඒ. සිසිලිනා හාමිනේ උපාසිකා මාතාව සහ එස්.ජී.ඒ. හින්නිහාමිනේ උපාසිකා මාතාව - බුළුගහපිටිය - රු.2,000/-♦ දයානි බමුණුසිංහ මහත්මිය - නැදිමාල - රු.1,600/- ♦ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ♦ ඩී.ඩී. විතාරණගේ මහතා ඇතුළු පවුලේ සැම - නුගේගොඩ - රු.1,500/-♦ මාලනී බස්නායක මහත්මිය - අකුරැස්ස - රු.1,500/- ♦ ඩබ්.ඒ. මහින්ද ජයතිලක මහතා - වෙල්පල්ල - රු.1,500/- ♦ පී.රුවිනා දීපානි මහත්මිය ඇතුළු පවුලේ සැම - පිටකෝට්ටේ - රු.1,500/- ♦ චන්ද්‍රරත්න මහතා ඇතුළු පවුලේ සැම - පාදුක්ක - රු.1,500/- ♦ එල්.එම්. විජේසිංහ සහ සෙනෙහෙලතා ජයවික්‍රම යන මහත්මීන් - ගම්පහ - රු.1,200/- ♦ රේණුකා ගුණරත්න මහත්මිය ඇතුළු පවුලේ සැම - ගොතටුව - රු. 1,000/- ♦ ඉන්ද්‍රානි විසාකා ජයසිංහ මහත්මිය - බොරලැස්ගමුව - රු. 1,000/- ♦ ශ්‍යාමල් බණ්ඩාර මහතා - කුරුණෑගල - රු. 1,000/- ♦ එරංග ලියනගේ මහතා සහ බිසන්තිකා ගුණසේකර මහත්මිය - කළුබෝවිල - රු. 1,000/- ♦ නිහාල් ලියනගේ මහතා සහ චිත්‍රා ශ්‍රේරු මහත්මිය - කළුබෝවිල - රු. 1,000/- ♦ ගාමිණී ලියනගේ මහතා සහ නයෝමි ලියනගේ මෙනවිය - නැදිමාල - රු.1,000/- ♦ එස්. ප්‍රසන්න ප්‍රියදර්ශන සිල්වා මහතා - ගල්කිස්ස - රු. 1,000/- ♦ නුවන් යාපා අමරසේකර මහතා - රදාවාන - රු. 1,000/- ♦ සී.එම්.පී.සී. ලක්රුවන් මහතා - කළුතර - රු. 1,000/- ♦ අසංග සෙනරත් අඹගල මහතා - රදාවාන - රු.1,000/- ♦ රත්න පෙරේරා මහතා ඇතුළු පවුලේ සැම - කැස්බෑව - රු. 1,000/- ♦ චන්ද්‍රානි පෙරේරා මහත්මිය සහ ඉසුරු උදාන වික්‍රමසූරිය මහතා - පානදුර - රු.1,000/- ♦ කසුන් තාරක වික්‍රමසූරිය මහතා සහ සිතුමිණි ප්‍රබෝධා මහත්මිය - පානදුර- රු.1,000 ♦ ෂෙහානි බස්නායක මහත්මිය - මත්තෙගොඩ - රු.1,000/- ♦ සිරිමල් වේරගම මහතා - මීගොඩ - රු.1,000/- ♦ අජිත් ඉන්ද්‍රකුමාර මහතා - පානදුර - රු.1,000/- ♦ ලයනල් ප්‍රනාන්දු මහතා - දාම්පෙ - රු.1,000/- ♦ දේශිකා වික්‍රමසිංහ මෙනවිය ඇතුළු පවුලේ සැම - කොළඹ 02 - රු.1,000/- ♦ මෙවන් සුජානි මෙනවිය - මීගොඩ - රු.1,000/- ♦ කුමාරි විජේකෝන් මහත්මිය - මිනුවන්ගොඩ - රු.1,000/- ♦ පේමවතී අතුකෝරාළ මහත්මිය - දාම්පෙ - රු.1,000/- ♦ අයන්ති ප්‍රේමතිලක මහත්මිය සහ පැතුම් ලොකුවිතාන මහතා - කඩවත - රු.1,000/- ♦ එම්. එස්. ගලප්පත්ති මහත්මිය - මාලබේ - රු.1,000/-♦ තිස්ස බී අතාවුද මහතා - ජා ඇල - රු.1,000/- ♦ එම්.ඩී. තිලකරත්න මහතා - වැලිපැන්න - රු.1,000/- ♦ ඩිලානි ඩයස් මහත්මිය - නාවින්න - රු.1,000/- ♦ නීතා රණසිංහ මහත්මිය - දාම්පෙ - රු.1,000/- ♦ අයි.පී. අබේරත්න මහතා - ලෙනගල - රු.1,000/- ♦ කාංචනා අබේසිංහ මහත්මිය - කඩවත - රු.1,000/- ♦ සෙනුකි සෙයස්සා රත්නායක දියණිය - කැළණිය - රු.1,000/- ♦ දයා ගමඇතිගේ මහත්මිය ඇතුළු පවුලේ සැම - පිටකෝට්ටේ - රු.1,000/- ♦ උපුලි තිරිමාන්න මහත්මිය - බොරලැස්ගමුව - රු.1,000/- ♦ ටී.ඩී. විමලා නන්දසීලි මහත්මිය - වටරැක - රු.1,000/- ♦ එස්.පද්මලතා මහත්මිය - යටවක - රු.1,000/- ♦ ප්‍රේමා ගීකියනගේ මහත්මිය සහ නිශාන්ත තිලකරත්න පුතා - හොරණ - රු.1,000/- ♦ චන්ද්‍රසේන සේනානායක මහතා ඇතුළු පවුලේ සැම - හොරණ - රු.1,000/- ♦ ජනක පෙරේරා මහතා සහ නදීශා හර්ෂනී මහත්මිය - රු.1,000/- ♦ අමිත් සමරනායක මහතා බෙල්ලන්තර - රු.1,000/- ♦ ජනිඳු බිම්සර පුතා - හගවත්ත රාජකීය ක.වි. බාඳුරාගොඩ - රු.1,000/- රංජිත් වික්‍රමසිංහ මහතා, පද්මාවතී වික්‍රමසිංහ මහත්මිය, ඩබ්.ආර්. ගුණතිලක මහතා සහ මහත්මිය - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, මනෝජ් ජයසූරිය මහතා, උදාන ආරියවංශ මහතා - මහරගම, ඉසුරු සම්පත් මහතා -

කළුතර, චන්දිම ගුණදාස මහතා - මොරටුව, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, කුමාරි ගොඩවිට මහත්මිය - කුරුණෑගල, යමුනා උඩුමලගල මහත්මිය - පිළියන්දල, රසික තුශාන්ත මහතා - හෝමාගම, චතුර මල්වාන මහතා - කෑගල්ල, බන්ධුල වීරසිංහ මහතා - ගංගොඩ, එච්.එම්. කුසුමාවතී මහත්මිය - හලාගිරිය, ශ්‍රී රංජිත්සිංහ මහතා කැලණිය, තෙනුගි විජේනායක සහ රෙසදි විජේනායක දියණියන් - මහර, සිසිර කුමාර සමරදිවාකර මහතා - එල්ලක්කල, නෙතුමිණි තුහංසා ද සිල්වා මෙනවිය - ඇතුල් කෝට්ටේ, සඳමාලි මහත්මිය සහ සම්පත් මහතා - පනාගොඩ, එල්.බී. විජේසේන මහතා - කොට්ටාව, හිරන්ති උයන්වත්ත මහත්මිය - පිළියන්දල, සිල්වියා ද සිල්වා මහත්මිය - ගම්පොළ, යූ. සමන් කුමාර මහතා - ඕපනායක - රු. 9,500/- ♦ එකතු වූ සියලු මුදල් පරිත්‍යාග- රු. 191,800/- ♦ පළමු පිටපත් 10000 සඳහා මුද්‍රණ වියදම රු. 232,500/- ♦අනෙකුත් වියදම් - 14,450/- ♦ සම්පූර්ණ වියදම - රු. 246,950/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී. සඟරා අලෙවියෙන් ලැබෙන ඉතිරි සියලු මුදල් නැවත මුද්‍රණ කටයුතු ඇතුළු දහම් කටයුතු සඳහා යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා! එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

## සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,

**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ, අග්ගඤ්ඤ සූත්‍රය, නිරුත්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව, දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net
www.aaryadharma.org විද්‍යුත් ලිපිනය: webmaster@helabodhupiyuma.net දු.අ:- 071 3046895

**දම් සභා ගුවන් හඬ** - www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ පුර සහ අමාවක පොහොය දිනයන්හි උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**

සෑම පුන් පොහෝ දිනකම සහ සෑම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

## හෙළ බොදු පියුම දහම් සඟරාවේ පසුගිය කලාපයන් ඇතුලු සියලු කලාපයන් දැනට ලබාගත හැකි ස්ථාන:

1. ඞී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - 33, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ
2. නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ.
3. නිව් පියුමි කොමිනිකේෂන් - පීරිස් මාවත, කළුබෝවිල - 0773742023
4. තුෂාරා ෆැෂන් - හයිලෙවල් පාර, හෝමාගම.
5. පිනැකල් නෙට් - ශානි ඉන්ස්ටිටියුට් - හයිලෙවල් පාර, ගොඩගම
6. තුෂාරි සාරි සෙන්ටර් - කොළඹ පාර, පාදුක්ක.
7. සුජය ෆාමසි - කටුබැද්ද හංදිය, මොරටුව.
8. ගේට්වේ අධ්‍යාපන ආයතනය - කලේගාන, ගාල්ල.
9. පෝලර් රීජන්ස් 402 සී, ගාලු පාර, පානදුර 038-2235369
10. සමනල පොත්හල - නෙළුව.
11. සරසවි පොත්හල - 330/ඒ, ගාලුපාර, අළුත්ගම - 0773474081
12. මෝලෙ කඩේ - මුදුන, වලස්මුල්ල.
13. නිව් මෙට්‍රෝ කම්පියුටර්ස් - කාලිදාස මාවත, මාතර
14. ලසන් ට්‍රේඩ්සෙන්ටර් - 8, අලුත්ගොඩ පාර, තිස්සමහාරාමය - 0718523556
15. නුගේගොඩ නාලන්දාරාම විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (ඉරිදා උදේ 9.00 සිට සවස 2.00 දක්වා පමණි.) (0773742023)
16. දෙහිවල කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (සෙනසුරාදා උදේ 8.30 සිට සවස 2.00 දක්වා පමණි) (දෙහිවල පොලිස් ස්ථානය අසල) - 0713228571

**තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා විමසන්න - ඞී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - අංක 33, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ - 0777794676**

***ඉහත ආයතන හිමි පින්වතුන් මෙම සද් කාර්ය ඉටු කරනු ලබන්නේ කිසිදු වෙළඳ ලාභයකින් තොරව සාසනික කටයුත්තක් වශයෙන් පමණි.***

# දකිනව නම් සතර පෙර නිමිති...




මහළු වෙලා ලෙඩ වී මැරෙනව   කියන
වහලු වෙලා යන ලෝ දහමකි   තියෙන
මහණ වෙලා මේ තැන් වෙත යළි   නොයන
දහම තියේ නුවණැතියන් හට   සොයන




මෙනිමිති හතර කවුරුත් ඇස් දෙකින්   දකී
නොනිවෙන එයින් යයි නොදුටුව ලෙසින්   මැකී
එනිසයි නැණින් සිහි කළ යුතු බුදුන්   වැකී
පිණිසම හේතු වේ එය මතු නිවන්   සකී



පස් කම්වලින් ගෙන දෙන සුව සැපය   පතා
අස්වාදයෙන් අරගෙන එය හොඳය   සිතා
රැස්සන ලෙසට නැති වෙන විට ලොවෙහි   යතා
දොස් දකිනට පැවිදි රුව නම් හොඳය   ඉතා



අපොයි මළ කුණක් කියමින් නහය   ඇස
වසයි තමන්ටත් දවසක නොඑන   ලෙස
වෙසෙයි ගියත් මහළුව මතු සැපට   බැස
අසයි මෙදම් නොදකින සත රසද   වස




වැසුනෙන් ආස්වාදයකට ලොවෙහි   සත
ඔසු දම් තිබෙන මුත් නොගනිති නොදැම්   සිත
සෙසු උන් ගියත් මෙනිමිති දැක නිවෙන   අත
නුසුදුසු ලෙසට නොදකියි නිති පෙළෙන   ගත

බෝසත් තුමන් දැකි විලසට දකිනු   රිසී
ලෝ සත් දනන් වේ නම් ඒ දහම   ඇසී
වෑපත් කයින් යන කල් තව නොසිට   බසී
දෝවත් නිවන් දෙන අම දම ලෙසට   නිසී

පෙර මග නිමිති නිවනට මනු ලොවෙහි   ඇතී
දුර දිග සිතා නුවණින් ගත යුතුය   නිතී
පරදින ලොවක වෙන එකකින් ජයද   නැතී
අරගෙන මහණකම පිරුවොත් සුවය   වෙතී



ඇසින් නොව නැණින් දැක මෙනිමිති   හතර
තොසින් පෙර මගක් ලෙස සිහි කර   නිතර
දොසින් පිරුණු දුක විඳවන භව   කතර
විසින් තමන් සසඳා වෙනු ලොව   එතෙර

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන



# බෙදුනු මනු සත ලොවේ...



මහා දීපද ලෙසේ - බෙදී ලෝකය හතට - දඹදිව කියන මිනිස් තලයේ
එහා සයුරෙන් ඈසේ - ළතෝනියෙ හඬ දසත - බෙදුනු ධන බලවතුන් කුලයේ
නහා උනුනුන් විසේ - සතා සිවුපා විලස - නොමැත කිසි නැණ බිඳක් මොළයේ
ලිහා ගනු බැරි දොසේ - නසී මනු සත තැනක - කුමක දෝ ලබන ඉන් එලයේ

උතුරෙ අපි දකුණෙ අපි - උඩරටද සබරගමු - රජරටද වයඹ ලෙස බෙදුණේ
සතුව නෙක ඇත අපට - හොඳම පාසල සමිති - පෙදෙස ලෙස එදා සිට බැඳුණේ
පතුර වන අපගෙ බල - ලෙසට බල නොමැත තව - අපි නිසයි සියල්ලම සැදුනේ
පැතුම උනුනුන් පරද - ලොකුකමට හඬ නගන - මෙබඳු සිතිවිලි සතට ඇඳුනේ



අපේ පිල මේ පැහැය - මළත් එලෙසයි සදා - අහවලාමයි අපට ඕනේ
හැපේ කතිරය පිණිස - පණත් දෙන්නම් කියා - ලැබුව කිසි හරයකද නෑනේ
යැපේ තුන් දොස මතම - මතුත් කම් සැප පතා - දහම නිය නොදැන පුහු මානේ
කපේ තියෙනා තුරුම - හදත් තණ්හා දුකා - රීසි ලෙසට නොමැත සැප හීනේ



මරා ගන්නට හදන - ජාති ආගම් කුලය - පිණිසමය ධන බලය යෙදුවේ
දරා ගනු බැරි ලෙසට - වාද භේදද නිතර - වටලමින අකුසලය සැදුවේ
බුරා එයි ගිනි කඳුද - වේද කෙළවර කවද - සතර අගතියෙ උපත වැදුවේ
දිරා යන කුණු කයට - කාම සැප තිර වෙයිද - එලොව ගිය විට දහම පොදුවේ



මැරේ මේ කිව් සැමා - බෙදා ගෙන ගත් කොටස - අතැර යන විට ගිනිය එන්නේ
තිරේ පිටු පස වෙනා - භවේ පරලොව දහම - මෙසත හට දැන් නොවැට හෙන්නේ
හිරේ ගිය විලසිනා - තැවේ තව බොහො කලක - භවය පෙර ලෙස ගොඩ නැගෙන්නේ
පොරේ යලි ලොව බදා - ගෙවී ගිය ගොඩ නැවත - හදන මුත් පෙර ලෙස ගෙවෙන්නේ



හිතේ ගති අනුව එන - බෙදීමක හේතු එල - මුනි දෙසුමකින් පැවත එනවා
එතේ එය හය පොළක - දොසේ තුන් සහ නිදොස - සත ඒ හයෙන් උපත වෙනවා
මතේ ලොකු කර ගෙනම - වසා එදහම ලොවට - නොවටිනා බෙදුම් පතුරනවා
නැතේ රැක ගත් කෙනෙකු - ගතේ පණ ගිය දිනක - මෙලොව පරලොව එනව යනවා



පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

නීතිඥ චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල වනාත පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී